

# යුක්තිය අද නොවේ හෙට

## ශ්‍රී ලංකාවේ උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ අසමත්භාවය

AMNESTY INTERNATIONAL

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් ලොව පුරා මිලියන 3කට අධික ක්‍රියාකාරීන්, අනුග්‍රහකයින් ඇතුළු සාමාජිකත්වයක් සහිතව රටවල් හා භූගෝලීය කලාප 150 පුරා ව්‍යාප්ත ව ඇති බරපතළ මානව අයිතිවාසිකම් උල්ලංඝනයන් අවසන් කිරීම පිණිස වන ව්‍යාපාරයකි.

අප ගේ දර්ශනය වන්නේ විශ්ව මානව හිමිකම් ප්‍රකාශනය ඇතුළු ජාත්‍යයන්තර මානව හිමිකම් ප්‍රකාශනයන් හි අඩංගු මානව හිමිකම් ප්‍රමිතීන් ලොව පුරා වාසය කරන සෑම පුද්ගලයෙකු විසින් ම භුක්ති විඳිනු දකින්නට ලැබීමයි.

අප සියළු රාජ්‍යයන්, දේශපාලන මතවාදයන් ගෙන් හා ආර්ථික, ආගමික උවමනාවන් ගෙන් ස්වාධින වු සංවිධානයකි. අප, සාමාජිකත්වය හා අනුග්‍රහකයින් විසින් සපයන අරමුදල් මත ක්‍රියා කරන සංවිධානයකි.

AMNESTY
INTERNATIONAL

ප්‍රථම මුද්‍රණය 2011
Amnesty International Ltd
Peter Benenson House
1 Easton Street
London WC1X 0DW
United Kingdom

© ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය

Index: ASA 37/008/2011 Sinhalese
මුල් පිටපත: ඉංග්‍රිසි බසිනි
මුද්‍රණය ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් විසිනි
ජාත්‍යයන්තර ලේකම් කාර්යංශය එක්සත්
රාජධානිය

සියළු හිමිකම් ඇහිරිණ. මෙහි අයිතිය ප්‍රකාශකයන් සතුය. එහෙත් මෙම ප්‍රකාශනයේ අඩංගු කරුණු නොමිලේ සිදු කරන මානව හිමිකම් උද්ඝෝෂණ ව්‍යාපාර,ප්‍රචාරණය හා අධ්‍යාපනික අරමුණු පිණිස අවසරයකින් තොරව උපුටා දැක්විය හැකි අතර එබඳු අවස්ථාවන් අප වෙත දැනුම් දිම මෙම ප්‍රකාශනයේ බලපෑම පිළිබඳව තක්සේරු කිරිමට උපකාර වනු ඇත. ඒ හැර මෙම ප්‍රකාශනය වෙනත් කාර්‍යයන් සඳහා පිටපත් කිරිම, උපුටා දැක්විම, පරිවර්තනය හෝ අනුවර්තනය පිණිස ප්‍රකාශක ගෙන් ලිඛිත අවසරයක් ලබා ගෙන ගෙවිමක් ද කළ යුතු බව සලකන්න. හිමිකම් අවසරය ලබා ගැනිම පිණිස කරුණාකර copyright@amnesty.org ඊමේල් කරන්න

*කවරයේ ඡායාරූපය:* උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව වෙත සිය ලිඛිත සාක්ෂි හා පැමිණිලි භාර දීම පිණිස යාපනය සැසිවාරයේ දි කාන්තාවන් පෙළ ගැසි සිටි ආකාරය. 2010 නොැම්බර් 14

© සෙන්ටර් ෆෝ හියුමන් රයිට්ස් (ක්ස්) ශ්‍රී ලංකාව
http://sn.im/27x7d6

amnesty.org

# යුක්තියඃ
# අද නොවේ
# හෙට

ශ්‍රී ලංකාවේ උගත් පාඩම්

හා

සංහිදියා කොමිසමේ

අසමත්භාවය

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල්

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය 2011 සැප්තැම්බර්

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් ප්‍රකාශන

ජාත්‍යන්තර ලේකම් කාර්යාංශය,

පිටර් බෙන්සන් මන්දිරය,

1 අස්ටන් විදීය,

ලන්ඩන් WC1X0DW

එක්සත් රාජධානිය.

[WWW.amnesty.org](http://www.amnesty.org)

© ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් ප්‍රකාශන 2011

Index:ASA37/008/2011

ප්‍රථම මුද්‍රණය: ඉංග්‍රීසි බසිනි

පටුන


| | | |
|---|---|---|
| 01 | හැඳින්වීම | 04 |
| 02 | උගත් පාඩම් හා සංහිඳියා කොමිසමේ සැසිවාර | 23 |
| | සාක්ෂිකරුවන් විසින් අනාවරණය කළ බරපතළ මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ නිසි ක්‍රියා මාර්ග ගැනිමට අසමත් වීම | 23 |
| | සාක්ෂිකරුවන් විසින් වාර්තා කරන ලද මානව හිමිකම් උල්ලංඝණයන් සමහරක්: | 24 |
| | මනුෂ්‍ය ඝාතන | 27 |
| | ශ්‍රී ලංකා යුද්ධ හමුදාව හා එල් ටි ටි ඊ සංවිධානය විසින් බෝම්බ හෙළිම: | 30 |
| | බලහත්කාර පැහැර ගෙන යාම් හා අතුරුදහන් කිරිම් | 40 |
| | බාර වූ එල් ටි ටි ඊ නායකයින් බලහත්කාර අතුරුදහන් කිරිම පිළිබඳ චෝදනාව | 41 |
| | අත්තනෝමතිකව රඳවා තබා ගැනිම්: | 43 |
| **03** | උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ රාජ්‍ය පාක්ෂිකභාවය පිළිබඳ සාධක | 44 |
| | සාක්ෂිකරුවන් ගෙන් ප්‍රශ්න කිරිමේ දි කොමිෂන් සභාව සිය මතය උත්තරාරෝපණය කිරිම | 54 |
| | රාජ්‍ය විවේචනයට ලක් කළ සාක්ෂිකරුවන් හා විශේෂඥයින් දැඩි අධියෝගයකට ලක් කිරිම: | 55 |
| | වින්දිතයින් ගේ කාලත්‍රයන්ට හා පවුල් සාමාජිකයින්ට නිසි සැලකිලි දැක්වීමට අසමත්වීම | 60 |
| | සාක්ෂිකරුවන් ට එල්ල කරන ලද තර්ජන වැළැක්වීමට අපොහොසත් වීම: | 63 |
| **04** | උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව: රජයේ ප්‍රතිචාරය | 64 |
| | අත් අඩංගුවට ගැනිම | 65 |
| | ඉඩම් | 67 |
| | භාෂාව | 67 |
| | නිතීය හා සාමය | 67 |
| | සමාජ හා ආර්ථික ප්‍රශ්න | 68 |
| 05 | ස්වාධීන ජාත්‍යයන්තර විමර්ශනයක අවශ්‍යතාවය | 69 |

## 1 හැදින්වීම......

***' ඔවුහු වෙඩි නොතබන විට හෝ බෝම්බ නොහෙළන විට අපි එළිමහනේ උයා පියා ගත්තෙමු. නමුත් බෝම්බ වැසි වසින විට අපි බංකර් තුළ උයා පියා ගනිමින් ජීවත් වුනෙමු. අපේ ළමුන් කොපමණ බියට පත් විද යත් ඔවුහු සති ගණනක් කථා නොකළෝය. ඔවුහු බෝම්බ ප්‍රහාර නිසා නෑදයන් මියැදෙන ආකාරය ඇසින් දුටු සාක්ෂිකරුවෝ වූහ. අප වටා ඇතිරී තිබූ මළකඳන් පිළිබඳ මතකය ඇත්ත වශයෙන් ම කිසි කළෙක ඇත් නොවනු ඇත'***

යුද්ධයේ අවසාන සති කිහිපය තුළ වන්නියේ සිර වී සිට දිවි ගලවා ගත් තැනැත්තෙක්:

ශ්‍රී ලංකාවේ දශක ගණනාවක් දිග් ගැස්සුන අභ්‍යන්තර ගැටුමේ අවසාන මාස කිහිපය තුළ ශ්‍රී ලංකා රජයත් කෲර එල් ටි ටි ඊ යත් අතර අනෙකා පරාජය කිරිමට කළ යුද්ධයේ දි දහස් ගණනක් සිවිල් වැසියන් මිය ගියෝය. මෙම යුද්ධයට බාහිර ඇසින් දුටු සාක්ෂිකරුවන් ඇති විම වැළැක්විම පිණිස ජනමාධ්‍යවේදීන් හා ස්වාධීන නිරික්ෂකයින් සටන් බිමෙන් ඈත් කොට තැබිමට ශ්‍රී ලංකා රජය මහත් පරිශ්‍රමයක් ගත්තේය. එහෙත් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් එක් රැස් කරන ලද ඇසින් දුටු සාක්ෂිකරුවන් ගේ ප්‍රකාශ හා සහන සේවකයන් සැපයු තොරතුරු අනුවත් අවම වශයෙන් යුද්ධයේ අවසාන අදිරයේ දි 10,000 ආසන්න සංඛ්‍යාවක් මිය යන්නට ඇත. තවද එල් ටි ටි ඊ ය විසින් සිවිල් වැසියන් මිනිස් පලිහක් ලෙස යොදා ගත් අතර, ළමුන් සොල්දාදුවන් වශයෙන් බලහත්කාරයෙන් බඳවා ගත්තේය. ශ්‍රී ලංකා හමුදාව සිවිල් වැසියන් එක් රොක් වි සිටින ස්ථාන බව දැන දැනම එකි ස්ථානයන් ට බෝම්බ හෙලුවෝය. මෙහි අවසාන ප්‍රතිඵලය වුයේ යුද්ධයට කොටු වු සිවිල් වැසියන් දහස් ගණනක් නොවැළැක්විය හැකි ලෙසම ආහාර, ජලය හා නිසි වෛද්‍ය ප්‍රතිකාර වලින් තොරව දැඩි පිඩනයකට ලක් විමයි.

මෙම ක්‍රියාවන් අන්තර් ජාතික මානවීය නිතීය උල්ලංඝණය කිරිමකි. ශ්‍රී ලංකා රජය වගවිමකින් තොරව නිදැල්ලේ සිටිම අන්තර් ජාතික වශයෙන් යම් රටක් වරදින් නිදොස් විම පිළිබඳ වැරදි පුර්වාදර්ශයක් සපයයි. අඛණ්ඩව සිදුවන වරදින් නිදොස්විම එක් අතකින් තිරසාර සාමයක් සඳහා ප්‍රබල බාධකයක් වනවා පමණක් නොව නොකඩවා සිදුවන මානව හිමිකම් උල්ලංඝණයන්ට පිටුවහලක් ද වෙයි.[1] ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය වෙත බලහත්කාර අතුරුදහන් කිරිම හා පොලිස් වධදිම් පිළිබඳ ව නොකඩවාම වාර්තා ලැබෙන අතර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2009 වසරේ දි ලැබුන පැමිණිලි 5,545 අතරින් අඩක් ම ලැබි තිබුනේ පොලිස් වධ දිම් පිළිබඳ වය.

[1] 2011 සිට 2009 අතරතුර දි මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි 11,000 කට ආසන්න සංඛ්‍යාවක් ලැබි තිබේ *Sunday Leader* (online), 21 July 2011 http://www.thesundayleader.lk/?p=43073

කෙසේ වෙතත්, සවදේශීය හා ජාත්‍යන්තර බලපෑම් මධ්‍යයේ පමණක් නොව ඉන්දියාව වැනි මිත්‍රශීලී රටවල බලපෑම් මධ්‍යයේ පවා ශ්‍රී ලංකා රජය තවමත් විශ්වසනීය වගවීම පිළිබඳ අවංක ප්‍රයත්නයක් දරා නැත. ඒ වෙනුවට පසුගිය දශක දෙක තුළ අනුගමනය කළ ආකාරයටම සිවිල් යුද්ධ සමයේ සිදු වූ අකටයුතුකම් විභාග කිරීමට යැයි අනුමාන කළ හැකි  ජනාධිපති කොමිෂන් සභාවක් ශ්‍රී ලංකා රජය පත් කළේය. නමුත් මෙම කොමිෂන් සභාව පත් කිරීමේ සැබෑ අරමුණ වූයේ ජාත්‍යන්තරව හා දේශීය වශයෙන් එල්ල වි ඇති විවේචන නිහඬ කිරීමයි.

මෙබඳු නොමග යැවීම් පිළිබඳ ව ඉතාමත් මෑත නිදර්ශනය වන්නේ ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් පත් කරන ලද උගත් පාඩම් හා සංහිඳියාව නමින් ජනප්‍රිය වූ  ජනාධිපති කොමිෂන්  සභාවයි. ආරම්භයේ දි ශ්‍රී ලංකා රජයේ උත්සාහය වූයේ දැඩි විවේචන නිහඬ කිරීමයි. නමුත් මේවන විට මෙම කොමිෂන්  සභාවේ සැසිවාරයන් හි දි හෙළිදරව් වූ සාක්ෂි අනුව, මතුවන සැක කටයුතු අපරාධවන් හි බරපතළකම  නිසා ජාත්‍යන්තරව එල්ල වන පීඩනය තවත් උත්සන්න වි ඇත. උගත් පාඩම් හා සංහිඳියා කොමිසමෙහි නොයෙකුත් අඩුපාඩු සැලකිල්ලට ගනිමින්, ජාත්‍යන්තර නීතියට අනුව යමින් තිරසාර සාමයක් ද, සිය පුරවැසියන් ට යුක්තිය හා සිදු වූ අලාභ සම්බන්ධයෙන් හානිපූරණය කිරීම ද, පිණිස ශ්‍රී ලංකා රජයට බලකරන ලෙසට ශ්‍රී ලංකාවේ  සංහිඳියාව සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන රාජ්‍යයන් ගෙන්, ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය ඉල්ලා සිටියි.

ශ්‍රී ලංකාවේ උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන්  වගවීම පිළිබඳව ගෞරවනීය යාන්ත්‍රණයක් නොවේ.[2] එහි අධිකාරිය දෝෂ සහිත වන අතර ප්‍රායෝගිකව ජාතික පරික්ෂණ කොමිෂන් සභා පිළිබඳව ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල වන්නේ ද නැත. 2010 අගෝස්තු මස ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් ට සංදේශයක්[3] එවමින් එම කොමිෂන් සභාව යුක්තිය, සත්‍යානුවේෂණය හා වින්දිතයින්ට හානිපූරණය  ලබා දෙන දේශීය යාන්ත්‍රණයක් ලෙසට කොපමණ අසාර්ථකදැයි පෙන්වා දෙන ලදි.

2010 ඔක්තෝබර් මස ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය, හියුමන් රයිට් වොච් හා ඉන්ටර්නැෂනල් ක්‍රයිසිස් ගෲප් යන සංවිධාන වෙත උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන්  විසින් සිය කොමිෂන්  සභාව හමුවේ සාක්ෂි දෙන මෙන් ආරාධනය කරන ලදි. එකී ආරාධනය ප්‍රතික්ෂේප කළ මෙම සංවිධාන විසින්  මෙම කොමිෂන් සභාවේ අප්‍රමාණවත් අධිකාරියත්, ස්වාධීනත්වය පිළිබඳව ඇති අවතක්සේරුවත්, සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට ප්‍රමාණවත් විධිවිධාන නොමැතිකමත් මූලික

---

2 අදාළ උපමානයන් අතර යාවත්කාලීන කරන ලද 'වරදින් නිදෙස් කිරීම මැඩීම පිණිස මානව හිමිකම් ආරක්ෂාව හා ප්‍රවර්ධනය මගින් ක්‍රියාකිරීම' පිළිබඳ ප්‍රකාශනයඃ United Nations, E/CN.4/2005/102/Add.1, 8 February 2005 http://daccess-dds-ny.un.org/doc/UNDOC/GEN/G05/109/00/PDF/G0510900.pdf?OpenElement

මෙම මූලධර්ම එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කොමිෂන් සභාව මගින් 2005 පැවති 61වන සැසිවාරයේ දි අනුමත කරන ලදි E/CN.4/RES/2005/81 of 21 April 2005 during the Commission's 61st session. The text of the resolution is available at: http://www.unhcr.org/refworld/category,LEGAL,UNCHR,,,45377c930,0.html

3 කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදි. Submission to the Lessons Learnt and Reconciliation Commission, 17 August 2010, (TG ASA 37/2010.001)

ඌනතාවයක් වශයෙන් පෙන්වා දෙන ලද්දේය.[4] තවදුරටත් පූර්ණ ස්වාධීන සාමාජිකයින් ගෙන් සමන්විත කොමිෂන් සභාවක් පත් කොට, සාක්ෂිකරුවන් ආරක්ෂා කරමින්, ජාත්‍යන්තර හා දේශීය නීති රීති වලට අනුකූලව, සැක කටයුතු චෝදනා සම්බන්ධයෙන් පූර්ණ අපක්ෂපාති පරීක්ෂණයක් කිරීමට එකඟවීමෙන් ද, ඊට පසුබිම සකස් කිරීමක් වශයෙන් වරදින් නිදොස්වීම නතර කිරීමටත් පොලිසිය හා අධිකරණයට අපක්ෂපාති ලෙස යුක්තිය පසදිලිමකට රජය ඉඩ දෙන්නේ නම් පමණක් මෙම සංවිධාන ශ්‍රී ලංකා රජයට සම්පූර්ණ සහයෝගය දෙන බව ද ප්‍රකාශ කරන ලදි.

ශ්‍රී ලංකාවේ අසාර්ථක ස්වදේශීය යාන්ත්‍රණයන් ගේ දීර්ඝ ඉතිහාසයේ තව එක් පුරුකක් වන උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව මගින් යුද්ධ අපරාධ, මානව සංහතියට එරෙහි අපරාධ හා යුද්ධය නිසා දෙපාර්ශවය විසින් ම සිදු කරන ලද අපරාධ සම්බන්ධයෙන් වින්දිතයන් වූ දහස් සංඛ්‍යාවකට යුක්තිය, සත්‍යානුවේෂණය හා හානිපූරණය සිදුවේ යැයි තමන් රැවටිල්ලකට හසු නොවිය යුතු බවට ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය ජාත්‍යන්තර ප්‍රජාව ගෙන් ඉල්ලා සිටියි.

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය ස්වාධීන අන්තර් ජාතික මට්ටමේ යාන්ත්‍රණයක් වහාම පිහිට වන ලෙස එක්සත් ජාතීන් ගේ සංවිධානයෙන් ඉල්ලා සිටියි. එබඳු යාන්ත්‍රණයක් පිහිටුවීම හේතු දෙකක් නිසා වැදගත් වෙයි. (1) අන්තර් ජාතික අපරාධ සම්බන්ධයෙන් ගෝලීය මූලධර්මයක් වන වගවීම ආරක්ෂා කිරිම හා අනෙකුත් රටවල් ශ්‍රී ලංකාවේ වැරදි ආදර්ශය අනුගමනය කිරීම වැළැක්වීම (2) බාහිර අපක්ෂපාති යාන්ත්‍රණයක් පිහිටුවීම මඟින් ශ්‍රී ලංකාව තුළ ජාතීන් අතර සංහිඳියාව ඇති කිරීමට දායක වීම.

උගත් පාඩම් හා සංහිදියා කොමිෂන් සභාව සිය සැසි වාරයන් හි දි හෙළිදරව් වූ යුද්ධ අපරාධ, මානව වර්ගයාට එරෙහි අපරාධ ඇතුළුව අන්තර් ජාතික නීතිය යටතේ ගැනෙන වෙනත් අපරාධ හඳුනා ගැනිමට අසමත් වීමත්, එසේම ඇතැම් අපරාධ සම්න්ධයෙන් පැහැදිලි සාක්ෂි හෙළිදරව් වි තිබියදීත් විමර්ශනයක් නොකිරිමත්, අන්තර්ජාතික නිතීය පිළිබඳ ප්‍රවීණත්වයක් ඇති අපක්ෂපාතී හා ස්වාධීන අධිකරණයක දි අධිචෝදනා ඉදිරිපත් නොකිරිමත් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය මෙම වාර්තාව මගින් විශ්ලේෂණය කරයි.

උගත් පාඩම් හා සංහිදියා කොමිෂමේ ප්‍රසිධ සැසිවාරයන් හි වාර්තා ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය විසින් මැනවින් විශ්ලේෂණය කරන ලදි. මෙම සැසිවාරයන් හි දි සිවිල් වැසියන් රැදි සිටි රෝහල් වැනි ස්ථානයනට බෝම්බ හෙලිම, මනුෂ්‍ය ඝාතන හා බලහත්කාර අතුරුදහන් කිරිම ඇතුළු බරපතළ අපරාධ සම්බන්ධයෙන් සාක්ෂි හෙළිදරව් වි තිබියදීත් මෙම කොමිෂන් සභාව එකී අපරාධ සම්බන්ධයෙන් නිසි පරිදි ක්‍රියා නොකිරිම මගින් කොමසාරිස්වරුඃ

[4] ශ්‍රී ලංකාවඃ යුද්ධ අපරාධ චෝදනා අන්තර් ජාතික විමර්ශනයක් අවශ්‍යයයි. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල්, හියුමන් රයිට්ස් වොච් හා ක්‍රයිසිස් ගෲප් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ ලිපියඃ
14 October 2010 (Index: ASA 37/015/2010)
https://www.amnesty.org/en/library/asset/ASA37/015/2010/en/b8167216-c0aa-48be-99f8-bdcb5cab5d84/asa370152010en.pdf

- එල් ටි ටි ඊ, වෙනත් ආයුධ සන්නද්ධ කණ්ඩායමක හෝ රජයේ ත්‍රිවිධ හමුද සාමාජිකයින් වේවා සාක්ෂි ඇත්නම් ඔවුන් සැක කටයුතු  අපරාධකරුවන් වශයෙන් පෞද්ගලිකව හඳුනා ගැනිමට අසමත් විම;
- සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිමට හා බිය වැද්දිම්,  තර්ජන වලින් බේරා ගැනිමට අසමත් විම;
- රජය විසින් සිදු කරන ලදැයි සැක කරනු ලබන මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව රජයේ හා රජයට පක්ෂපාති සාක්ෂිකරුවන් ගෙන් ප්‍රමාණවත් පරිදි ප්‍රශ්න කිරිමට අසමත් විම;
- අද දක්වා අධි චෝදනා ඉදිරිපත් කිරිම පිණිස කිසිදු තැනැත්තෙකු ගේ නම අධිකරණයට නිර්දේශ නොකිරිම;

සිය සභා සැසිවාර සියල්ලෙහි දිම පාහේ  සාක්ෂිකරුවන් ගෙන් නිශ්චිත කරුණු දැනගැනිමටත්, සාක්ෂිකරුවන් විසින් ඉගි කරන ලද සිද්ධින් ඔස්සේ විශේෂයෙන් ම රජයේ හමුද හා එල් ටි ටි ඊ සංවිධානය විසින් සිදු කළේ යැයි කියනු ලබන බරපතළ අපරාධ සම්බන්ධයෙන් තවදුරටත් පරික්ෂණ පැවැත්විමටත් කොමසාරිස්වරුන් කිසිදු උත්සාහයක් නොගත් බව මැනවින් ප්‍රදර්ශනය විය.  ඒ නිසාම කොමිෂන්  සභා සැසි වාර්තා රාජ්‍ය වගවිම පිළිබඳ ප්‍රතිපත්තියට කිසිදු දයකත්වයක් නොදෙයි. දැනට ශ්‍රී ලංකාවේ නිදන් ගතව ඇති වරදින් නිදෙස් විමේ ප්‍රතිපත්තිය නිසා ඉහත කි ප්‍රතිඵල පුදුමයට කරුණක් ද නොවේ.
ශ්‍රී ලංකාවේ වගවිම පිළිබඳ ප්‍රගති වාර්තාව ඉතාමත් දුර්වල බවත්, උගත් පාඩම් හා සංහිඳියා කොමිෂමේ අධිකාරිය අපැහැදිලි බවත්, එම කොමිෂන්  සභාවට ස්වාධිනත්වයක් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිම පිණිස අවශ්‍ය විධිවිධාන නොමැති වු බවත්, ශ්‍රී ලංකාවේ මෙන් ම ඉන් පරිබාහිර  නිරික්ෂකයින් පිළි ගනිති. උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව විසින්  රජයට යම්කිසි වගවිමක් පැවැරිමට ඉඩ ඇති බවත්, එමඟින් දැනට කඩාකප්පල් වි ඇති 'දේශපාලන විසඳුම' පිළිබඳ සාකච්ඡාවට යම් ආලෝකයක් ලැබිය හැකි බවත් තවත් ඇතැම් පිරිසක ගේ මතය වේ. නමුත් මෙබඳු මතයක පදනම කුමක් දැයි පැහැදිලි නැත.
ජාත්‍යන්තර ප්‍රතිපත්ති සම්පාදකයින් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව පිළි ගත හැකි දේශීය වගවිම පිළිබඳ යාන්ත්‍රණයක් බවත්, එමඟින් යුද්ධ අපරාධ ගණයේ ලා සැලකිය හැකි උල්ලංඝණයන් විභාග කිරිමට හැකි බවත් පිළි ගැනිමේ අනතුරක් ඇත. නමුත් යථා තත්වය නම් රජය සිය කටයුතු සම්බන්ධයෙන් වගකිම බාර ගැනිම තවදුරටත් ප්‍රමාද කිරිම හා වින්දිතයින්ට යුක්තිය හා හානිපුරණය කිරිම ප්‍රමාද කිරිමය. ශ්‍රී ලංකාවේ සංහිඳියාව ඉදිරියට ගෙන යා හැක්කේ එක්සත් ජාතීන් ගේ සංවිධානය මැදිහත් ව පිහිට වනු ලබන නිර්ව්‍යාජ, වගවිම පිළිබඳ දේශීය යාන්ත්‍රණයකින් පමණි. නොමඟට යන ශ්‍රී ලංකා රජය මවාපාන ශ්‍රී ලංකාව, සැබෑ  ශ්‍රී ලංකාව නොවේ. එබඳු රජයක් සමඟ අත් වැල් බැඳ ගැනිම මඟින් විවිධ ජන කොටස් වලට අයත් දහස් ගණනක් ජනතාව ගේ  මානව අයිතිවාසිකම් තවදුරටත් උල්ලංඝණය විමට අනුබල දිමකි.

## ජාත්‍යන්තර මට්ටමේ වගවීමේ යාන්ත්‍රණයක් පිහිටුවීම:

## වත්මන් තත්වය:

ජාත්‍යන්තර මට්ටමේ වගවීමේ යාන්ත්‍රණයක් පිහිටුවීම පිළිබඳ ජගත් ව්‍යායාමයට ශ්‍රී ලංකා රජය විසින් අකුල් හෙළනු ලැබුවත් එම ව්‍යායාමයේ ප්‍රවර්ධකයින්ට යම් කිසි ප්‍රගතියක් වාර්තා කර ගැනිමට හැකි වි තිබේ. සිවිල් යුද්ධය නිමවීමත් සමගම 2009 මැයි මස ශ්‍රී ලංකාවට පැමිණ උතුරේහි කළ සිය සංචාරය අවසානයේ එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මහ ලේකම් බෑන් කිං මුන් මහතා, ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ සමග 2009 මැයි මස 23 දින නිකුත් කළ ඒකාබද්ධ නිවේදනයට අනුව මහලේකම් වරයා ' ජාත්‍යන්තර මානවීය හා මානව හිමිකම් නිතීයට අනුව රජයේ වගවීම පිළිබඳ ක්‍රියාවලියක් පිහිටුවීමේ වැදගත් කම' අවධාරණය කළ අතර, මහින්ද රාජපක්ෂ ' එකි දුක් ගැනවිලි විමසා බැලිමට' එකඟත්වය පළ කළේය. මෙහි දි මහින්ද රාජපක්ෂ මහතා 'ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් ට හා ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වගකිම් වලට අනුකූලව මෙරට මානව අයිතිවාසිකම් ආරක්ෂා කොට ප්‍රවර්ධනය කිරිමට තමා දැඩි ලෙස කැප වි සිටින බවට' ප්‍රකාශ කළේය.[5]

ජනාධිපතිවරයා ගේ වාචික කැපවිම අනුව යමින් බෑන් කිං මූන් මහතා ශ්‍රී ලංකාවේ වගවීම ආශ්‍රිත ගැටළු පිළිබඳව තමාට උපදෙස් ලබා ගැනිමට විද්වත් මණ්ඩලයක් පත් කළේය. මෙම මණ්ඩලයේ සාමාජිකයින් වුයේ මරාසුකි දරුස්මාන් ( ඉන්දුනිසියාව) සභාපති, ස්ටීවන් රැට්නර් ( ඇමෙරිකාව) යස්මීන් සූකා ( දකුණු අප්‍රිකාව) ය. මෙම විද්වත් මණ්ඩලයේ වාර්තාව 2011 අප්‍රියෙල් 12 වන මහලේකම් වරයාට බාර දෙන ලදි. එම වාර්තාවට අනුව ' ජාත්‍යන්තර මානවීය හා මානව අයිතිවාසිකම් නීතියට අනුව ශ්‍රී ලංකා රජයත් එල් ටි ටි ඊ සංවිධානයත් යුද්ධ අපරාධ ගණයේ ලා සැලකිය හැකි ක්‍රියා සිදු කිරිම පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බවට තමන් සෑහීමටකට පත් වන්නේ යැයි' විද්වත් මණ්ඩලය ප්‍රකාශ කළෝය.[6]

එම වාර්තාව මගින් වහාම මහ ලේකම්වරයාට ' අන්තර් ජාතික ස්වාධීන යාන්ත්‍රණයක්' පිහිටු වන මෙන් නිර්දේශ කරන ලදි. එමගින්;

(1) ශ්‍රී ලංකා රජය දේශීය වශයෙන් සැක කටයුතු චෝදනා විමර්ශනය කිරිම ඇතුළු බල සහිත වගවීමේ ක්‍රියාවලියක නිරත වන්නේ ද යන්න නියාමනය කිරිම හා ඇගයිමට ලක් කිරිම සහ කලින් කළට මහ ලේකම් වරයාට වාර්තා කිරිම;

(2) අව්‍යාජ හා බලසහිත දේශීය විමර්ශනය සැලකිල්ලට ගනිමින් සිදු වු උල්ලංඝණයන් පිළිබඳ ව එක්සත් ජාතීන් ගේ සංවිධානය විසින් විමර්ශනයක් ආරම්භ කිරිම;

[5] ඒකාබද්ධ ප්‍රකාශනය: එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මහා ලේකම් හා ශ්‍රී ලංකාවේ ජනාධිපති:
SG/2151, 26 May 2009
https://www.un.org/News/Press/docs/2009/sg2151.doc.htm

[6] එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මහා ලේකම් විසින් පත් කරන ලද විද්වත් කමිටු වාර්තාව: විධායක සාරාංශය 2වන පිටුව
, http://www.un.org/News/dh/infocus/Sri_Lanka/POE_Report_Full.pdf

(3) යුද්ධයේ අවසාන අදියර හා සම්බන්ධ වගවීම් සඳහා ආදළ සාක්ෂි එක්රැස් කිරිම හා එකී සාක්ෂි මෙන්ම විද්වත් කමිටුව හා වෙනත් එක්සත් ජාතීන් ගේ ආයතන විසින් එක්රැස් කරන ලද සාක්ෂි ද අනාගත ප්‍රයෝජනය පිණිස සුරැකිව තැබිම;[7]

2011 අප්‍රියෙල් 25 දින බෑන් කිං මූන් මහතා ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තාව ප්‍රකාශයට පත් කරමින් තමාට ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ස්වාධීන ජාත්‍යන්තර වගවීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරිමේ නීතිමය බලයක් නැතැයි ප්‍රකාශ කළේය.[8] මෙය පවත්නා නීතිමය තත්වයට හාත්පසින් ම වෙනස් මතයකි. එබඳු යාන්ත්‍රණයක් පිහිටු විම පිණිස තමාට එක්කෝ එක්සත් ජාතීන් ගේ සංවිධානයේ ආරක්ෂ මණ්ඩලයෙන් හෝ ජිනිවා හි පිහිටි එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලයෙන් අවසරයක් ලැබිය යුතුයැයි මහලේකම් වරයා කියා සිටියේය. ඒ අතරම, 2011 සැප්තැම්බර් මස ජිනීවා හි පැවති මානව හිමිකම් කවුන්සිල් රැසිවිම පැවැත්වෙන අතරතුර වාරයේ දි මහ ලේකම් වරයා ශ්‍රී ලංකාව පිළිබඳ විද්වත් කමිටු වාර්තාව ජිනිවා හි පිහිටි එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලයට නිල වශයෙන් ඉදිරිපත් කළේය.

ශ්‍රී ලංකා බලධාරින් විසින් විද්වත් කමිටුවේ වාර්තාව අපකිර්තියට පත් කිරිම පිණිස රාජතාන්ත්‍රික මෙහෙයුමක් දියත් කළේය. 2011 අප්‍රියෙල් 13 වන දිනම එනම් වාර්තාව පිට වු දිනට පසු දිනම විදේශ කටයුතු අමාත්‍යංශය ප්‍රකාශයක් නිකුත් කරමින් තමන් විද්වත් කමිටු වාර්තාව සම්පුර්ණයෙන් ම අධ්‍යයනය නොකළ නමුත් එම වාර්තාව ප්‍රතික්ෂේප කරන බව කියා සිටියේය. දැනට උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව සම්බන්ධයෙන් ලැබි තිබෙන සියළු තොරතුරු වලට ප්‍රතිපක්ෂව යමින්, විදේශ අමාත්‍යංශය සිය රාජතාන්ත්‍රික මෙහෙයුමේ ප්‍රධාන ඉලක්කය කර ගත්තේ උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව පුර්ණ බලැති වගවිමේ යාන්ත්‍රණයක් බව ජාත්‍යන්තර ප්‍රජාවට ඒත්තු ගැන්විමටයි.

අපරාධකරුවන් වරදින් නිදෙස් කිරිම හා සිවිල් ජනතාව වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට යටත් කිරිම පිළිබඳව එල්ල වන බරපතළ චෝදනා මුලින් උපුටා දැමිම පිණිස බලධාරින්ට දේශපාලන අධිෂ්ඨානයක් නොමැති බව ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසය පෙන්වා දෙයි. එසේම ඔවුහු යුද්ධයේ අවසාන අදියරේ දි රාජ්‍ය නිලධාරීන් විසින් ම අන්තර් ජාතික මානවීය හා මානව හිමිකම් නීතිය උල්ලංඝණය කළ බව හඳුනා ගැනිමට ද, වින්දිතයින්ට යුක්තිය ඉෂ්ට කිරිමට උත්සාහයක් ද නොගනී. තවද, මානව හිමිකම් හා අන්තර් ජාතික මානවීය නීතිය උල්ලංඝණය කළ අපරාධකරුවන්ට අධි-චෝදනා ඉදිරිපත් කොට දඩුවම් කරන බවට 2008 දි ජිනිවා හි මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ තමන් පොරොන්දු වු බව ද ශ්‍රී ලංකා රජයට අමතක වි ගොසිනි.

ශ්‍රී ලංකාවට එල්ල වන බරපතළ චෝදනා විභාග නොකිරිමට රජය දරන ප්‍රයත්නය, හෙළි දරව් වෙමින් පවතින යුද්ධ සමයේ සිදු වුයේ යැයි සැක කරන අපරාධ ඉදිරියේ ප්‍රතික්ෂේප කිරිමට සිදු වෙයි. ආධුනිකයින් විසින් විඩියෝ හා ජංගම දුරකථන මගින් රූ ගත කරන ලද දර්ශන ඇතුලත් බ්‍රිතාන්‍යයෙහි පිහිටි චැනල් ෆෝ රූපවාහිනි ජාලය විකාශනය කළ 'කිලිං

[7] ඉහත vii

[8] ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධයේ අවසාන අදියර සම්බන්ධ එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මහ ලේකම් පත් කළ විද්වත් කමිටු වාර්තාව: SG/SM/13524, 25 April 2011

ෆිල්ඩ්ස්' නම් වූ විඩියෝ පටයෙහි එන දර්ශන, යුද්ධයට සම්බන්ධ වූ දෙපාර්ශවය විසින් සිදු කළ යුද්ධ හා මානව සංහතියට එරෙහි අපරාධ පිළිබඳ පිළිගත හැකි සාක්ෂියක් වෙයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් විවිධ රාජ්‍යයන්; විශේෂයෙන් ශ්‍රී ලංකාවේ මිත්‍ර රාජ්‍යයන් වන ඉන්දියාව හා ඇමෙරිකාව විසින් ශ්‍රී ලංකාවේ යුද්ධ අපරාධ විමර්ශනය පිළිබඳ එකඟත්වයකට නොපැමිණීමේ රජයේ දැඩි ස්ථාවරය සම්බන්ධයෙන් සිය කනස්සල්ල ප්‍රකාශ කරමින්, ශ්‍රී ලංකා රජය වගවීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරිම හා දේශපාලන විසඳුමක් පිළිබඳ රජයේ ක්‍රියා මාර්ගය පිළිබඳ තමන් සෑහිමකට පත් වන තුරු අන්තර් ජාතික ස්වාධීන පරික්ෂණයක් පිළිබඳ ඉල්ලීමට සහයෝගය දෙන බව ද කියා සිටියෝය.

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය මෙම වාර්තාවෙන් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව ඉහත කී පියවරයන් කරා ළඟා වීමට අපොහොසත් වී ඇති බව පෙන්වා දෙයි. මෙම කාරණය සිත් හි තබා ගෙන එක්සත් ජාතීන් ගේ සංවිධානය වහාම ක්‍රියාත්මක විය යුතුය. මහ ලේකම් බෑන් කිං මූන් හට අන්තර් ජාතික වගවීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමේ අධිකාරියක් ඇතැයි යන ස්ථාවරයේ සිට, මහ ලේකම් වරයා ගෙන් හා මානව හිමිකම් කවුන්සිලයෙන් විද්වත් මණ්ඩලය නිර්දේශ කළ පරිදි අන්තර් ජාතික වගවීමේ යාන්ත්‍රණයක් පිහිටු වීමට පියවර ගන්නා ලෙසත් යුද්ධයෙන් පිඩාවට පත් වූ වින්දිතයින්ට යුක්තිය ඉෂ්ට කර දෙන් ලෙසත් ඉල්ලා සිටිමු.

- එක්සත් ජාතීන් ගේ මහ ලේකම්වරයා මානව හිමිකම් කවුන්සිලය, ආරක්ෂක මණ්ඩලය හා අනෙකුත් එක්සත් ජාතීන් ගේ ආයතන සමග සහයෝගයෙන් ක්‍රියා කරමින් වහාම ස්වාධීන අන්තර් ජාතික විමර්ශනයක් ආරම්භ කිරීම පිණිස පියවර ගත යුතුය.
- එක්සත් ජාතීන් ගේ සංවිධානයේ සියළුම සාමාජික රටවල් ස්වාධීන අන්තර් ජාතික විමර්ශනයක් පිළිබඳ යෝජනාවට සහයෝගය දිය යුතුය. තවද, එක්සත් ජාතීන් ගේ සාමාජිකයින් සිය සාමුහික වගකිම අනුව යමින් තම ජාත්‍යන්තර අධිකාරි බලය මත ශ්‍රී ලංකාවේ සිදු වි යැයි සැක කරන යුද්ධ හා මානව වර්ගයාට එරෙහි අපරාධ පිළිබඳව විමර්ශනය කොට අධි-චෝදනා ඉදිරිපත් කිරිමට දයක විය යුතුය.

## පසුබිම:

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව 2010 මැයි මාසයේ දි ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් පත් කරන[9] ලද්දේ එක්සත් ජාතීන් ගේ මහ ලේකම් බෑන් කිං මූන් විසින් පත් කරන ලද විද්වත් මණ්ඩලය ප්‍රතික්ෂේප කරමින් ඊට ප්‍රති උත්තරයක් වශයෙනි. මහ ලේකම් බෑන් කිං මූන් සිය විද්වත් මණ්ඩලය පත් කරන ලද්දේ යුද්ධයේ අවසාන කාල පරිච්ඡේදයේ එල්.ටී.ටී.ඊ සංවිධානයත් ශ්‍රී ලංකා රජය විසින් සිදු කරන ලද්දේ යැයි සැක කරනු ලැබූ බවට ඉමහත් ප්‍රසිධියක් ලැබූ අන්තර් ජාතික නීතිය උල්ලංඝණය කිරිම හා මානව වර්ගයාට එරෙහිව සිදු කරනු ලැබූ අපරාධ සම්බන්ධ චෝදනා වලට ප්‍රතිචාරයක් වශයෙනි.

ශ්‍රී ලංකා රජය විසින් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව ජාතික වගවිමේ යාන්ත්‍රණයක් වශයෙන් හඳුන්වා දෙන ලද අතර මෙම කොමිෂන් සභාව 2011 අප්‍රේල් මස නිකුත් කරන ලද බෑන් කිං මූන් ගේ වාර්තාවට පිළිතුරු දිමට ද ආයුධයක් වශයෙන් භාවිතා කරන ලදි.

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් ' සභාවේ අධිකාරියට අනුව ඔවුහු ශ්‍රී ලංකා ඉතිහාසයේ සිදු වු මාරාන්තිකම යුද්ධය ආවර්ජනය කොට නැවත එබන්දක් සිදු විම වැළැක්විම පිණිස යෝජනා ඉදිරිපත් කළ යුතු විය. 2002 ක්වූ පෙබරවාරි මස 21 වැනි දින සිට 2009 ක්වූ මැයි මස 19 වැනි දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී සිදුවිය හැකිව තිබූ මතු දැක්වෙන කරුණු පිළිබඳව පරීක්ෂා කොට, එනම්;

1. වර්ෂ 2002 ක්වූ පෙබරවාරි මස 21 වැනි දින ක්‍රියාත්මක කෙරුණු සටන් විරාම ගිවිසුම අසාර්ථකවීමට තුඩුදුන් කරුණු හා අවස්ථානුගත තත්ත්වයන් සහ ඉනික්බිතිව 2009 ක්වූ මැයි මස 19 වැනි දින තෙක් අනුපිළිවෙළින් වූ සිද්ධීන්.
2. කිසියම් තැනැත්තෙක්, කණ්ඩායමක් හෝ යම් ආයතනයක් සෘජුව හෝ අනියමින් මේ සම්බන්ධයෙන් වගකීම දරනුයේ ද යන වග.
3. මෙබඳු සිද්ධීන් යළි ඇති නොවන බවට සහතික කරගනු පිණිස එකී සිද්ධීන්ගෙන් අප උගත යුතු පාඩම් සහ අපගේ සැලකිල්ල යොමු විය යුතු තදාශ්‍රිත කරුණු.
4. මෙකී සිද්ධීන්ගෙන් පීඩාවට පත් කිසියම් තැනැත්තෙකුට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට හෝ උරුමක්කාරයන්ට ප්‍රතිසංස්ථාපනයක් කරනු ලැබිය හැකි ක්‍රමවේදය.
5. මෙබඳු කිසියම් සිද්ධීන් ඉදිරි කාලයේදී යළි ඇතිවීම වළක්වාලනු පිණිසත් සියලු ප්‍රජාවන් අතර තවදුරටත් ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කරලනු පිණිසත් ගනු ලැබිය යුතු ආයතනික, පරිපාලනමය සහ ව්‍යවස්ථාමය ක්‍රියාමාර්ග සහ මේ අධිකාරි

[9] ජනාධිපතිවරයා විසින් 2010 ජුනි 16 වන දින නිකුත් කළ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් මෙම කොමිෂන් සභාව පිහිටුවන ලදි. කොමිෂන් සභාවේ සාමාජිකයින් වුයේ ජනාධිපති නීතිඥ චිත්ත රන්ජන් ද සිල්වා මහතා, ජනාධිපති නීතිඥ ආචාර්ය අම්රිත් රොහාන් පෙරේරා මහතා, මහාචාර්ය මොහොමඩ් තාහීර් මොහොමඩ් ජිෆ්රි මහතා, මහාචාර්ය කරුණාරත්න හඟවත්ත මහතා, චන්දිරපාල් චන්මුගම් මහතා, හේවා මාතර ගමගේ සිරිපාල පලිහක්කාර මහතා, මනෝහරි රාමනාදන් මැතිනිය, මැක්ස්වෙල් පරාක්‍රම පරණගම මහතා යන අයවළුන්ය. කොමිෂන් සභා නම් කිරිම පිළිබඳ සාමාන්‍ය ශ්‍රී ලංකා සම්ප්‍රදය වුයේ එකි කොමිෂන් සභාවන් ඒවා ' සභාපතිවරුන් ගේ නමින් හැඳින්විමය. නමුත් මෙම කොමිෂන් සභාව ජනමාධ්‍යයන් මගින් හඳුන්වන ලද්දේ 'උගත් පාඩම් හා සංහිඳියාව' යන නමිනි. මෙම පරිවර්තනයේ දි වඩාත් ජනප්‍රිය වු උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව යන නමම පාවිච්චි කළෙමු.

පත්‍රයෙහි නියමයන් යටතේ පරීක්ෂණයට භාජනය කරනු ලැබූ කරුණු වලින් කිසියම් කරුණකට අදාළ එබඳු යම් වෙනත් නිර්දේශයන් කිරීම.[10]

2010 ජුනි 06 දින ප්‍රකාශයට පත් කළ ගැසට් නිවේදනයට අනුව උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් මානව අයිතිවාසිකම් හා මානවීය නීතිය උල්ලංඝණනය කිරිම පිළිබඳ විභාග කිරිම අපේක්ෂා නොකළා පමණක් නොව අපරාධකරුවන් අධිකරණය ඉදිරියට ගෙන ඒම ද බලාපොරොත්තු නොවිය. අනිත් අතට උගත් පාඩම් හා සංහිඳියා කොමිෂ සභාව ද ඉහත කි ප්‍රශ්න විචාරනු පිණිස සිය අධිකාරිය අර්ථ කථනය නොකළෝය. නමුත් මෙම කොමිෂන් සභාවේ සංයුතිය බලන කළ එය පුදුමයට කාරණයක් නොවේ.

කොමිෂන් සභාවේ සභාපතිවරයා වුයේ හිටපු නීතිපතිවරයා වන අතර ඔහු සිය රාජකාරි සමය තුළ මානව අයිතිවාසිකම් නඩුවක් වශයෙන් අතිශයින් වැදගත් වු 2006 ජනවාරි මස හමුද විසින් ද්‍රවිඩ සිසුන් පස් දෙනෙකු සමුල ඝාතන (ත්‍රිමලේ පංච පුද්ගල ඝාතනය) නඩු විභාගය කඩාකප්පල් කිරිම පිළිබඳ විවේචන එල්ල වුවෙකි.

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව 2010 අගෝස්තු මස කොළඹ දි සිය සැසිවාර ආරම්භ කරන ලදි. කොළඹ සැසිවාරයට ආණ්ඩුවේ මෙන් ම හමුදවේ නිලධාරින්ටද, පුජ්‍ය පක්ෂය හා පුමුඛ පුරවැසියන් ඇතුළු 140 දෙනෙකුට 2002 සටන් විරාම ගිවිසුම හා දේශපාලන විසඳුමක් සම්බන්ධයෙන් ගත යුතු පියවරයන් පිළිබඳ අදහස් දැක්විමට ආරාධනා කරනු ලැබුවෝය. මේ බොහෝ දෙනෙක් වර්තමාන රජයේ ආධාරකරුවන් මෙන් ම එහි ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අනුග්‍රහය දක්වන්නෝ වු අතර ද්‍රවිඩ ජාතිකයින් 30 දෙනෙකු හා මුස්ලිම් ජාතිකයින් 5 දෙනෙකු හැර අනෙක් සියළු දෙනාම සිංහළයෝ වූහ.

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් උතුරු හා නැගෙනහිර පළාත් වල ද සැසිවාර පැවැත්වු අතර ඊට සහභාගි වු බහුතරයක් යුද්ධයෙන් වින්දිතයින් බවට පත් වුවෝය.

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ කාලය අවස්ථා දෙකකදී දීර්ඝ කළේය. 2011 මැයි මස මැද භාගයේ දි කොමසාරිස්වරුන් සිය වාර්තාව ජනාධිපතිවරයාට භාර දිමට සුදනම් වු අවස්ථාවේ දි ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ කාලය සය මසකින් දීර්ඝ කළේය. කොමසාරිස්වරුන් සිය වාර්තාව 2011 නොවැම්බර් මස නිකුත් කිරිමට බලාපොරොත්තුව සිටින අතර ඇත්ත වශයෙන් ම සිදුවෙමින් පවතින්නේ රජයත් එල් ටි ටි ඊ සංවිධානයත් 2009 දී සිදු කළේ යැයි චෝදනා කරනු ලැබු යුද්ධ අපරාධ සම්බන්ධයෙන් අන්තර් ජාතික පරික්ෂණයක් පැවැත්විමේ යෝජනාව යටත් පත් කිරිම පිණිස රජයට කාලය ලබා දිම පමණකි.[11]

---

[10] අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ: ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය No CA/3/3/24, http://www.llrc.lk/images/stories/docs/Mandate%20English.pdf

[11] 2006 ජනවාරි 02 දින ත්‍රිකුණාමලේ මුහුදු වෙරළේ රැදි සිටි ශිෂ්‍යයන් පස් දෙනෙකුට ශ්‍රී ලංකා ආරක්ෂ හමුද භට පිරිසක් විසින් සිදු කරන ලද වෙඩි තැබිමක් නිසා ශිෂ්‍යයන් පස් දෙනෙක් මිය ගිය අතර දෙදෙනෙක් තුවාල ලැබීය.
පශ්චාත් මරණ පරික්ෂණයේ දි මරණයට හේතුව වෙඩි තැබිම බවත් ඉන් තිදෙනෙකුට හිසට වෙඩි තබා ඇති බවත් අනාවරණය විය. පරික්ෂණ පැවැත්වෙන අතරතුර රහස් පොලිසිය විසින් හදිසි නීතිය යටතේ ආරක්ෂ ලේකම්වරයා විසින් අත්සන් කරන ලද රැදවුම් නියෝගයක් මත ත්‍රිකුණාමල පොලිසියේ උප පරික්ෂක හා විශේෂ කාර්ය බලකායේ

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයක් වශයෙන් පසුගිය දශක දෙකක පමණ කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් උල්ලංඝණයන් පිළිබඳ නියාමනය කිරිම හා මානව අයිතිවාසිකම් රැක ගැනිම පිණිස උද්ඝෝෂණය කරන ලද්දේය. විශේෂයෙන් ම පසුගිය කාලය තුළ විවිධ ආණ්ඩු විසින් පත් කරන ලද පරික්ෂණ කොමිෂන් [P] සභා පිළිබඳ විශේෂ අධ්‍යයනයක් සිදු කරමින් ප්‍රායෝගිකව එම කොමිෂන් [P] සභා සත්‍යාවේක්ෂණයහෙළිදරව් කර ගැනිමටත් , යුක්තිය ඉටු කිරිමට මෙන් ම වින්දිතයින්ට හානි පුරණය කිරිමටත් අසමත්වු ආකාරය හෙළිදරව් කරන ලදි. තවද, ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය පසුගිය දශක දෙක මුළුල්ලේ ම මානව හිමිකම් වින්දිතයින් බවට පත් වු තැනැත්තන් ගේ අයිතිවාසකම් වෙනුවෙන් කටයුතු කළේය. එහි දි වාර්තා වු මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව එක් රැස් කරන ලද තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ වධහිංසා පැමිණ විම, කෲර, අමානුෂික හා අවමන් සහගත සැලකිලිවලට හා දඬුවම් වලට යටත් කිරිම හා වරදින් නිදෙස් කිරිම පිළිබඳ ඓතිහාසික පෙළ ගැස්මක් තිබෙන බව පැහැදිලි ව පෙනි යයි. මේ නිසා ශ්‍රී ලංකාවට නිර්ව්‍යාජ දේශපාලන විසඳුමක් ගෙන ඒමට නම් වින්දිතයින්ට යුක්තිය, සත්‍යාවේක්ෂණය හා හානිපුරණයෙන් ඉටු කළ යුතු බව අපගේ පිළි ගැනිමයි. මේ කර්තව්‍යය සම්බන්ධයෙන් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව ශක්‍යතාවයකින් යුත් යාන්ත්‍රණයක් නොවේ.

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ සැසිවාර පිළිබඳව ජනමාධ්‍යයන් හි පළ වු වාර්තා ඉතා සියුම්ව නිරික්ෂණය කිරිමේ දි එක්සත් ජාතීන් ගේ විද්වත් කමිටුව විසින් මෙම කොමිෂන් සභාව පිළිබඳ කළ නිගමනය ඉහත කි කාරණා සමග මැනවින් ගැලපේ.

' උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව පිහිට වනු ලබන්නේ 2002 සටන් විරාම ගිවිසුමේ සිට 2009 මැයි මස යුද්ධ අවසානය අතීතය විමර්ශනය කිරිම පිළිබඳ රජයේ ඉහළම ප්‍රතිපත්තිය වශයෙනි. මෙම කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ ගැටුම පිළිබඳ ජාතික සංවාදයක් මුල පිරිමට ඉතාමත් සුදුසු අවස්ථාවක් නිර්මාණය කළේය.[12] එබඳු සංවාදයක අවශ්‍යතාවය විශේෂයෙන් ම වින්දිතයින් විසින් විවිධ සැසිවාර වලදි පෙන්වා දුන්නේය.

කෙසේ වෙතත් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව සවාධිනත්වය හා අපක්ෂපාතිභාවය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතින් ට අනුකූල නොවිය. ඊට හේතුව මෙම කොමිෂන් සභාවේ සංයුතිය හා එහි සාමාජිකයින් අතරම මුල් බැස ගෙන තිබු ගැටුම්ය. උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව මේ දක්වා ම (2011 සැප්තැම්බර්) එහි අධිකාරිය, එහි ක්‍රමවේදය හා දෛනික කටයුතු පවත්වා ගෙන

---

සෙබළුන් 12 අත් අඩංගුවට ගන්නා ලදි. කිසිදු හේතුවක් ඉදිරිපත් නොකොට, නීතිපතිවරයා පසුව රහස් පොලිසියට සැකකරුවන් නිදහස් කිරිමට නියෝග කළ අතර පරීක්ෂණ අතර මඟ විය. 2006 සැප්තැම්බර් මස හිටි අඩියේම, ත්‍රිමලේ පංච පුද්ගල ඝාතනය ඇතුළු බරපතළ මානව හිමිකම් දහසයක් විමර්ශනය කිරිමට ජනාධිපතිවරයා විසින් ජනාධිපති කොමිෂන් සභාවක් පත් කළේය. මිය ගිය එක් ශිෂ්‍යයෙකු ගේ පියා වන වෛද්‍ය රගිආර් මනෝහරන් හෙළිදරව් නොකළ ස්ථානයක සිට විඩියෝ කැමරාවක් මගින් මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන්නේය. එසේ කිරිමට හේතු වුයේ සිය පුතා ගේ ඝාතනය පිළිබඳ පරික්ෂණ ඉදිරියට ගෙන යාමට ඉදිරිපත් විම නිසා ඔහුට එල්ල වු ජීවිත තර්ජන නිසාය.
කොමිෂන් සභා වාර්තාව ජනාධිපතිවරයාට බාර දෙන නමුත් කිසි කලෙක ප්‍රසිධ නොකළේය.(බලන්න, විසි වසරක මායාවඃ ශ්‍රී ලංකාවේ පරික්ෂණ කොමිෂන් සභා (Index: ASA 37/005/2009)
https://www.amnesty.org/en/library/asset/ASA37/005/2009/en/c41db308-7612-4ca7-946d-03ad209aa900/asa370052009eng.pdf

[12] බලන්නඃ ඇම්නස්ටි ඉන්ටර්නැෂනල්- විසි වසරක මායාවඃ ශ්‍රී ලංකාවේ පරික්ෂණ කොමිෂන් සභා (Index: ASA 37/005/2009

ගිය ආකාරය අනුව ජාත්‍යන්තර මානවීය හා මානව හිමිකම් නීතිය බරපතළ ලෙස උල්ලංඝණය කළ අවස්ථා පිළිබඳව විමර්ශනයක් කිරිමේ උවමනාවක් ප්‍රදර්ශනය කළේය. දශක ගණනාවක් තිස්සේ දිග් ගැස්සුන ජන වාර්ගික යුද්ධය ට තුඩු දුන් ගැඹුරු හේතු විභාග කිරිමක් ද නොවිය. මේ වෙනුවට කොමිෂන් සභාව තමන් පත් කළ ආණ්ඩුවේ උවමනාව ඉටු කිරිම පිළිබඳව දැඩි අවධානයක් යොමු කර තිබුනි. මේ දක්වා උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව යුද්ධයේ අවසාන අදියරේ සිදු වුයේ කුමක් දැයි නිරාවරණය කර ගැනිම පිණිස අවංක උත්සාහයක් දරන බවක් නොපෙනේ. දෙපාර්ශවය විසින් ම බරපතළ ලෙස උල්ලංඝණය කරන ලද මානව අයිතිවාසිකම් පිළිබඳ විධිමත් අපක්ෂපාති විමර්ශනයක් සිදු නොකෙරිණ. වින්දිතයින් ට ඔවුන් ගේ අභිමානයට හා ගෞරවයට හේතු වන ආකාරයට සැලකිමක් නොවුවා පමණක් නොව වින්දිතයින් ආරක්ෂා කිරිමේ වැඩ පිළිවෙළක් ද නොවිය.

සමස්ථයක් වශයෙන් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව දෝෂ සහිත, බල සහිත වගවිමේ යාන්ත්‍රණ පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් ට නොගැලපුන යාන්ත්‍රණයක් වූ අතර ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා හා මහලේකම් වරයා අතර වගවිමේ ක්‍රියාදමයක් පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශනයෙන් ඇති කර ගත් එකගතාවයට ද පරස්පරය.’ [13]

## උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් ් සභාවේ දුර්වල අධිකාරියඃ

උගත් පාඩම් පිළිබඳ කොමිෂන් සභාව බල සහිත වගවිමේ යාන්ත්‍රණයක් වශයෙන් ශ්‍රී ලංකා රජය විසින් හුවා දක්වන්නට වෑයම් කරයි. එහෙත් මෙම කොමිෂන් සභාව පිහිටුවන ලද්දේ එබඳු අරමුණකින් නොවන බව ඉතාමත් පැහැදිලිය. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ඉහත කි කොමිෂන් ් සභාව ස්ථාපිත කළේ 2002 සටන් විරාම ගිවිසුමේ සිට 2009 මැයි 19 දින සිදු වු ගැටුම් වලින් යම්කිසි තැනැත්තෙකුට අලාභයක් සිදු වි නම් ඔවුන්ට හානි පුරණය කිරිමේ ක්‍රමයක් සැකසිම පිණිස යැයි ප්‍රකාශ කරයි. එහෙත් අදළ ගැසට් නිවේදනය හානි පුරණය යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි නිශ්චිත ව සඳහන් නොකරයි. එපමණක් නොව දැනට ශ්‍රී ලංකාවේ පවතින තත්වය අනුව දෙයාකාරයක කරුණු මෙහි දි වැදගත් වේ. පළමු වැන්න ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වුවත් මානව අයිතිවාසිකම් උල්ලංඝණයක් සම්බන්ධයෙන් වුවත් ශ්‍රෙෂ්ඨාධිකරණය මගින් වන්දි ලබා ගැනිම ඉතාමත් දුෂ්කර කාර්‍යයක් වි තිබිමයි. දෙවැන්න අන්තර් ජාතික නීතිය යටතේ ගැනෙන අපරාධ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ නඩු විභාග ඉතාමත් විරල විමයි. මෙබඳු වාතාවරණයක දි මෙම කොමිෂන් සභාව වන්දි ගෙවිම කරන්නේ කෙසේ ද යන්න අවිනිශ්චිතය.

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ අරමුණ 'වන්දි ගෙවිම' යැයි සඳහන් කළත් , එයින් අදහස් කළේ වන්දි ගෙවිම සම්බන්ධයෙන් නීතිමය වගකිමක් ඇති බවද එසේ නැත්නම් වෙන කිසිවක් ද යන්න පැහැදිලිව අර්ථ කථනය නොකිරිමෙන් ඇත්ත වශයෙන් ම ජනාධිපතිවරයා මෙහි දි අදහස් කළේ කුමක් දැයි අපැහැදිලිය.

## ජාත්‍යන්තර මානව හිමිකම් හා මානවීය නීති මුලධර්ම පිළිබඳ විස්තරයක්ඃ

[13] වීද්වත් කමිටු වාර්තාවඃවිධායක සාරංශය v පිටුව

යාවත්කාලීන කළ වරදින් නිදෙස් කිරිම මර්දනය කරමින් මානව හිමිකම් ආරක්ෂා කිරිම හා ප්‍රවර්ධනය පිළිබඳ මූලධර්ම සංග්‍රහයේ 8 වන මූලධර්මයට අනුව ' අධිකරණ බලාධිකාරිය පිළිබඳ ගැටුම් ඇතිවිම වැළැක්විම පිණිස කොමිෂන් සභා පත් කරන කල්හි එකී කොමිෂන් සභාවලට පවරන කාර්‍යයන් ඉතාමත් පැහැදිලිව නිර්වචනය කළ යුතු අතර කිසිම අවස්ථාවක දී සිවිල් පරිපාලන හෝ අපරාධ අධිකරණයන් ට ආදේශකයක් නොවිය යුතුය.' නමුත් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභා අධිකාරියේ මේ පිළිබඳ ව කිසිවක් සඳහන් නොවේ.

එම 8 වන වගන්තිය තවදුරටත් ' පරික්ෂණ කොමිෂන් සභාවක් විසින් යම්කිසි පරික්ෂණයකදී එක්රැස් කරනු ලබන තොරතුරු පසුකාලිනව අධිකරණ පරිපාලනය පිණිස සුරැකිව තැබිය යුතුය' යනුවෙන් සඳහන් කරයි. දැනට මහජනයා අතට පත් වි ඇති තොරතුරු මගින් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව එබඳු ප්‍රයත්නයක් දරන බවක් නොකියවේ. ඇත්ත වශයෙන් ම ප්‍රදර්ශනය වූයේ මෙම කොමිෂන් සභාව රජයේ ආරක්ෂ හමුද වලට එරෙහි චෝදනා සම්බන්ධ සාක්ෂිකරුවන්ට සවන් දිමට පවා මැලිකමක් දක්වන බවයි.[14]

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභා අධිකාරිය සකස් කිරිමේ දි මහජනතාව හා වින්දිතයින් සහභාගි කර නොගැනිම ඇත්ත වශයෙන් ම කණගාටුවට කරුණකි.[15]

මේ නිසා උගත් පාඩම් හා සංහිඳියා කොමිෂමේ කොමසාරිස්වරුන්ට ම සිය කොමිෂන් සභාවේ විෂය පථය හා ක්‍රියාපටිපාටිය පිළිබඳව තීරණය කිරිම බාර විය. කොමිෂන් සභාවේ බහුතරයක් සාමාජිකයින් ශ්‍රී ලංකා රාජ්‍ය සේවයට අයත් වූ ඉහළ පෙළේ හිටපු රාජ්‍ය සේවකයින් වෙති. ඔවුන් ගෙන් වැඩි දෙනෙක් යම් යම් අවස්ථාවලදි වර්තමාන රජය ආරක්ෂා කිරිම පිණිස රජය වෙනුවෙන් පෙනි සිටිමින් රජයට එරෙහිව එල්ල වන යුද්ධ අපරාධ චෝදනා වලට පිළිතුරු සැපයුවෝ ද වෙති. මේ නිසා එබඳු තැනැත්තන් මෙබඳු කොමිෂන් සභාවකට පත් කළ විට ඉහත විස්තර කළ ආකාරයේ ආරක්ෂාකාරි පිළිවෙතක් අනුගමනය කිරිම පුදුමයට කාරණයක් නොවේ.

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ සැසිවාර විශ්ලේෂණය කිරිමේ දි කොමසාරිස්වරු සිය අධිකාරිය අන්තර් ජාතික මානව අයිතිවාසිකම් හා මානවීය නීතිය උල්ලංඝණය කිරිම පිළිබඳ යුක්තිය ඉෂ්ට කිරිමක් වශයෙන් අර්ථ කථනය නොකිරිමට ප්‍රවේශම් වූහ. මීට පරස්පරව, ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුමට තුඩු දුන් නිධන්ගත හේතුන් පිළිබඳව මහජනයාගේ හා රාජ්‍ය නිලධාරින් ගේ මත විමසිමත්, 2002 සටන් විරාම ගිවිසුම කඩාකප්පල් විමට හේතු, හා ජනවාර්ගික ගැටුම ආශ්‍රීත

[14] ශ්‍රී ලංකාවෙන් පිට මංව වාසය කරන බොහෝ දෙනෙක් කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දීමට කැමැත්ත පළ නමුත් කොමිෂන් සභාව ඒ කිසි කෙනෙකුට සාක්ෂි දිම පිණිස ආරාධනය නොකළේය.

[15] යාවත් කාලීන කරන ලද මූලධර්මයන් හි 6 වන මූලධර්මයः' හැකිතාක් දුරට සත්‍යානුවේෂණ කොමිෂන් සභාවක් පිහිටු විමට තීරණ තිරණය කරන කල්හි එම කොමිෂන් සභාවේ අධිකාරිය හා සංයුතිය තීරණය කළ යුත්තේ වින්දිතයින් හා දිවි ගලවා ගත් තැනැත්තන් ඇතුළු පුළුල් ජනතා මත විමසිමකින් අනතුරුවය. විශේෂයෙන් ම සමානත්මතා මූලධර්මය පදනම් කොට ගෙන කාන්තා නියෝජනය සහතික කළ යුතුය. 6 වන මූලධර්මයः මානව හිමිකම් ආරක්ෂා කිරිම හා ප්‍රවර්ධනය මගින් වරදින් නිදොස් කිරිම මැඩලීම United Nations, E/CN.4/2005/102/Add.1, 8 February 2005http://daccess-dds-ny.un.org/doc/UNDOC/GEN/G05/109/00/PDF/G0510900.pdf?OpenElement

ගැටළු පිළිබඳව සාක්ෂි රැස්කිරීම, උදහරණයක් වශයෙන් නිවාස පිළිබඳව තොරතුරු විමසා බැලීම වඩාත් ප්‍රායෝගික යැයි කොමසාරිස් වරු කල්පනා කළ බව පෙනේ. කොමිෂන් සභාව ඉදිරියට සාක්ෂිකරුවන් ඉතා විශාල සංඛ්‍යාවක් අතුරුදහන් වූ හා නඩු පැවරීමකින් තොරව රඳවා ගෙන සිටින සිය කාලත්‍රයන් හා ඥාතීන් පිළිබඳ පැමිණිලි කළ කල්හි කොමිෂන් සභාව වහාම එකී තැනැත්තන්ට අවශ්‍ය තොරතුරු හා මුණ ගැසීම් සඳහා විධිවිධාන සලස්වන ලදි. නමුත් මේ සියළුම පියවරයන් මානව හිමිකම් හා අන්තර් ජාතික මානවීය නීතිය උල්ලංඝණනය කළ අපරාධකරුවන් හඳුනා ගැනීම හා ඔවුන්ට අධිචෝදනා ඉදිරිපත් කිරීමට වඩා මෙය හාත්පිසින් ම වෙනස්ය.

සි. ආර්. ද. සිල්වා, සභාපතිවරයා වශයෙන් 2010 අගෝස්තු මස 11 වන දින, කොළඹ පැවති කොමිෂන් සභාවේ සමාරම්භක උත්සවයේ දි සිය අධිකාරිය හා අරමුණ පැහැදිලි කිරීමට උත්සාහ දරමින් මේසේ ප්‍රකාශ කළේය. ' අතිගරු ජනාධිපතිවරයා විසින් පත් කළ මෙම කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්‍ය වන්නේ 2002 සටන් විරාම ගිවිසුම අසාර්ථක වීමට තුඩුදුන් නිදන් ගත හේතු හඳුනා ගැනීම හා එකි ගිවිසුම කඩාකප්පල් වීමට දායක වූ තැනැත්තන් හා කණ්ඩායම් හඳුනා ගැනීමත්ය.

දෙවනුව, අතීත අත්දැකීම් තුලින් මෙබඳු සිදුවීමක් යළි සිදු නොවීම පිණිස අපට උගත හැකි පාඩම් කවරේදැයි හඳුනා ගැනීම;

තෙවනුව, ඉතාමත් වැදගත් අරමුණ නම්, සියළු ජාතීන් අතර ජාතික ඒකාග්‍රතාවය හා සංහිඳියාව සහතික කරනු පිණිස ශ්‍රී ලංකාව සාමකාමී හා සෞභාග්‍යමත් යුගයකට අවතිර්ණ කිරීමට අවශ්‍ය යෝජනාවලියක් සකස් කිරීම;

අපගේ සැසිවාර හා විමර්ශනයන් ජනතා කේන්ද්‍රීය වෙයි. එම ස්ථාවරයේ සිට අප මහජනතාවට කොමිෂන් සභාවේ අධිකාරිය අදාළ කාරණා සම්බන්ධයෙන් සහභාගි වන මෙන් ආරාධනය කරමු. මීට අමතරව මෙම කොමිෂන් සභාව යුද්ධයෙන් පිඩාවට පත් ප්‍රදේශයන් හි ද සැසිවාර පැවැත්වීමට තීරණය කොට ඇත. මෙම තීරණය ගන්නා ලද්දේ එකී ප්‍රදේශවල ජනතාවට සිය දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීමත්, අතීතයේ දි මෙන් ම වර්තමානයේ දීත්, විශේෂයෙන් ම යුද්ධයෙන් පසු ඔවුන් මුහුණ දෙන ගැටළු හඳුනා ගැනීමටත්ය.[16]

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් උතුරු පළාතේ සිය ප්‍රථම සැසිය වවුනියාවේ පවත්වනු ලැබූ අවස්ථාවේ දි, සභාපතිවරයා සාක්ෂිකරුවන් ගෙන් 'අතීතය අමතක' කරන මෙන් ඉල්ලා සිටිමින්, සිය කොමිෂන් සභාවට සිය දරුවන් ගේ අධ්‍යාපනය, වෛද්‍ය පහසුකම් හා නිවාස පහසුකම් පිළිබඳව කරුණු ඉදිරිපත් කරන මෙන් ඉල්ලා සිටියේය. සභාපතිවරයා තම දුක් ගැනවිලි අතර මානව හිමිකම් උල්ලංඝණය වීම් පිළිබඳව කථා නොකිරීමට ප්‍රවේශම් විය. එහෙත් සාක්ෂිකරුවන් බොහෝ දෙනෙක් මෙම ඉල්ලීමට පිටුපා යමින් අතුරුදහන් වූ හා නඩු විභාගයකින් තොරව අත්අඩංගුවේ තබා ගෙන

[16] කොමිෂන් සභා සභාපතිවරයා ගේ ආරම්ක දේශනය- (LLRC/PS/11-08-10/01), 1 පිටුව

සිටින සිය කාලත්‍රයන් හා ඥාතීන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට මෙම සැසිවාර අවස්ථාවක් කර ගන්නා ලදි.[17]

මන්නාරම පදවියේ අගරද ගුරු රායප්පා ජෝශප් හිමිපාණන් 2011 ජනවාරි මස කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමින් සිය ප්‍රදේශවාසින් විසින් මුහුණ පෑ හා මුහුණ දෙන විවිධ මානව හිමිකම් ගැටළු සමග අතුරුදහන් වුවන්, අධිකරණ බාහ්‍ය ඝාතන වලට ගොදුරු වුවන් හා රැඳවියන් සිය ගණනක ගේ නාම ලේඛනයක් ද ඉදිරිපත් කරන ලදි. අගරද ගුරු හිමිපාණන් මෙම වධහිංසා හා කෲර, අමානුෂික සහ අවමන් සහගත සැලකිල්ලට යටත්වුවන් පිළිබඳ මෙන් ම යුද්ධයේ අවසාන අදියරේ දී සිදු වූ සත්‍ය සිදුවීම් පිළිබඳ ද වාර්තා කළේය. කොමිෂන් සභාවේ සභාපතිවරයා සිය අතුරු වාර්තාව හා එහි නිර්දේශ ඉදිරිපත් කරමින් අත් අඩංගුවේ රඳවා තබා ගැනීම, ඉඩම් හා භාෂාව පිළිබඳ ගැටළු පිළිබඳව දීර්ඝ වශයෙන් සාකාච්ඡා කරනු ලැබුවත්, අගරද ගුරුතුමා විසින් මතු කරන ලද ආණ්ඩුවේ හමුද විසින් සිදු කරන ලද මානව අයිතිවාසිකම් උල්ලංඝණනයන් කිසිවක් ගැන සඳහන් කිරීමට අසමත් වූයේය.

2011 ජනවාරි මස දිම මන්නාරමේ දිම සාක්ෂි දුන් තවත් සාක්ෂිකරුවෙක් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටිමන් අධිකරණ බාහිා ඝාතන හා බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳව විමර්ශනය කරන මෙන් ඉල්ලා සිටියේය. ඔහු තවදුරටත් අත්තනෝමතිකව සිරභාරයට ගැනීම හා ජන වර්ග අතර ගොඩ නැගෙන අවිශ්වාසය පිළිබඳ ව ද කොමිෂන් සභාවේ අවධානය යොමු කරමින් කොමිෂන් සභාවේ නිර්දේශ රජය විසින් කොපමණ දුරට පිළි ගනිව්දැයි සැක පහළ කළේය. පුදුමයට කාරණයක් නොවුවත් කොමසාරිස්වරු සිය අධිකාරිය ඉතාමත් ලඝු කොට සැලකූ නිසා ඊට ප්‍රතිචාර දක්වූ කොමිෂමේ සභාපතිවරයා ' ඔබ ගේ දීර්ඝ දේශනය අපට උපකාර නොවෙයි. දැන ගැනීමට අවශ්‍ය දුක් ගැනවිලි හා ඊට විසඳුම් මොනවාද යන්නයි' යනුවෙන් කීමට පසුබට නොවීය.[18]

තවදුරටත්, ජනාධිපතිවරයා විසින් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව සම්බන්ධයෙන්, පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියෙහි විධිවිධානයන් අදාළ විය යුතු යයි ප්‍රකාශයට පත් කිරීම මගින් සාක්ෂිකරුවන්ට විශේෂ ආවරණයක් ලබා දෙන ලදි. ඉහත කී 14 වන වගන්තියට අනුව මෙම කොමිෂන් සභාවට ලිඛිතව හෝ වාචිකව යම් කිසි තැනැත්තෙක් විසින් ඉදිරිපත් කරනු ලබන සාක්ෂියක් සම්බන්ධයෙන් සිවිල් හෝ අපරාධ අධිකරණයකදී කිසිදු පියවරක් ගැනීම, අධි චෝදනා ඉදිරිපත් කිරීම කළ නොහැකිය. එසේම මෙම පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ තබන ලද යම් කිසි තොරතුරක් සම්බන්ධයෙන් සිවිල් හෝ අපරාධ අධිකරණයකදී අධි-චෝදනා ඉදිරිපත් කිරීම නොකළ හැකි විය.

මෙලෙස ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභා පිහිටුවීමේ පණතේ 14 වන වගන්තිය යටතට උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව පත් කිරීමෙන්, මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද සාක්ෂි සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියා කිරීම වළක්වනු ලැබින. මේ නිසා උගත් පාඩම් හා සංහිඳියා

[17] කොමිෂන් සභා වාර්තා- දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය වවුනියාව 2010 අගෝස්තු 14
http://www.llrc.lk/images/stories/docs/August2010/District_Secys_Office-Vavuniya-14.08.2010.pdf

[18] කොමිෂන් සභා වාර්තා- සාක්ෂි අංක 4- මන්නාරම් දිස්ත්‍රික්කය 2011 ජනවාරි 8 19 පිටුව

කොමිෂන් සභාවට ජාත්‍යන්තර මානව හිමිකම් හා මානවීය නීතිය උල්ලංඝණය කිරිම සම්බන්ධයෙන් තවදුරටත් කිසිදු අධිකරණ ක්‍රියා මාර්ගයක් ගත නොහැකි විය.

සියළුම රාජ්‍යයන් අන්තර් ජාතික නීතිය යටතේ ගැනෙන අපරාධ, අධිකරණ බාහ්‍ය ඝාතන හා අතුරුදහන් කිරිම් ද ඇතුළුව අපරාධ සම්බන්ධයෙන් චූදිතයින්ට අධි-චෝදනා ඉදිරිපත් කිරිම හා දඬුවම් පැමිණ විමේ වගකිමකින් බැදි සිටිති. අන්තර් ජාතික නීතිය යටතේ ඉහත කි අපරාධ සඳහා පොදු සමාවක් දීම තහනම් වන අතර එමගින් මානව අයිතිවාසිකම් වින්දිතයින්ට යුක්තිය, හානිපුරණය හා සත්‍යානුවේෂණ අයිතිය අහිමි කිරිමක් ලෙස පිලි ගැනේ.

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ පිහිටුවිම හා ක්‍රියා පටිපාටිය සිදුවන්නේ දුබල වගවිමේ යාන්ත්‍රණයක් බිහි කිරිමේ වටපිටාවක් තුලය. මීට පෙර පත් කරන ලද මානව හිමිකම් උල්ලංඝණයන් පරික්ෂා කිරිමට පත් කළ පරික්ෂණ කොමිෂන් සභා විසින් පරික්ෂණයට ලක් කළ මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් යුක්තිය ඉටු නොවුයේ දේශපාලන බලාධිකාරිය විසින් එවැන්නකට ඉඩ නොදුන් හෙයිනි. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය කිසිම අවස්ථාවකදි විශේෂයකින් තොරව සම්පුර්ණ සමාවක් හෝ කොන්දේසි සහිත සමාවක් එසේ නැත්නම් එබඳු අන් ආකාරයක පියවරයන් මගින් වරදින් නිදෙස් කිරිම, සත්‍යානුවේෂණය වැලැක්විම හා වින්දිතයින්ට පුර්ණ හානි පුර්ණයක් ලබා දිම අවහිර කිරිමට සම්පුර්ණයෙන් අනුමත නොකරයි.

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව යෝජනා කරන ලද්දේත් බිහිවුයේත් වගවිමේ යාන්ත්‍රණයක් වශයෙන් අසාර්ථික වන පරිසරයකය.අතීතයේ දි පත් කරන ලද පරික්ෂණ කොමිෂන් සභා කිසිවකට මානව හිමිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් යුක්තිය ඉටු කිරිම පිණිස කිසිවක් කළ නොහැකි වුයේ ඒ ඒ කාලයන් හි බලයේ සිටි පාලකයින් ඊට ඉඩ නොදුන් බැවිනි. හිටි අඩියේ පත් කරනු ලබන මෙබඳු පරික්ෂණ කොමිෂන් සභා මගින් මානව හිමිකම් උල්ලංඝණයන් සම්බන්ධ සිද්ධීන් නිරාවරණය කිරිම අපේක්ෂා කළත් දේශපාලන බලපෑම් හා සාක්ෂිකරුවන් ට නිසි රැකවරණයක් නොමැති කම නිසා එම ප්‍රයත්නයන් ද අසාර්ථක වුයේය.

පසුගිය විසිවසර තුළ බහුතරයක් මානව හිමිකම් උල්ලංලඝණයන් කිසි කලෙකත් විමර්ශනය කිරිමක් හෝ අධිකරණ ක්‍රියා මාර්ගයකට යොමු කිරිමක් හෝ නොවීය. අධිකරණ නඩු විභාගයකට යොමු කළත් එබඳු නඩුකරයන් කිසි කලෙකත් අවසානයක් නොදුක්කෝය. සැකකරුවන් සාක්ෂි ඌනතාවයන් නිසා නිදහස් කෙරින; තිබෙන සාක්ෂි නොකැඳවිණ; පවත්වා ගෙන ගිය නඩුකරයන් දිර්ඝ කාලයක් තිස්සේ පවත්වා ගෙන යනු ලැබිණ; සමහර විට ඇතැම් ප්‍රසිද්ධ මානව හිමිකම් නඩුකරණයන් හිදි පැමිණිලි පක්ෂය නඩු විභාගයෙන් ඉවත් විණ; ඇත්ත වශයෙන් ම මෙය සිදු වන්නේ විමර්ශනයන් හා නඩුකරයන් පවත්වා ගෙන යාම සඳහා සම්පත් නොමැති කම නිසා නොවේ. එසේ නැත්නම් ආයතනික ධාරිතාව නොමැති කම නිසාවත් නොවේ. දේශපාලන අධිෂ්ඨානයක් නොමැති කම නිසාය. මෙම තත්වය පිළිබඳව 2009 ජුනි මාසයේ දි ප්‍රකාශයට පත් කළ ශ්‍රී ලංකාවේ පරික්ෂණ කොමිෂන් සභා අසාර්ථක විම පිළිබඳ අධ්‍යයනයේ දි '(විසි වසරක මායාව හෙවත් ශ්‍රී ලංකාවේ පරික්ෂණ කොමිෂන්' සභා') නැමති ග්‍රන්ථයේ දි

'ශ්‍රී ලංකාවේ පරික්ෂණ කොමිෂන් සභා යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයක් වශයෙන් ක්‍රියාත්මක නොවේ. ජනාධිපති කොමිෂන්'සභා වනාහි එක්කෝ සිය දේශපාලන හතුරන්ට එරෙහිව පාවිච්චි කරනු ලබන, එසේත් නැත්තම් රජය විසින් සිදු කරන ලද බරපතළ මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ ව හෙළිදරව් වන චෝදනාවන් හි සැර බාල කිරිම පිණිස යොදා ගනු ලබන මේවලමක් වශයෙනි.

අධිකරණ බලයක් රහිත මෙම ජනාධිපති කොමිෂන් සභාවලින් බලාපොරොත්තු විය හැකි උපරිමය නම් වින්දිතයින්ට සත්‍ය හෙළිදරව් කරන්නට අවස්ථාවක් උද කර දීම පමණි. ප්‍රායෝගික වශයෙන් සමහර අවස්ථා වලදි වින්දිතයින් ගේ පවුල් වලට මූල්‍යමය වන්දියක් ලබා දීමට මෙම කොමිෂන් සභා සමත් වි ඇතත්, එම වන්දි මුදල් ද වන්දි ලාභි පවුල් වලට ලැබි ඇත්තේ අනවශ්‍ය ප්‍රමාදයකින් පසුවය.[19]

**අධි චෝදනා ඉදිරිපත් කිරිමට අසමත් විමඃ**

1989 සිට බලහත්කාරයෙන් අතුරුදහන් කිරිම් දහස් ගණනක් පිළිබඳව වාර්තා වූ අතර, ජනාධිපති කොමිෂන් සභා ගණනාවකින් එකී පැමිණිලි පිළිබඳව විභාග කරන ලදි. අනතුරුව දිර්ඝ කාලයක් තිස්සේ ඇටර්නි ජනරාල් කාර්‍යාලය විසින් අධි-චෝදනා පත්‍ර සිය ගණනක් අධිකරණය වෙත ගොනු කරනු ද ලැබීය. එහෙත් රජයේ සංඛ්‍යා ලේඛන වලට අනුව 2007 වන විට බලහත්කාර රඳවා තබා ගැනිම හෝ අතුරුදහන් කිරිම් පිළිබඳ වැරදිකරුවන් වුයේ 30 කට ආසන්න සංඛ්‍යාවකි. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් වෙත වාර්තා වන අන්දමට 2007 පසු බලහත්කාර පැහැර ගැනිම් හා අතුරුදහන්විම් පිළිබඳව කිසිදු ප්‍රගතියක් වාර්තා වි නැත.

තවද, වධ හිංසා පැමිණවිම, කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට යොමු කිරිම හෝ දඩුවම් දීම පිළිබඳ සම්මුති පණතට අනුව අධි-චෝදනා පත්‍ර තිස් දෙනෙකුට එරෙහිව අධිකරණය වෙත ගොනු කරන ලද නමුත් වැරදිකරුවන් වුයේ තිදෙනෙක් පමණි. අවසාන නඩු තීන්දුව ප්‍රකාශයට පත් වුයේ 2007 වන අතර 2008 ජුනි වන විට තිස් දෙනෙකු සියළු චෝදනා වලින් නිදහස් කරනු ලැබිණ.(වැඩි විස්තර සඳහා බලන්නඃ

ක්‍රිෂාලි පින්ටෝ- ජයවර්ධනඃ *Study on Prevalence, Determinants and Causes of Torture and forms of Cruel,Inhuman or Degrading Treatment or Punishment [CIDTP] in Sri lanka,* published by Rehabilitation and Ressearch Centre for Torture Victims [RCT] Denmark 2009 )

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් අධ්‍යනයන් ට අනුව සිවිල් වැසියන් ඝාතනය කිරිම සම්බන්ධයෙන් ආරක්ෂක හමුදවන්ට එරෙහිව නඩු පවරා ඇත්තේ අවස්ථා දෙකක දි පමණි. ඉන් පළමුවැන්න ජනමාධ්‍ය විසින් මහත් ප්‍රසිධියක් ලබා දුන් ක්‍රිෂාන්ති කුමාරස්වාමි ඇතුළු ඇය ගේ පවුලේ සාමාජිකයින් හා යෙහෙළියක් ඝාතනය කිරිම පිළිබඳ නඩුවයි.

(ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් වහා ක්‍රියා කරන්න ප්‍රකාශන ASA 222/96 1996 සැප්තැම්බර් 20 ) දෙවැන්න පළමු නඩුව තරම් ප්‍රසිද්ධියක් නොලැබූ යාපනයේ ද්‍රවිඩ කාන්තාවක් වූ විසි දෙහැවිරිදි වල්ලායුදන් පිල්ලෙයි රාජිනි දූෂණය කොට ඝාතනය කිරිම සම්බන්ධ නඩු විභාගයයි. 2011 මාර්තු මාසයේ දි මෙම නඩු විභාගයේ තීන්දුව ප්‍රකාශයට පත් කළ අතර විත්තිකරුවන් වූ සොල්දදුවන් තිදෙනාට මරණිය දණ්ඩනය නියම කරන ලදි. මෙම තීන්දුවට එරෙහි ව ඔවුන් ඇපැලක් ගොනු කිරිමට නියමිතය.

දශක ගණනාවක් තිස්සේ වරදින් නිදෙස් කිරිම පවත්වා ගෙන යන අතර, අණ දෙන නිලධාරින් දඩුවම් ලැබිමෙන් ද නිදහස් වි සිටිති. උදහරණයක් වශයෙන් 1988 දි ඝාතනය කළ නිතිඥ විජයදස ලියනාරච්චි ඝාතනයේ විත්තිකරුවන්ට කුමන්ත්‍රණය කිරිම හා බලහත්කාරයෙන් රඳවා තබා ගැනිම සම්බන්ධයෙන් 1991 දි ප්‍රකාශයට පත් කළ තීන්දුව මගින් ලබා දි තිබුනේ අත්හිටවූ සිර දඩුවම් පමණි. 1995 පත් කළ බටලන්ද කොමිෂන් සභාවේ දි යලිත් මෙම සිද්ධිය මතු වූ අතර බටලන්දෙහි පිහිටුවා තිබූ රහස්‍ය ස්ථානයක දි නිතිඥ විජයදස ලියනාරච්චිට කෲර ලෙස වධ හිංසා පමුණුවන ලද බව හෙළිදරව් වූ නමුත් බටලන්ද කොමිෂන් සභාව විසින් එම සිද්ධිය සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගත්තේය.

1989 හා 1990 දි ඇඹිලිපිටියේ දි පාසැල් සිසුන් විසි පස් දෙනෙකු ඝාතනය කිරිම සම්බන්ධ නඩුවේ ද කුමන්ත්‍රණය කිරිම, සාවද්‍ය මනුෂ්‍ය ඝාතනයක් සඳහා බලහත්කාරයෙන් පැහැර ගෙන යාම සහ රඳවා තබා ගැනිම යන චෝදනා සඳහා වසර 10 ක සිර දඩුවම් නියම කරන ලද අතර, අධියාචනයෙන් පසුව හමුද සෙබළුන් සතර දෙනා සහ මධ්‍ය මහා විද්‍යාලයේ මුල් ගුරුවරයාට තවදුරටත් දඩුවම් නියම කරන ලද නමුත් යුද්ධ හමුදවේ උසස් නිලධාරියෙක් වූ බ්‍රිගේඩියර් ලියනගේ ට විරුද්ධ චෝදනා ඔප්පු කිරිමට තරම් සාක්ෂි නැති බව ප්‍රකාශ කරමින් ඔහු නිදහස් කරන ලදි.

---

[19] ඇම්නස්ටි ඉන්ටර්නැෂනල්- විසි වසරක මායාවඃ ශ්‍රී ලංකාවේ පරික්ෂණ කොමිෂන් සභා (Index: ASA 37/005/2009)

2011 පෙබරවාරි මස එක්සත් ජාතීන් ගේ විද්වත් මණ්ඩලය ඉදිරියේ දි හා ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් විසින් සංවිධානය කරන ලද ප්‍රසිධ රැස්වීමක දි මෙන් ම 2011 ජුනි මස 3 වන දින එක්සත් ජාතීන ගේ රැස්වීමක දිද, උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් පුද්ගලයින්ට හා කණ්ඩායම් වලට එරෙහිව තවදුරටත් විමර්ශනය කිරීමට සුදුසු පැමිණිලි හදුනා ගනු ඇතැයි ද, එම සිද්ධීන් ඇටෝර්නි ජනරාල් වරයා වෙත යොමු කරනු ඇතැයි ද ප්‍රකාශ කළ අතර ඒ සමගම පරික්ෂණ කොමිෂන් සභා සැසිවාරයන් හි දි තවදුරටත් විමර්ශනය කළ යුතු සිද්ධීන් කිසිවක් අනාවරණය නොවු බවත් කියා සිටියේය. නමුත් සැසිවාර වාර්තා අධ්‍යයන කරන කළ මෙම ප්‍රකාශය අසත්‍ය වේ.
අන්තර් ජාතික නීතිය යටතේ පසුගිය යුද්ධයේ දි සිදු කරන ලද අපරාධ විමර්ශනය කිරිම හා අධිචෝදනා ඉදිරිපත් කිරිම පිණිස පිහිටුවා ඇති ආයතනයන් විසින් ප්‍රදර්ශනය කර ඇති මන්දෝස්සාහි බව හා උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ අධිකාරියට අපරාධ චෝදනා ඉදිරිපත් කිරිමේ බලයක් පවරා නොතිබිමෙන් පමණක් නොව මේ දක්වා සිදුකර ඇති විමර්ශනයන් හි දුර්වලත්වය ද නිසා මෙම පරික්ෂණ කොමිෂන් සභාව ද සත්‍යානුවේෂණය, යුක්තිය හා හානිපුරණය වින්දිතයින් ට ලබා දිමට අසමත් යාන්ත්‍රණයක් බවට පත් වි තිබේ.

## කොමිෂන් සභාවේ ස්වාධීනත්වය පිළිබඳ ඌනතාවයඃ

රාජ්‍ය පක්ෂපාතීත්වය, උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ අනන්‍ය ලක්ෂණයක් වුයේ හේතුන් කිහිපයක් නිසාය. එක් අතකින් මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ වගවීම් සොයා බැලිමට නොහැකි තරමට එහි අධිකාරිය පටු වුයේය. විශේෂයෙන් ම රජයේ හමුද විසින් සිදු කරන ලද මානව හිමිකම් උල්ලංඝණය වසන් කිරිමට ඉදිරිපත් වු රාජ්‍ය නිලධාරින් ම මෙම කොමිෂන් සභාවට පත් කිරිම මෙන් ද මෙම කොමිෂන් සභාවේ පිළි ගැනිමට කැළලක් ඇති කරනු ලැබින.

උදහරණයක් වශයෙන් කොමිෂන් සභාවේ සභාපති වරයා වු සි. ආර්.සි. ද සිල්වා ඉතා වැදගත් මානව හිමිකම් නඩු දෙකක් වු ත්‍රිමලයේ පංච පුද්ගල මිනිමැරුම් නඩුව හා මුතුර් හි සහන සේවකයින් 17 දෙනා ඝාතනය කිරිම පිළිබඳ නඩු විභාගයන් හි දි එම නඩුකරණයන් පවත්වා ගෙන යාමට නොහැකි වන ආකාරයට ඊට බාධා කිරිම කරනු ලැබු තැනැත්තෙකි. මෙම සමුහ මිනිමැරුම් දෙක ඇතුළු මානව හිමිකම් උල්ලංඝණයන් 16 විභාග කිරිමට 2006 හිටි අඩියේ ජනාධිපති කොමිෂන් සභාවක් පත් කළ නමුත් එහි වාර්තාව කිසි කළකත් ප්‍රසිධ කිරිමක් හෝ නඩු පැවරිමක් නොකළේය. කොමිෂන් සභාවේ සාමාජිකයින් විසින් සි ආර් සි ද සිල්වා ගේ දෙබිඩි උවමනාවන් විවේචනය කළ අතර එම හැසිරිම කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට හා පළදයි බවට හානියක් යැයි ද ප්‍රකාශ කෙළේය.[20]

[20] 2006 කොමිෂන් සභාව සම්බන්ධයෙන් නීතිපතිවරයා ගේ භුමිකාව සඳහා කියවන්නඃ ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් විසි වසරක මායාවඃ ශ්‍රී ලංකාවේ පරික්ෂණ කොමිෂන් සභා (Index: ASA 37/005/2009)

එපමණක් නොව ඇත්ත වශයෙන් ම යුද්ධය පැවතුනේත්, වින්දිතයින් ට බවට පත් වුයේත් ප්‍රධාන වශයෙන්ම ද්‍රවිඩ හා මුස්ලිම් ජනතාව වුවත්; මෙම අටපුද්ගල කොමිෂන් සභාවේ සාමාජිකයින් බහුතරයක් (පස් දෙනෙක් ) සිංහළ පුරුෂයින් වන බවට වග බලා ගෙන තිබුනි. එමෙන් ම සාමාජිකයින් වැඩි දෙනෙක් ආණ්ඩුවේ ඉහළ තානාන්තර දූරු පුද්ගලයෝ ද වුහ. සභාපති සි ආර් සි ද සිල්වා හිටපු නීතිපති හා සෝලිසිටර් ජනරාල් වරයාය. ජනාධිපති නිතිඥ ආචාර්ය රෝහාන් පෙරේරා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ නිතී උපදේශක වරයාය. මහාචාර්ය කරුනාරත්න හඟවත්ත අධිකරණ අමාත්‍යංශයේ හිටපු සහකාර ලේකම් වරයාය. එච් එම් ජී එස් පලිහක්කාර එක්සත් ජාතීන් ගේ සංවිධානයේ හිටපු නිත්‍ය නියෝජිතවරයා වන අතර මැක්ස්වෙල් පරණගම මහාධිකරණ විනිශ්චයකාරවරයෙකි.

පරික්ෂණ කොමිෂන් සභා පිළිබඳ එක්සත් ජාතීන් ගේ මුලධර්ම ප්‍රකාශනයේ 7 වන මුලධර්මයට අනුව ' පරික්ෂණ කොමිෂන් ' සභාවල සාමාජිකයින් පත් කිරිමේ දි මානව හිමිකම් අහිමිවිමකට ගොදුරු විය හැකි ජන කොටස් හා කාන්තාවන් නියෝජනය වන පරිදි පත් කළ යුතුය යනුවෙන් සඳහන් කරයි.

පරික්ෂණ කොමිෂන් සභා පිළිබඳ මුලධර්මයන් හි 7 (ඒ) වගන්තිය තවදුරටත්

'යම්කිසි පරික්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවිමේ දි එහි සාමාජිකයින් ගේ නිපුණත්වය හා අපක්ෂපාතිභාවය මිනුම් දණ්ඩක් වශයෙන් සැලකිය යුතු අතර විශේෂයෙන් ම මානව හිමිකම් පිළිබඳ මෙන් ම මානවීය නිතීය පිළිබඳ විශේෂඥයින් ද පත් කිරිමට සැලකිල්ලට ගත යුතුය.'යනුවෙන් සඳහන් කරයි.[21]

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ සාමාජිකයින් අතර එකම ද්‍රවිඩ ජාතිකයා වුයේ මහා භාණ්ඩාගාරයේ හිටපු ලේකම් හා මුදල් කොමිෂමේ සාමාජික සි චන්මුගම්ය. එකම කාන්තාව වුයේ මනෝහාරි රාමනාදන් වු අතර ඇය අධිකරණ අමාත්‍යංශයේ නීති කෙටුම්පත් දෙපාර්තුමෙන්තුවේ නියෝජ්‍ය නීති කෙටුම්පත් නිලධාරිනිය වුවාය. මෙම කොමිෂන් සභාවේ එකම මුස්ලිම් ජාතික නියෝජිතයා වුයේ වෘත්තීය නිතිඥවරයෙකු වු තාහිර් මොහොමඩ් ජිෆ්රිය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ හිටපු සාමාජිකයෙක් වු ඔහු මෙම කන්ඩායමේ මානව හිමිකම් පිළිබඳ ප්‍රවිණත්වයක් සහිත එකම තැනැත්තා වුයේය.

සැසිවාරයන් පැවැත්විමට පෙර හා පසුව සාමාජිකයින් ගේ අදහස් දැක්විම මගික් මෙම කොමිෂන් සභාව මධ්‍යස්ථ හා ස්වාධීන කොමිෂන් සභාව කි යන්න මිත්‍යාවක් බවට පත් කළේය. සිය සැසිවාරයන් හි දි ඔවුහු යුද්ධය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග ආරක්ෂා කළ අතර එල්.ටි.ටි.ඊ සංවිධානයේ වධහිංසා පැමිණ විම් පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ බව පෙනින.

[21]යාවත්කාලීන කරන ලද 'වරදින් නිදෙස් කිරිම මැඩිම පිණිස මානව හිමිකම් ආරක්ෂාව හා ප්‍රවර්ධනය මගින් ක්‍රියාකිරිම' පිළිබඳ ප්‍රකාශනයː United Nations, E/CN.4/2005/102/Add.1, 8 February 2005
http://daccess-dds-ny.un.org/doc/UNDOC/GEN/G05/109/00/PDF/G0510900.pdf?OpenElement

එම හේතුවෙන් රජයේ හමුද විසින් මානවීය නිතීය උල්ලංඝණය කිරිම පිළිබඳ වැදගත් ප්‍රශ්නය යටපත් කෙරිණ.[22]

එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මහ ලේකම්වරයා ගේ විද්වත් කමිටුව මේ හා සමාන ම විවේචනාත්මක අවධානයක් මෙම කොමිෂන් සභාව තුළ සි. ආර්. සි. ද සිල්වා ගේ භූමිකාව සම්බන්ධයෙන් යොමු කළේය. තවදුරටත් විද්වත් කමිටුව මෙසේ ද ප්‍රකාශ කරන ලදි.

'අන්තර් ජාතික නීතියට අනුව මානවීය හා මානව හිමිකම් නීතිය පිළිබඳ උල්ලංඝණයන් විමර්ශනය පිණිස පිහිටුවන ඕනෑම ආයතනයක් අනිවාර්යෙන් ම ස්වාධීන, අපක්ෂපාතී හා ප්‍රවීන කණ්ඩායමක් විය යුතුය. මෙහි දී විශේෂයෙන් ම ස්වාධීනත්වය යනුවෙන් කවර ආකාරයක හෝ පාලනයකින් තොර විම මෙන් ම මහජනයා එබඳු ආකාරයේ ස්වාධීනත්වයක් එකි පරික්ෂණ ආයතනය සතු බවට සෑහිමකට පත් විම ද අවශ්‍යය.'

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව ගත් කළ, සාමාජිකයින් තිදෙනෙකුට කොමිෂන් සභාවේ අරමුණු හා ගැටෙන සිය පෞද්ගලික අධිමතාර්ථ නිසා තමන්ට ස්වාධීනව හා අපක්ෂපාතව කටයුතු කිරිමට තිබෙන ඉඩ ප්‍රස්ථාවන් අහිමි කරගත් අතර මහජනයා තුල ද ඔවුහු ස්වාධීන හා අපක්ෂපාත යැයි පිළි ගැනිමක් ඇති නොවිය. ඉතා පැහැදිලිවම මේ චෝදනාවට ලක් වන එක් තැනැත්තෙක් එහි සභාපතිවරයාය. අනෙක් තැනැත්තා එක්සත් ජාතීන් ගේ සංවිධානයේ නිත්‍ය ශ්‍රී ලාංකික නියෝජිතයා යුද්ධය පැවති අවස්ථාවේ රජය නියෝජනය කරමින් රජයේ මානුෂික මෙහෙයුම වෙනුවෙන් පෙනි සිටියේය. තෙවැන්නා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ජාත්‍යන්තර නීති උපදේශකවරයා වශයෙන් කටයුතු කරමින් ම මෙම කොමිෂන් සභාවේ ද සේවය කළේය.

ඔවුන් ගේ අනෙක් සුදුසුකම් කවරෙක් වුවත්, මෙබඳු ප්‍රතිවිරුද්ධ අභිලාෂයන් සහිත තැනැත්තන් ජාත්‍යයන්තර නීතිය විසින් ස්වාධීන හා අපක්ෂපාති ලෙස විමර්ශනය කළ යුතු යැයි පිළි ගැනෙන විෂයක් සම්බන්ධ කොමිෂන් සභාවක ට පත් කිරිම නොසුදුසුය. කවර ආකාරයකින් බැලුවත් ජනාධිපතිවරයා විසින් ම රජයේ ඉහළම තනතුරුවලට පත් කළ මෙබඳු තැනැත්තන් ගෙන් රජයේ ක්‍රියාදාමය පිළිබඳ විශේෂයෙන් ම මානව හා මානවීය නීතිය උල්ලංඝණනය කිරිම පිළිබඳ ස්වාධීන හා අපක්ෂපාත තක්සේරුවක් අපේක්ෂා කළ නොහැක.[23]

## මිරිගුවක් වූ වගවීම:

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව වගවිමේ යාන්ත්‍රණයක් වශයෙන් අසාර්ථක වන්නේ එම කොමිෂන් සභාව පිහිටුවිම සංකල්ප ගත කිරිමේ දිම දක්නට ලැබුන ඌනතාවය නිසාය. 'අතීතයේ සිදු වූ සියල්ල ඉතිහාසයට බාර දෙන්න' යන්න රජයේ ස්ථාවරය බව කිහිප අවස්ථාවක දිම බැන්

[22] නිදර්ශනයක් පිණිස පහත දක්වන වෛද්‍ය වර්ධරාජා මහතා ගේ සාක්ෂිය බලන්න http://www.llrc.lk/images/stories/LLRC_30.11 - Dr. T.Vartharajah.pdf

[23] නිදර්ශනයක් වශයෙන් බලන්නඃ සිරිපාල පලිහක්කාර මහතා විසින් පවත්වන ලද මහාචාර්ය ජේ ඊ ජයසූරිය ගුණානුස්මරණ දේශනයඃපශ්චාත් යුද්ධ පසුබිම තුළ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියඃ මැයෙන් වෘත්තිකයෙක් වශයෙන් කථා කරමින් කොමිෂන් සභාවේ සාමාජිකයෙක් වූ සිරිපාල පලිහක්කාර මහතා 'ආරක්ෂක හමුද විසින් සිවිල් හානි හා වෙනත් අතිරේක හානි සිදුවිම වැළැක්විම පිණිස මානවීය ආරක්ෂණ පියවරයන් ගත් බව' කියා සිටියේය. තවද, අපේ හමුද භටයින් හා දේශපාලන නායකත්වය සැපයූ ජනාධිපතිවරයා ශ්‍රී ලංකාවේ ස්වාධිපත්‍යයට හා ඒකාග්‍රතාවයට තිබූ තර්ජන වලින් මේ රට මුදවා ගෙන නිර්භිත හමුද භටයින් විසින් යළි ස්ථාපිත කරන ලද' බවත් කියා සිටියේය. ඔහු තවදුරටත් ශ්‍රී ලංකාවේ නිවාරණ රාජ්‍ය තාන්ත්‍රික උපාය මාර්ග නිසා එක්සත් ජාතීන් ගේ ආරක්ෂක මණ්ඩලය තුළ කිසිම කඳවුරකට නොබැඳි සිටිමින් 2009 එල් ටි ටි ඊ විරෝධි ක්‍රියාන්විතයට විදේශ රටක මැදිහත් විම වළක්වා ගැනිමට අපට පුළුවන් වූ බවට උදන් ඇනීය. විද්වත් කමිටු වාර්තාව 85 පිටුව

කිං මුන් ගේ විද්වත් කමිටුවට ප්‍රකාශ කොට තිබේ. ඒ අනුව උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව කිසිම අවස්ථාවක රජයේ හමුදාවන් හි පෞද්ගලික වගවීම් පිළිබඳ අවධානය යොමු නොකරන ලද අතර ඒ වෙනුවට පුරවැසියන් ආරක්ෂා කිරීමේ දේශපාලන වගකීම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ඇත.[24]

2011 පෙබරවාරි මස එක්සත් ජාතීන් ගේ විද්වත් මණ්ඩලය ඉදිරියේ දී ශ්‍රී ලංකාවේ නීතිපතිවරයා උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව විසින් පුද්ගලයින්ට හා කණ්ඩායම් වලට එරෙහිව තවදුරටත් විමර්ශනය කිරීමට සුදුසු පැමිණිලි හඳුනා ගනු ඇතැයි ද, එම සිද්ධීන් නීතිපති වරයා වෙත යොමු කරනු ඇතැයි ද ප්‍රකාශ කළ අතර ඒ සමගම පරීක්ෂණ කොමිෂන් සභා සැසිවාරයන් හි දී තවදුරටත් විමර්ශනය කළ යුතු සිද්ධීන් කිසිවක් අනාවරණය නොවූ බවත් කියා සිටියේය.[25] නමුත් සැසිවාර වාර්තා අධ්‍යයන කරන කළ මෙම ප්‍රකාශය අසත්‍ය වේ. උදාහරණයක් වශයෙන්:

- **සාක්ෂි අංක 6-** නැගෙනහිර පළාතේ වෙල්ලන්කන්ඩි හි එරාවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කාර්යාලයේ පැවැති සැසිවාරයේ දී කාන්තාවක් සාක්ෂි දෙමින් මෙසේ කියා සිටියාය. 'තම සැමියා 2009 මැයි මස 23 දින යුද්ධ හමුදාව විසින් අත් අඩංගුවට ගෙන මොරකටාන යුද්ධ හමුදා කඳවුරේ රඳවා තබනු ලැබුවේය. ඔහු නිදහස් කර ගැනීම පිණිස 2010 ඔක්තොබර් 11 වන දින ඇය සිය නිවස උකස් කොට රුපියල් 150,000 ක් ලබා ගෙන මොරකටාන යුද්ධ හමුදා කඳවුර හා සම්බන්ධකම් පැවැත්වූ තැනැත්තෙකුට සිය සැමියා නිදහස් කර ගැනීම පිණිස එම මුදල ලබා දෙන ලදී. මෙම සාක්ෂිකාරිය මුදල් ලබා ගත් අතර මැදියා (දැනට ජීවතුන් අතර නැත) ගේ සහ එකී කප්පම් රැගෙන සිය සැමියා නිදහස් කිරීමට පොරොන්දු අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් දෙදෙනා ගේ නම් ද සිය සාක්ෂියේ දී සඳහන් කළේය.[26]
- **සාක්ෂි අංක 8**- මඩකලපු දිස්ත්‍රික්කයෙන් පැමිණි තවත් සාක්ෂිකාරියක් මඩාපල්ලම් හි පිහිටුවා තිබූ එස් ටී එෆ් කඳවුරෙහි නිලධාරියෙක් විසින් 2009 පෙබරවාරි 19 දින කුඹුරක වැඩ කරමින් සිටිය දී සිය සැමියා බලහත්කාරයෙන් පැහැර ගෙන ගොස් ඝාතනය කළ බව තමාට ප්‍රකාශ කළ බවට සාක්ෂියක් ඉදිරිපත් කළේය.[27]

  උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව ඉදිරියේ මෙබඳු තොරතුරු අනාවරණය වුවත් එම කොමිෂන් සභාව තවදුරටත් මීට සමාන තොරතුරු එක්රැස් කිරීමට හෝ විශේෂයෙන් ම රජයේ පාර්ශවයෙන් සිදු කරන ලද මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ රජයේ වගවීම ස්ථාපිත කිරීමට අසමත් වුයේය.

[24] විද්වත් කමිටු වාර්තාව ඡේද 279–80, 78 පිටුව

[25] විද්වත් කමිටු වාර්තාව ඡේද 281, 78 පිටුව

[26] සාක්ෂි අංක 6: සැසි වාර්තා:2010 ඔක්තෝබර් 10 ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඒරාවූර් වෙන්කල්ලඩි.
[27] සාක්ෂි අංක 8: සැසි වාර්තා:2010 ඔක්තෝබර් 9 දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය, මඩකලපුව.

## 2 උගත් පාඩම් හා සංහිඳියා සැසිවාරඃ

## වගවීම විමර්ශනයට තිබු අවස්ථාවන් ගිලිහි ගිය සැටි

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂමේ සැසිවාර ඉතා පුළුල් අර්ථයකින් ගත් කළ යුක්තිය හා වගවීම පිණිස අවශ්‍ය සාක්ෂි අනාවරණය කර ගැනිමට තිබු කදිම ඉඩප්‍රස්ථාවක් ගිලිහි යාමක් බවට පත් වීම කණස්සල්ලට කාරණයකි.

සාක්ෂිකරුවන්ට හා ඔවුන් ගේ සාක්ෂිවලට කොමසාරිස්වරුන් විසින් දක්වන ලද කෙටි ප්‍රතිචාර හා අනවධානය මගින් සාක්ෂිකරුවන් මන්දොත්සාහි කරවන ලද්දේය. රජයේ නිලධාරීන් ගෙන් ජාතික ආරක්ෂක හමුද විසින් සිදු කරන ලද අපරාධ චෝදනා සම්බන්ධයෙන් කිසිදු අභියෝගාත්මක ප්‍රශ්න විචාරයක් සිදු නොවිය. යුධ කලාපයෙන් පැමිණි සාක්ෂිකරුවන් විමසිමේ දි යුද්ධයට සම්බන්ධවි සිටි දෙපාර්ශවය විසින් ම සිදු කරන ලද වධ හිංසා, බලහත්කාර අතුරුදහන් කිරිම් වැනි කාරණා සම්බන්ධයෙන් අපරාධකරුවන් හඳුනා ගැනිමට කොමසාරිස්වරු කිසිදු උනන්දුවක් නොදක් වුහ. තවද කොමසාරිස්වරු සාක්ෂිකරුවන් විසින් ඉදිරිපත් කරන ලද චෝදනා විමර්ශනයන් කිරිමට අසමත් වුවා පමණක් නොව තම පවුල් වල සාමාජිකයින් අතුරුදහන් විම වැනි මානසික පිඩනයට ලක් වු සාක්ෂිකරුවන් සමග ගණුදෙනු කිරිමේ දි ඔවුන් කෙරෙහි ඉතාමත් අනවධානයෙන් හැසිරුන බව ද ප්‍රදර්ශනය කළේය. සමස්තයක් වශයෙන් ගත් කළ සැසිවාරයන් හි දි ඉදිරිපත් කළ සාක්ෂි සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් සාක්ෂිකරුවන් ඉතාමත් ලඝුවෙන් කළ බව පෙනින.

### සාක්ෂිකරුවන් විසින් අනාවරණය කළ බරපතළ මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ නිසි ක්‍රියා මාර්ග ගැනිමට අසමත් විමඃ

කොළඹින් පිට ප්‍රථම සැසිවාරය පවත්වන ලද්දේ 2010 අගෝස්තු 14හා 15 යන දින වල වවුනියාවේ දීය. එතැන් පටන් සෑම සැසිවාරයක දිම එල් ටි ටි ඊ සංවිධානය හා රජයේ හමුද විසින් සිදු කරන ලද බරපතළ මානව හිමිකම් හා මානවීය නීතිය උල්ලංඝණය කිරිම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කරන ලදි. එහෙත් 2010 සැප්තැම්බර් 13 දින ඉදිරිපත් කරන ලද උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ අතුරු වාර්තාව විසින් මෙම චෝදනා සම්බන්ධයෙන් කිසිදු සඳහනක් ඇතුලත් නොවුවා පමණක් නොව වගවීම පිළිබඳ කාරණය ඉදිරියට ගෙන ඒමක් ද දක්නට නොවිය. මේ සියල්ල පසෙක ලා කොමිෂන් සභාව විසින් සාක්ෂිකරුවන් විසින් මුල් සැසිවාර වලදි පෙන්වා දෙන ලද දිර්ඝ කාලයක් තිස්සේ නොවිසඳ තිබු ගැටළු කෙරෙහි අවධානය යොමු කරන ලදි.

පහත දක්වනු ලබන්නේ උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිකරුවන් විසින් ඉදිරිපත් කරනු සාක්ෂි සටහන් ආශ්‍රයෙන් එම කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සංක්ෂිප්ත විශ්ලේෂණයකි.[28]

## සාක්ෂිකරුවන් විසින් වාර්තා කරන ලද මානව හිමිකම් උල්ලංඝණයන් සමහරක්:

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් ඇතුළු පුද්ගලයන් ආගිය අතක් නොමැති වීම; අත් අඩංගුවේ තබා ගැනීම හා යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ ආර්ථික අපහසුතා උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව ඉදිරියට පැමිණි සාක්ෂිකරුවන් වැඩි දෙනෙකු ගේ සාක්ෂිවල පදනම විය. බොහෝ සාක්ෂිකරුවන් ට එක් පැමිණිල්ලකට වඩා තිබුනි. මෙම කොමිෂන් සභාව ඉදිරියට පැමිණි සාක්ෂිකරුවන් විවිධ ආයුධ සන්නද්ධ කණ්ඩායම් හා රජයේ හමුද විසින් සිදු කරන ලද මානව හිමිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළත් ආරම්භයේ සිටම කොමිෂන් සභා සාමාජිකයෝ වැඩි අවධානයක් යොමු කරන ලද්දේ ආර්ථික අපහසුතාවයන් පිළිබඳව සාක්ෂි දීම පිණිස ඔවුන් පෙළඹවීමටය. අවසනාවකට මෙන් කොමිෂන් සභාව මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ සාක්ෂිකරුවන් ගෙන් වැඩිදුරටත් ප්‍රශ්න කිරීමට උනන්දුවක් නොදක්වීම නිසා බරපතළ අපරාධ ගණයේ ලා සැලකිය හැකි මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව වැඩිදුර විමර්ශනයකට අත්තිවාරමක් දමා ගැනීමට අපොහොසත් වුහ.

සාක්ෂිකරුවන් බොහෝ දෙනෙක් අත් අඩංගුවට ගැනීම්, පවුල් සාමාජිකයන් පැහැර ගෙන යාම් හා බලහත්කාර අතුරුදහන් කිරීම් සහ මනුෂ්‍ය ඝාතන සම්බන්ධයෙන් රජයේ හමුද විශේෂයෙන් යුද්ධ හමුදව හා පොලිසිය (විශේෂයෙන් ම විශේෂ කාර්ය බලකාය) මෙන් ම ආයුධ සන්නද්ධ දේශපාලන කණ්ඩායම් ( කරුණා කන්ඩායම[29] හා ඊ පි ඩි ප[30] මේ අතර කැපි පෙනුනි) වෙත චෝදනා කළේය.

- යාපනයේ අරියාලේ සිට පැමිණ සාක්ෂි දුන් කාන්තාවක් 2007 ජනවාරි මාසයේ දි ශ්‍රී ලංකා යුද්ධ හමුද නිලධාරීන් විසින් සිය පුතා අත්අඩංගුවට ගත් බවත් පසුව ඔහු අතුරුදහන් වු බවත් කියා සිටියේය. මෙම සිද්ධියට සිය ලේලිය හා ඇය ගේ දරුවන් තිදෙනා සාක්ෂි දරති ඇය තවදුරටත් කීවාය. 2009 ජුනි මාසයේ දි ගම්මුන්

[28] කොමිෂන් සභා වෙබ් අඩවියේ දක්වා තිබෙන පුද්ගල හා ස්ථාන නාමයන් ලිවීමේ දි ලියන රටාව මෙන් ම අක්ෂර ව්‍යනාස දෝෂ බහුලව දක්නට ලැබේ. මේ තත්වය අවම කර ගැනීම පිණිස පුද්ගල නාම හා සාක්ෂි සටහන් අවම උපමානයක් යටතට ගෙන එන ලදි. ස්ථාන නාමයන් ගේ කිසිදු වෙනසක් සිදු නොකළෙමු.
.

[29] හිටපු එල් ටි ටි ඊ නායකයෙක් හා ටි එම් වි පි පක්ෂයේ ආරම්භකයා ද වන නියෝජ්‍ය අමාත්‍ය විනයාගමූර්ති මුරලිදරන් හෙවත් කරුණා අම්මාන් ආණ්ඩුවේ ප්‍රබල ආධාරකරුවෙකි.

[30] ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදි පක්ෂය වනාහි ආණ්ඩුව සමග සන්ධාන ගත වි ඇති දවිඩ දේශපාලන පක්ෂයකි.

කිහිපදෙනෙක් ම සිය පුතා ඕරාළු යුද්ධ හමුද කඳවුරේ සිටිනවා දුටු බව ඇයට කියා ඇත.[31]

- මඩුහි දි සාක්ෂි දුන් තවත් කාන්තාවක් සිය නිවසේ සිටි සැමියා 2008 දි පාන්දර 1 ට පමණ තමන් අවුරුදු දහයක් පමණ හොඳින් දන්නා රහස් පොලිසියට ඔත්තු සපයන තැනැත්තෙකු පැමිණ පැහැර ගෙන ගිය බව කියා සිටියාය.[32]
- වෙල්ලනායි හි සිට පැමිණ සාක්ෂි දුන් තවත් සාක්ෂිකාරියක් සිය පවුලේ සාමාජිකයින් නාවික හමුද විසින් පවත්වා ගෙන ගිය මුර පොලකදි අතුරුදහන් වු බවත් මීට නාවික හමුදව වගකිව යුතු බවත් කියා සිටියාය.[33]මන්නාරමේ දි සාක්ෂි දුන් තවත් කාන්තාවක් සිය 23 හැවිරිදි පුතා අතුරුදහන් විම සම්බන්ධයෙන් නාවික හමුදවට චෝදනා කළේය.
- මඩකලපුවේ ඒරාවුර් හි සාක්ෂි දුන් තවත් සාක්ෂිකාරියක් එල් ටි ටි ඊ සාමාජිකයෙක් වු සිය පුතා කිරාන් හි පිහිටි ටිවිඑම් පි කාර්යාලයට[34] අනුයුක්ත පිරිසක් විසින් පැහැර ගෙන ගිය බව කියා සිටියාය.[35]
- මඩකලපුවේ ඒරාවුර් හි සාක්ෂි දුන් තවත් සාක්ෂිකාරියක් විදේශ රැකියාවකට යාමට සුදනමින් සිටි සිය දියණිය ඇතුළු පවුලේ සාමාජිකයින් පස් දෙනෙක් පැහැර ටිවිඑම්පි පක්ෂයේ සාමාජිකයින් විසින් 2007 දි පැහැර ගෙන ගිය බවත් , මේ පිළිබඳව ඒරාවුර් පොලිසියට පැමිණිලි කළ බවත් ඒ නිසා ටිවිඑම්පි සාමාජිකයින් සිය නිවස පුපුරවා හරින බවට තර්ජනය කළ බවත් කියා සිටියාය.[36]

  සාක්ෂිකරුවන් විසින් එල් ටි ටි ඊ ය ද සිය පවුල් සාමාජිකයින් බලහත්කාරයෙන් බඳවා ගත් අතර ඔවුහු පසුව එක්කෝ ආගිය අතක් නොමැති අය බවට හෝ බලධාරින් ගේ අත්අඩංගුවට පත්විම සිදුවිය.

  - මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවියෙක් සාක්ෂි දෙමින් සිය පවුල පොක්කානි වල අවතැන්ව සිටිය දි එල් ටි ටි ඊ ය විසින් සිය දියණිය පැහැර ගත් බවත් වෙඩි වැදි අසාධ්‍යව රෝහල් ගත ව සිටි ඇය පසුව යුද්ධ හමුදව භාරයේ සිටිනු දුටු අය සිටින බවත් කියා සිටියේය.[37]

---

[31] සාක්ෂි අංක 2, යාපනය දිස්ත්‍රික්ක ලේනම් කාර්යාලය 2010 නොවැම්බර් 11

[32] සාක්ෂි අංක 7, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඩු 2011 ජනවාරි 9

[33] සාක්ෂි අංක 2 හා 3, වෙල්ලානෙයි 2010 නොවැම්බර් 14

[34] විනයාගර්මුර්ති මුරලිදරන් විසින් පිහිටුවන ලද ද්‍රවිඩ ජනතා විමුක්ති කොටි හෙවත් ටි වි එම් පි පක්ෂය එල් ටි ටි ඊ සංවිධානයෙන් කැඩී වෙන් වු කණ්ඩායමක් වන අතර වර්තමාන නායකත්වය නැගෙනහිර පළාත් සභා මහාමාත්‍ය හිටපු එල් ටි ටි ඊ සාමජිකයෙක් වන එස් චන්ද්‍රකාන්තන් විසින් දරයි.

[35] සාක්ෂි අංක 16ඃ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයඃ ඒරාවුර් පත්තුව වෙන්කල්ලඩි 2010 ඔක්තෝබර් 10

[36] සාක්ෂි අංත 19-ප්‍රාදේශීය ලේකම් කාර්යාලයඃඒරාවුර් පත්තුව වෙන්කල්ලඩි 2010 ඔක්තෝබර් 10

[37] සාක්ෂි අංත 02-දිස්ත්‍රික් ලේකම් කාර්යාලයඃ මුලතිව් 2010 සැප්තැම්බර් 20- LLRC/PS/20-09-10/01

- මඩකලපුවේ සාක්ෂි දුන් තවත් සාක්ෂිකාරියක් සිය පුතා 2006 වයස අවුරුදු 14 දි එල් ටි ටි ඊ ය විසින් පැහැර ගත් බවත් ඔවුන් සිය පුතා අවසාන වරට 2008 දි කිලිනොච්චි හිදි දුටු බවත් කියා සිටියේය.[38]
- කිලිනොච්චියේ දි සාක්ෂි දුන් තවත් කාන්තාවක් සිය පුතා 2008 ජුලි මස 4වන දින එල් ටි ටි ඊ ය විසින් බලහත්කාරයෙන් බඳවා ගත් බවත් පසුව හමුද භාරයට පත් වු ඔහු වැලිකන්ද යුද්ධ හමුද කඳවුරේ රඳවා සිටින බවත් කීවාය.[39]

  කොමිෂන් සභාව ඉදිරියට පැමිණි මායිම් ගම්මාන වල වාසය කළ වැසියන් යුද්ධය නිසා තමන් විසින් අත්විදින ලද දුක් ගැහට කියා සිටියෝය.

- බුත්තල දි සාක්ෂි දුන් එක් සාක්ෂිකරුවෙක් 2009 පෙබරවාරි 21 දින මුලියද්ද ගම්මානයේ සිදු වු කාල බෝම්බ ප්‍රහාරයකින් විපතට පත් වුවන් ට උපකාර කිරිමට ගොස් තමා බිම් බෝම්බයකට ගොදුරු වු බවත් රාජ්‍ය නොවන සංවිධානයකින් තමාට කෘතිම පාදයක් ලබා දුන් නමුත් රජය කිසිම උපකාරයක් නොකළ බව කියා සිටියේය.[40]
- සියඹලාන්ඩුවේ සාක්ෂිකරුවෙක් 1995 නොවැම්බර් මස එල් ටි ටි ඊ විසින් සිදු කරන ලද සමුහ ඝාතනයක් නිසා සිය පවුලේ සාමාජිකයින් මිය ගිය ආකාරය කියා සිටියේය.[41]
- යාපනයේ කයිට්ස් දිවයිනේ පැවති සාක්ෂි විභාගයේ දි කාන්තාවන් තිදෙනෙක් 2010 නොවැම්බර් මස 14 දින ෂෙල් වෙඩි ප්‍රහාර නිසා සිය සැමියන් මිය ගිය බව කියා සිටියාය.[42]
- ගුරුනගර් හි සාක්ෂි දුන් සාක්ෂිකරුවෙක් 1990 දි එල් ටි ටි ඊ ය විසින් තමන් යාපනය නගරයෙන් පිටමං කළ ආකාරය විස්තර කළේය.[43]
- මුලතිව් හා පදිංචි සාක්ෂිකාරියක් තමන් 1990 දි තන්නිරුට්ටු වෙත පැමිණ පැය විසිහතරක් ඇතුළත තමන් පිටමං කළ ආකාරය කියා සිටියාය.[44]

සැක කටයුතු මානව හිමිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් සැක කටයුතු අපරාධකරුවන් සම්බන්ධ වැදගත් සාක්ෂි සැපයු සාක්ෂිකරුවන් ගේ ආරක්ෂාව හා ආත්ම ගරුත්වය කෙරෙහි කොමසාරිස්වරුන් විසින් දක්වන ලද නොසැලිකිලිමත්භාවය මතභේදයකට තුඩු දෙන්නකි.

[38] සාක්ෂි අංක 12-දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලයඃ මඩකලපුව 2010 ඔක්තෝබර් 9

[39] සාක්ෂි අංක 13-දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලයඃ කිලිනොච්චිය 2010 සැප්තැම්බර් 10

[40] සාක්ෂි අංක 05-ප්‍රාදේශිය ලේකම් කාර්යාලයඃ බුත්තල 2011 මාර්තු 26

[41] ෂැසිවාර වාර්තා-ප්‍රාදේශීය ලේකම් කාර්යාලයඃ සියඹලාන්ඩුව 2011 මාර්තු 26

,

[42] සාක්ෂි අංක 5, 6 හා 7- ශාන්ත අන්තෝනි දේවස්ථානය 2010 නොවැම්බර් 14

[43] සාක්ෂි අංක 1-ගුරු නගර් සංස්කෘතික ශාලාව 2010 නොවැම්බර් 10

[44] සාක්ෂි අංක 10-දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලයඃ මුලතිව් 2010 සැප්තැම්බර් 20 , LLRC/PS/20-09-10/01

ඇතැම් අවස්ථාවලදී මෙම සාක්ෂිකරුවන් ගේ නම්ගම් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම එම සාක්ෂිකරුවන් පළිගැනීමට හා මහජන විවේචනයට ගොදුරු වීමට ඉඩ හරින ලදී. පැහැදිලිව ම මෙබඳු අවස්ථා වැළැක්වීම පිණිස ජාත්‍යන්තරව පිළිගත් සම්මතය වන්නේ නිසි ක්‍රියා මාර්ගයකින් තොර ව මෙබඳු සාක්ෂිකරුවන් ගේ නම් ගම් හෙළිදරව් නොකිරීමයි.

මේ සම්බන්ධයෙන් වැදගත් වන අනෙක් කාරණය නම් කොමිෂන් සභාව කිසිම අවස්ථාවක සාක්ෂිකරුවන් විසින් නම් කරන ලද සැකකරුවන් ගේ නම්ගම් හෙළිදරව් නොකිරීමයි.[45]

**මනුෂ්‍ය ඝාතනඃ**

මනුෂ්‍ය ඝාතන, උතුරු හා නැගෙනහිර පළාත් වල නීතිය හා සාමය බිඳ වැටීම නිසා පැතිරී ගිය ව්‍යසනය සංකේතවත් කරයි. යාපනයේ බොහෝ කාලයක් නීතිය හා සාමය බිඳ වැටී තිබූ අතර එකල ආරක්ෂක හමුද සහ ආරක්ෂ හමුදවන් සමග අත්වැල් බැඳ ගත් ආයුධ සන්නධ දේශපාලන කණ්ඩායම් විසින් ව්‍යාපාරිකයින් හා නිවැසියන් විවිධ හේතූන් මත බලහත්කාරයෙන් රැගෙන ගොස් සාවද්‍ය ලෙස ඝාතනය කරන ලද බවට සාක්ෂිකරුවන් විසින් චෝදනා ඉදිරිපත් කරන ලදී. ඇතැම් සාක්ෂිකරුවන් විසින් මිනිමැරුම් පිළිබඳ සාක්ෂි සපයන ලදී. මහා මාර්ග පසෙක එසේත් නැත්නම් ලඳු කැලෑවල හමු වූ මළ කඳන් පිළිබඳ ප්‍රවෘත්ති වසර ගණනාවක් තිස්සේ ම ද්‍රවිඩ ජන මාධ්‍යයන් හි ප්‍රධාන මාතෘකාවක් වී තිබුනේ මෙම පසුබිම තුලය.

**සාක්ෂි අංක 8- වෙල්ලනි 2010 නොවැම්බර් 8ඃ**[46]

**සාක්ෂිකාරියඃ** 2006 අගෝස්තු 19 දින මගේ සැමියා හා ඔහු ගේ සහෝදරයන් තිදෙනා රාත්‍රී මුහුදු යාමට සූදනම් වෙමින් සිටියා. එම අවස්ථාවේ මගේ සැමියා ගේ නම වන මැක්සි යනුවෙන් හඬ ගසමින් වසා තිබූ ඉදිරිපස දොර කඩා ගෙන යම්කිසි ආයුධ සන්නධ පිරිසක් ගෙට ඇතුල් වුනා. සිවිල් ඇඳුමෙන් සිටි ඔවුහු ඊ පි ඩි පි පක්ෂයට හා යුද්ධ හමුදවට අයත් අය බවට මම හඳුනා ගත්තා. ඔවුන් තුවක්කු බටය මගේ නළලට තබා කෑ මුර නොගසන ලෙසට තර්ජනය කරමින් කාමරයකට දමා වැසුවා.

**රාමනාදන් මහත්මියඃ (පරිවර්තක ට)** ඇගේ සැමියා ගේ නම කුමක්ද?[47]

**සාක්ෂිකාරියඃ** නිවසින් පිටත සිටි මගේ මගේ වැඩිමහල් සොහොයුරිය ගෙත් බෙල්ලෙන් අල්ලා ගෙට තල්ලු කරමින් සියළු දෙනාටම ගෙට යන මෙන් නියෝග කළා. මේ අතර ඔවුන් මගේ සැමියාත් සොහොයුරන් දෙදෙනාත් ප්‍රශ්න කිරීමට අවශ්‍ය බව කියමින් රැගෙන ගියා.

---

[45] උදහරණයක් වශයෙන් ශ්‍රී ලංකාවේ නීතිපතිවරයා විද්වත් කමිටු සාමජිකයින් සමග උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභා විසින් කිසිම අපරාධකරුවෙක් හඳුනා ගත්තේ නැති බව සඳහන් කළේය. විද්වත් කමිටු වාර්තාව 281 පිටුව හා 78 පිටුව

[46] වෙල්ලනි සැසිවාරය- 2010 නොවැම්බර් 14

[47] කොමිෂන් සභා සැසිවාර වාර්තා බොහොමයක භාෂා පරිවර්ථක වෙත යොමු කරන ලද ප්‍රශ්න කවරේද සාක්ෂිකාරිය හෝ සාක්ෂිකාරු වෙත යොමු කරන ලද ප්‍රශ්න කවරේද යන්න පැහැදිලිව වෙන් කොට දක්වා නැත.

**සභාපතිවරයාඃ ( පරිවර්තක ට)** තම සැමියා සහ අනෙක් අය සිටින ස්ථානයක් දන්නේ දැයි අසන්න.

**සාක්ෂිකාරියඃ** නැහ

**සභාපතිඃ** කවුරු හරි ඔවුන් දුටුවාද?

**සාක්ෂිකාරියඃ** නැහ

**සභාපතිවරයාඃ** ලේකම්කාර්යංශයට සියළු තොරතුරු ලබා දෙන්න.

**සාක්ෂි අංක 7ඃ චාවාකච්චේරි සංස්කෘතික මධ්‍යස්ථානය 2010 නොවැම්බර් 13ඃ**[48]

**සාක්ෂිකාරියඃ** 2008 දෙසැම්බර් 12 වන දින සිට මගේ සැමියා අතුරුදහන් ව ඇත.

**සභාපතිවරයාඃ** ඔබේ සැමියා අත් අඩංගුවට ගත්තේ කවද දැ?

**සාක්ෂිකාරියඃ** මම දන්නේ නැහ. එක දවසක් මහ රෑ පිරිසක් ඇවිත් වැට ළඟ ඉඳ ගෙන තම්බි තම්බි කියා කථා කළා. මගේ සැමියා ඔවුන් කවුදැයි බැලීමට එළියට ගියා. මිනිත්තු කිහිපයකට සද්දයක් නැති නිසා අපිත් එළියට ගියා බලන්න. එතකොට මම දැක්කා යුද්ධ හමුද ඇඳුමෙන් සැරසුන දහයක් පහලොවක් විතර පිරිසක් මගේ සැමියා ව ඇද ගෙන යනවා. මුරුගන් කෝවිල ළඟ යුද්ධ හමුද කඳවුරක් පිහිටුවා තිබුන අතර සැමියා රැගත් ජීප් රථය ඒ දෙසට යනවා මා දැක්කා.

**සභාපතිවරයාඃ** මේ පිරිස කවුදැයි සාක්ෂිකාරිය දන්නවාද?

**සාක්ෂිකාරියඃ** කිසිම තොරතුරක් නැහ.

**සභාපතිවරයාඃ** යම්කිසි කෙනෙක් ඔබේ සැමියා ඊට පස්සේ දුටුවා ද?

**සාක්ෂිකාරියඃ** නැහ.

**සභාපතිවරයාඃ** ඔබේ සියළු තොරතුරු .........

**සාක්ෂිකාරියඃ** සියළු තොරතුරු දැනටමත් දී තිබෙනවා මම ආවේ මේ කාරණය ඔබතුමා ඉදිරියේ කියන්න.

**සභාපතිවරයාඃ** හොඳයි අපි ඒ ගැන සොයා බලන්න.

**සාක්ෂි අංක 9ඃ** සාමදාන විනිශ්චයකරුවෙකු වූ සාක්ෂිකරු යාපනය අරියාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වාසය කරයි. 2006 දී සිය ගමේ හි රාජකාරියෙහි නිරත වී සිටි ග්‍රාම නිලධාරියා ඇතුළු දස දෙනෙකුට වැඩි පිරිසක් විවිධ අන්දමින් ඝාතනය කරන ලද්දේය. ඔහු මෙම වැන්දඹු පවුල් වලට වන්දි මුදලක් ගෙවීමට යෝජනා කළේය.[49]

මන්නාරම් දිස්ත්‍රික්කයෙහි යුද්ධයෙහි අවසාන කාලපරිච්ඡේදයේ දී සිදු වූ සාවද්‍ය මනුෂ්‍ය ඝාතන 166 ක ලැයිස්තුවක් මන්නාරමේ අගරදගුරු අති උතුම් ආචාර්ය රායප්පා ජෝශප්, වික්ටර් සුසෙයි පියතුමා, ෂේවියර් කෘෘස් පියතුමා, ඇතුළු නියෝජිත පිරිස විසින් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවට ඉදිරිපත් කළේය. එහි දී අගරදගුරුතුමා සාක්ෂි දෙමින් මෙසේ ද කිවේය.

---

48 චාවාකච්චේරි සංස්කෘතික ශාලාවඃ 2010 නොවැම්බර් 13 2010 LLRC/FV/13-11-10/02

49 සාක්ෂි අංක 9ඃ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයඃ අරියාලේ, යාපනය 2010 නොවැම්බර් 11

' මෙය සම්පුර්ණ නිවරදි සංඛ්‍යා ලේඛන නොවේ. යුද්ධය නිසා පසුගිය අවුරුදු 30 තුලත් විශේෂයෙන් ම 2007 සිට 2009 යුද්ධයේ අවසාන කාලපරිච්ඡේදය තුලත් මිනිසුන් දහස් ගණනක් ජිවිතක්ෂයට පත් වු බව වාර්තා වි ඇත. මෙයින් ඉතා විශාල සංඛ්‍යාවක් මන්නාරම් දිස්ත්‍රික්කයෙන් ද වෙයි. උදහරණයක් ලෙසට අපගේ දියෝකිසයට අයත් තුන්නුකායි හි ලේලාන් කුලම් හි අවතැන් වුවන් හට සහන සැලසිමේ යෙදි සිටි පරිකාරන්ජිත් පියතුමා 2007 සැප්තැම්බර් 26 දින ඝාතනය කළේය. මීට අමතරව, 1984 දෙසැම්බර් මස 4 වන දින මන්නාරම-මැදවදච්චි මහා මාර්ගයේ 11 වන සැතැපුම් කණුව අසල සිදු කරන ලද සමුහ මනුෂ්‍ය ඝාතනය ඇතුළු මනුෂ්‍ය ඝාතනයන් අතිවිශාල සංඛ්‍යාවක් සිතාමතාම යුද්ධ හමුදව විසින් සිදු ඒවාය. ඇසින් දුටු සාක්ෂිකරුවන් ගේ සාක්ෂිවලට අනුව 2009 මැයි මාසයට පෙර පස් මාසය තුළ මිනිසුන් දහස් ගණනක් ඝාතනය වු අතර ඉන් යම්කිසි සංඛ්‍යාවක් මන්නාරම් දිස්ත්‍රික්කයෙන් ද වෙයි.[50]

වවුනියාවේ චෙට්ටිකුලම් හි සිට පැමිණි සාක්ෂිකරුවෙක් තම පුතා එල් ටි ටි ඊ ය විසින් හෝ එල් ටි ටි ඊ නමින් පෙනි සිටි කණ්ඩායමක් විසින් ඝාතනය කළ බවට සාක්ෂි දුන්නේය.

**සාක්ෂි අංක 5ඃචෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2010 අගෝස්තු 14ඃ**

**සාක්ෂිකරුඃ** මම මෙහි පැමිණියේ චෙට්ටිකුලම් හි කාන්තිනගර් හි සිටයි. මම මෙහි පැමිණියේ මගේ පවුල පිළිබඳව කථා කිරිමට නමුත් මෙම සැසිවාරය දෙස මම බලා සිටියේ ලොකු සතුටකින්. මගේ පුතා නිවසින් පැහැර ගෙන ගොස් කිලෝ මිටරයක් පමණ නුදුරු තැනක දි වෙඩි තබා ඝාතනය කළා.

**මනෝරි රාමනාදන් මහත්මියඃ** කවුද ඒ ඝාතනය කළේ?.

**සාක්ෂිකරුඃ** ඔවුන් තමන් එල් ටි ටි ඊ සංවිධානයෙන් කීවත් එල් ටි ටි ඊ සංවිධානයේ නම පාවිච්චි කරමින් වෙන කණ්ඩායමකටත් මේ දේ කළ හැකියි. මගේ පුතා ඊ පි ඩි පි දේශපාලන පක්ෂයේ ප්‍රකාශන අලෙවි කරමින් සිටි අවස්ථාවේ දි ඔහු පැහැර ගෙන ගොස් ඝාතනය කළා. මට ඔහු ගේ මළ කඳ ආසන්නයට යාමට ඉඩක් නොලැබුනේ ඝාතකයින් ඒ වන විටත් සිද්ධිය වු ස්ථානයේ රැඳි සිටි නිසයි. මම ආයෙත් එම ස්ථානයට ගියේ මාස 8 කට පසුවයි. මම චෙට්ටිකුලම් හා වවුනියා පොලිස් නිලධාරින් සමග එම ස්ථානයට යන විට දක්නට ලැබුනේ හිස් කබලක් පමණයි. මාතෘ ශරිරයේ එම කොටස් වැඩිදුර පරික්ෂණ පිණිස කොළඹ ට යවනු ලැබුවා. නමුත් අද දක්වා ම ඒ ගැන කිසිදු හෝඩුවාවක් නැහ. රහස් පොලිසිය විටින් විට ඇවිත් ප්‍රශ්න කරන අතර තුර මරණ සහතිකය තිබේ දැයි අහනවා. එහෙම නැත්නම් මට මේ වෙඩි තැබිම කළ පුද්ගලයින් හඳුනා ගැනිමට හැකි දැයි අහනවා. මට ඒක කියන්න බැහ. මොකද මම දන්නේ නැති නිසා. නමුත් ගමේ මිනිස්සු දන්නවා. නමුත් ඒ අයත් ඉදිරියට ඇවිත් කියන්න බයයි. ඊට හේතුව ලේසියෙන් තේරුම් ගන්න

[50] අතිඋතුම් ආචාර්ය රායප්පා ජෝශප් අගරදගුරුතුමා විසින් දෙන ලද සාක්ෂිය දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය 2011 ජනවාරි 8

පුළුවන්. මම මේ කොමිෂන් ' සභාවෙන් ඉල්ලා සිටින්නේ මගේ පුතා ගේ මරණ සහතිකය ලබා දෙන්න කියලයි. ( සාක්ෂිකරු ඉවත් වෙයි)

## ශ්‍රී ලංකා යුද්ධ හමුදව හා එල් ටි ටි ඊ සංවිධානය විසින් බෝම්බ හෙළිමඃ

යුද්ධයේ අවසාන මාස කිහිපය තුළ රෝහල් ඇතුළු සිවිල් ජනතාව රැදි සිටි ස්ථානවලට බෝම්බ හෙළීම මානව අයිතිවාසිකම් හා යුද්ධය පිලිබඳ නීතිමය විධිවිධාන වලට අනුව ඉතාමත් බරපතළ වරදක් ලෙස සලකනු ලැබිණ.

දරුස්මාන් වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ වගවිම සම්බන්ධයෙන් පිළිගත හැකි සාක්ෂි තිබේ.

'2008 සැප්තැම්බර් මස සිට 2009 මැයි මාසය තෙක් ශ්‍රී ලංකාවේ යුද්ධ හමුදව විසින් බෝම්බ ප්‍රහාරයන් යොද ගනිමින් වන්නිය ආක්‍රමණය කළ අතර එමගින් දහස් සංඛ්‍යාවක් ජීවිතක්‍ෂයට පත් වුහ. වන්නියේ සිවිල් වැසියන් මුද ගැනිම පිණිස දියත් කළේ යැයි ප්‍රකාශිත මෙම මානුෂික මෙහෙයුම වන්නියේ දවිඩ වැසියන් ඉලක්ක කර ගත් දකුණේ සිංහළ බෞද්ධයින් ගේ මෙහෙයුමක මුහුණුවර ගත්තකි. 330,000 ආසන්න පිරිසක් ආරක්ෂිත කලාපය නමින් ක්‍රමයෙන් සංකෝචනය වන භුගෝලීය ප්‍රදේශයෙහි කොටු වි සිටි අතර එක් අතකින් රජයේ හමුද විසින් එල්ල කළ බෝමබ ප්‍රහාර වලට ගොදුරු වු අතර එතැනින් පළා යාමට ඉඩ නොදි එල් ටි ටි ඊ ය විසින් ඔවුහු ප්‍රාණ ඇපකරුවන් වශයෙන් තබා ගන්නා ලදි. මෙම තත්වය වාර්තා කිරිම පිණිස මාධ්‍යයන් දරන ලද උත්සාහයන් විවිධ උපක්‍රම මගින් වැළැක්විමට රජය සමත් විය.

යුද්ධ මුක්ත කලාපය නමින් හදුන්වන ලද කලාප තුනක සිවිල් වැසියන් කොටු වි සිටි අතර මෙම කලාපයන්ට බර අවි යොද පහර නොදිමට තමන් ගේ තිබු එකගත්වය ද උල්ලංඝණය කරමින් රජය විසින් මෙම කලාපයන් ට පහර දුන් බව වාර්තාවේ. මෙම බෝම්බ ප්‍රහාරයන් මගින් එක්සත් ජාතීන් ගේ ආධාර බෙද හැරිමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයටද, තුවාල කරුවන් හා අනාථයන් රැගෙන යාමට පැමිණි අන්තර් ජාතික රතු කුරුස සංගමයේ නැව්වලට ද හානි සිදු කළේය. මෙම ප්‍රහාරයන් සිදු කරන ලද්දේ එමගින් වන හානිය පිළිබඳ මෙන් ම එක්සත් ජාතීන් ගේ සංවිධානය හා රතුකුරුස සංවිධානයන් ගේ අනතුරු හැගිවිම් මැදය. යුද්ධයේ අවසාන කාලපරිච්චේඡයේ දි සිවිල් ජනතාවට වැඩි පුර හානි ගෙන දෙන ලද්දේ රජයේ හමුද විසින් එල්ල කරන ලද බෝම්බ ප්‍රහාරයන් ගෙනි.

ආණ්ඩුව විසින් ක්‍රමානුකුලව සටන් පෙරමුණේ තිබු රෝහල් වලට ප්‍රහාර එල්ල කළේය. රජය විසින් මෙම රෝහල් පිහිටා තිබෙන ස්ථාන හොඳින් ම දන සිටි නමුත් ඒ බව නොසලකා වන්නියේ පිහිටුවා තිබු සියළු රෝහල් වලට යුද්ධ හමුදව විසින් මෝටාර් හා ආටිලරි ප්‍රහාර එල්ල කෙරින.'[51]

දනට ප්‍රසිද්ධ කර ඇති තොරතුරු විශ්ලේෂණය කරන විට ඉහත කී චෝදනා විභාග කිරිම වෙනුවට කොමසාරිස්වරුන් වැඩිපුර කාලයක් ගත කළේ රජයේ යුද්ධ හමුද ආරක්ෂා කිරිම පිණිස පෙනි යයි. කොමසාරිස්වරුන් විසින් රජයේ සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් ප්‍රදර්ශනය

[51] විද්වත් කමිටු වාර්තාව විධායක සාරංශය 2 පිටුව

කරන ලද මෙම වෙනස් කම් නිසා ආණ්ඩුවේ හමුද විසින් සිදු කරන ලද අපරාධ සම්බන්ධයෙන් සාක්ෂි දුන් සාක්ෂිකරුවන් ගෙන් ගැඹුරු හරස් ප්‍රශ්න ඇසීම නොකෙරුනු අතර හෝ එම චෝදනා එල් ටි ටි ඊ සංවිධානය මත පැටවීමේ උත්සාහයක යෙදුන බව පෙනි යයි.

එජා විද්වත් වාර්තාවට අනුව වින්දිතයින් සම්බන්ධයෙන් කොමසාරිස්වරුන් ගේ සැලකිල්ල කයෝර මෙන් ම අවමන් සහගත විය. සිදු වූ මානව හිමිකම් හා මානවීය නීතිය උල්ලංඝණය පිළිබඳ පැමිණිලි සලකන ලද්දේ උපහාසාත්මක ලෙසය. ඇතැම් විට වින්දිතයින් සිය චෝදනා ආරක්ෂක හමුද සාමාජිකයින්ට එරෙහිව එල්ල කළ විට කොමසාරිස්වරුන් හැසිරි තිබුනේ එබඳු චෝදනා අසත්‍ය විය හැකි බවත්, සාක්ෂිකරු පරස්පර විරෝධී කරුණු ඉදිරිපත් කරන බවත් හැඟවෙන පරිදිය.[52] උදහරණයක් වශයෙන් 2010 සැප්තැම්බර් 10 වන දින මුලතිව් හි දි පවත්වන ලද සැසිවාරයේ දි සාක්ෂිකරුවෙකු නාවික හමුද විසින් එක්තරා අවස්ථාවක දි බෝට්ටුවක ගමන් කරමින් සිටි සිවිල් වැසියන් කණ්ඩායමකට වෙඩි තැබූ අවස්ථාවේ ඉන් අට දෙනෙකු මිය ගිය බව ප්‍රකාශ කළ විට කොමසාරිස්වරුන් දක්වන ලද ප්‍රතිචාරය දැක්විය හැකිය.[53]

පහත දැක්වෙන්නේ තවත් එබඳු නිදර්ශනයකි.**සාක්ෂි අංක 3: මුලතිව් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය 2010 සැප්තැම්බර් 20:**[54]

**සාක්ෂිකරු:** 2009 මැයි 16 වන දින මම මගේ පවුලේ අයත් සමග බටපල්ලේ සිට මුල්ලවාක්කල් හරහා හමුද පාලන ප්‍රදේශයට ගමන් කරමින් සිටියා. මාත් සමග මගේ වැඩිමහල් දියණිය, ඇය ගේ දරුවන් දෙදෙනා සහ බෑනා සිටියා. අපි හමුද පාලන ප්‍රදේශය ඇතුලේ දීත් බෝම්බ ප්‍රහාර වලට ගොදුරු වුනා. අන්තිමේ දි එක් තැනක දි වැඩිමහල් දුවට තුවාල වි ඇය එතනම මිය ගියා. තවත් ඉදිරියට යන විට ආයෙත් කාලතුවක්කු ප්‍රහාරයකට ගොදුරු වුනා. ඒ වේලාවේ මගේ වැඩි මහල් මිනිබිරියට තුවාල වුනා. එතනට ආපු රජයේ හමුදව මගේ තුවාල වු දියණිය රැගෙන ගියා.

**ප්‍රශ්නය:** මෙම පහර දිම් කළේ කවුද?

**සාක්ෂිකරු:** දෙපැත්තෙන් ම කළා.

**ප්‍රශ්නය:** දැන් ඔබගේ මිනිබිරියන් කෝ?

**සාක්ෂිකරු:** අපි ඉදිරියට ගමන් කරන වෙලාවේ බෑනාත් මඟ හැරුනා. පිටි පස්සෙන් ආපු අය කිව්වා බෑනා තුවාල වෙලා මැරුනා කියලා. හමුදව බාරයට ගත්ත දුවට මොකක් වුනාද කියලා දන්නේ නැහ. මට දැන් අවශ්‍ය මේ ළමයා ඉන්නේ කොහෙද කියලා දැන ගන්න.

( සාක්ෂි නිම විය)

[52] විද්වත් කමිටු වාර්තාව 91 පිටුව

[53] ඉහත වාර්තාව හා සාක්ෂි අංක 1 දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය මුලතිව් 2010 සැප්තැම්බර් 20 , LLRC/PS/20-09-10/01

[54] සාක්ෂි අංක 3 දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය 2010 සැප්තැම්බර් 20 2010, LLRC/PS/20-09-10/01

**සාක්ෂි අංක 4: චාවාකච්චේරි සංස්කෘතික ශාලාව 2010 නොවැම්බර් 13:**[55]

**සාක්ෂිකරු:** මගේ සැමියා හා පුතා පුතුකුඩුඉරිප්පු වල දී ෂෙල් ප්‍රහාරයකින් මිය ගියා.

**සභාපති:** ඒ කවදද?

**සාක්ෂිකරු:** 2009 ජනවාරි 22. දැන් මට ඉතිරි වෙලා ඉන්නේ දුවලා දෙන්නා පමණයි. එයින් එක් දුවෙකුටත් ළමයි දෙන්නෙක් ඉන්නවා. මේ අයට ජීවත් වෙන්න විධියක් නැහ. මොකක් හරි ආධාරයක් අවශ්‍යයයි.

**සභාපති:** ඇයට අවශ්‍ය මුල්‍ය ආධාරයක්. ( වන්දියක් ) ඔව් අපිට ඒ ගැන සලකා බලන්න පුළුවන්. ඇයට කියන්න අදළ පෝර්ම පුරවලා ලේකම් කාර්‍යාලයට දෙන්න කියලා.

බොහෝ සාක්ෂිකරුවන් ෂෙල් ප්‍රහාරයන් ගෙන් බේරීම පිණිස තැනින් තැනට පලා ගිය ආකාරය විස්තර කළ අතර එම විස්තර බොහෝ අවස්ථාවල ඉතාමත් සංක්ෂිප්ත විය.[56]

**පුනාගරි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය: සාක්ෂි අංක 4:**

'ෂෙල් වෙඩි ගහන කොට අපි තැනින් තැනට පලා ගියා. එක තැනක ඉදලා අළුත් තැනකට ගියාම අපි ෂෙල් වෙඩි වලින් බේරෙන්න එතන බංකරයක් හදා ගන්නවා. එතැනට ෂෙල් වෙඩි ගහන කොට එතනින්නුත් පැනලා යනවා. එහෙම නැතිව ෂෙල් වෙඩි වලින් බේරෙන්න විධියක් තැබුනේ නැහ.'

මෙම පලා යාමේ දි සාක්ෂිකරු සිය 17 හැවිරිදි පුතා මිය ගිය බව ප්‍රකාශ කළේය.

පහත දැක්වෙන සාක්ෂිකරු තම පුතා එල් ටි ටි ඊ සංවිධානය විසින් පැහැර ගත් බවත් යුද්ධයේ අවසාන අදියරේ දි තමා පොක්කානි වල සහන සේවා ලබා ගැනිමට පෙළ ගැසි සිටියදි ෂෙල් වෙඩි වලින් වැසියන් මිය ගිය ආකාරය දුටු බව යාපනය නීරවෙල්ලි සැසිවාරයේ දි කියා සිටියේය.

**යාපනය නීරවෙල්ලි: සාක්ෂි අංක 9:**

' මගේ ජීවිතයේ කවදවත් අමතක නොව සිද්ධියක් මට ඔබ සැමට කීමට අවශ්‍යයයි. අපි පුක්කානී කියන ප්‍රදේශයේ කිරි පිටි ලබා ගැනිම පිණිස පෝලිම් ගැසි සිටින විට ෂෙල් වෙඩි නිසා ඉතා විශාල පිරිසක් මිය ගිය හැටි මම ඇස් දෙකින් ම දැක්කා. තවත් අවස්ථාවක එල් ටි ටි ඊ සංවිධානය විසින් කෑම අලෙවි කරන ස්ථානයක රැඳි සිටිය දි එතනටත් ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වුනා. එතනත් 30-40 විතර මිය ගියා. අපි ඇත්ත වශයෙන් ම ආර්ථික වශයෙන් හොඳට හිටිය පොහොසත් අය. අපිට ලෑන්ඩ් මාස්ටරයක්, ජෙනරේටරයක් ඇතුළු හැම දෙයක් ම තිබුනා. අද අපිට ඒ සියල්ලම අහිමියි. අපි දැක්ක දේවල් කිසිදක අමතක කරන්න බැහ. ඒවා අපේ හිතේ රැඳි තිබෙනවා.

**තොල්ක:** සාක්ෂිකරු කැමති ද කැමරාවක් ඉදිරියේ සාක්ෂි දෙන්න.

[55] සැසිවාරය චාවාකච්චේරි සංස්කෘතික ශාලාව 2010 නොවැම්බර් 13 , LLRC/FV/13-11-10/02

[56] සාක්ෂි අංක 4 ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පුනාකරි 2010 සැප්තැම්බර් 19

සාක්ෂිකරු ගේ පිළිතුර වුයේ: සිද්ධ වු දේවල් සම්පුර්ණ ඇත්ත. ඔක්කෝමල්ලා මේවා දැක්කා. හංගගන්න දෙයක් නැහ.

පුනාගරී හි සැසි වාරයේ දි එක් සාක්ෂිකරුවෙකුට සවිස්තරාත්මක සාක්ෂියක් දිමට විරල අවස්ථාවක් උදවුයේය.

**පුනාගරී ප්‍රජා ශාලාව- සාක්ෂි අංක 5 : 2010 සැප්තැම්බර් 19 දින:**[57]

ආණ්ඩුව සිය මානුෂික මෙහෙයුම ආරම්භ කළාට පස්සේ අපි මුක්කානම් හි සිට කිලිනොච්චි පැත්තට ගමන් කළා. මන්නාරම් ප්‍රදේශයේ සිට අවතැන් වුවන් ද ජයාපුරම් වලට පැමිණ පසුව එතැනින් කිලිනොච්චියට පැමිණියා. අපි කිලිනොච්චි වල සිටියදි කාලතුවක්කු, ෂෙල් වෙඩි හා ගුවන් ප්‍රහාර වලට දිගින් දිගටම ගොදුරු වුනා. මේ නිසා අවතැන් වු අපි සරණාගතයින් ලෙසට පුලියන්පොකුණ, වානේරි හා වට්ටකච්චි කියන ප්‍රදේශ වලට ගමන් කළා. මේ අවස්ථාව වන විට එල් ටි ටි ඊ පාක්ෂිකයින්ට දකුණට හා ඉන්දියාවට ආරක්ෂිතව පළා යන්නට අවස්ථාව ලැබුනා. එල් ටි ටි ඊ පාක්ෂිකයින් නොවු තැනැත්තන් හා එල් ටි ටි ඊ නිසා සිය දරුවන් අහිමි වු පවුල් වල සාමාජිකයින්ට මෙම ප්‍රදේශයෙන් පිටතට යාමට ඉඩ දුන්නේ නැහ. එල් ටි ටි ඊ ය මේ අවස්ථාවේත් සෑම පවුලකින් ම දරුවෙක් ඔවුන් ගේ දේශපාලන ව්‍යාපාරයට පරිත්‍යාග කරන මෙන් දැනුම් දි තිබුනා. මෙම දරුවන් බඳවා ගෙන මාසයක පුහුණුවක් වත් නොදි සටන් පෙරමුණට යැව්වා. මේ අතර එල් ටි ටි ඊ ය මේ ප්‍රදේශයේ සිටි සියළුම වැඩ කළ හැකි පිරිමීන් ගෙන් බංකර් සෑදිම ඇතුළු වෙනත් කාර්යයන් සඳහා සිය ශ්‍රමය දෙන මෙන් නියෝග කළා. මේ අවස්ථාව වන විට මිනිසුන් දැඩි ලෙස කළකිරි සිටි අතර විශාල මානසික කම්පනයකින් පෙළුනා. සමහර මිනිසුන් එල් ටි ටි ඊ පාලනයෙන් මිදි රජයේ පාලන ප්‍රදේශයන් ට පලා ගිය අතර එහිදි ඔවුන්ට රජයේ හමුද විසින් පහර දි තිබුනා.

මේ අවස්ථාව වන විට මිනිසුන්ට එල් ටි ටි ඊ පාලන ප්‍රදේශයේ ඉන්නවාද එසේත් නැත්නම් රජයේ පාලන ප්‍රදේශවල ඉන්නවා ද කියන දෙගිඩියාව ඇති වුනා. ඒ අතර රජයේ හමුදවත් කොයි යම් අවස්ථාවක මෙහි ළඟා වනු ඇතැයි බලාපොරොත්තුවක් ද මිනිසුන් තුළ තිබුනා. හැබැයි ඒ වන විට රජයේ හමුද විසින් පහර දිම නිසා බොහෝ දෙනෙක් මිය ගිය අතර තවත් සමහරක ගේ අතපය කැඩි ගියා. බෝම්බ ප්‍රහාර දිගින් දිගට ම සිද්ධ වෙන්න ගත්තා ම විශ්වමඩු හා ධර්මපුරම් හි රැදි සිටි සරණාගතයින් එතැනින් ඉවත් වන්නට තීරණය කළා. ආණ්ඩුව මේ අතර තේවිපුරම්, සුවන්දරම්පුරම් හා විශ්වමඩු හි ආරක්ෂක කලාපයක් ප්‍රකාශයට පත් කළා. මන්නාරම, මුලතිව් හා කිලිනොච්චි හි රැදි සිටි මිනිසුන් මෙම ආරක්ෂක කලාපයට ඇතුළ් වුනා. එල් ටි ටි ඊ සාමාජිකයින් මෙම පිරිස් සමග ආරක්ෂක කලාපයට ඇතුල් වි යුද්ධ හමුදවට පහර දිමට පටන් ගත්තා. නමුත් ආණ්ඩුවේ හමුද මෙම ආරක්ෂ කලාපයේ රැදි සිටින බහුතරයක් සිවිල් වැසියන් ය යන කාරණය නොසලකා ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළා.

57 සැසිවාරය පුනාකරි පොදු ශාලාව 201 සැප්තැම්බර් 19

රජය විසින් අළුත් ආරක්ෂක කලාපයක් පුදුමතලාන් හා වට්ටවේල් ආවරණය වන පරිදි පිහිටු වනු ලැබුවා. මගේ අදහස නම් රජය ගත් මෙම පියවරින් සිදු වුයේ එල් ටි ටි ඊ යට තවදුරටත් මිනිසුන් පළිහක් ලෙස පාවිච්චි කරමින් රජයට පහර දෙන්නට ඉඩ කඩ සලසා දිමක් පමණයි.

**ආචාර්ය රොහාන් පෙරේරා :** ඔබට විස්තර කරන්න පුළුවන් ද රජය විසින් එල් ටි ටි ඊ යට මහජනතාව මිනිස් පලිහක් ලෙස පාවිච්චි කරන්නට ඉඩ සලසා දුන්නා යන්නෙන් අදහස් කළේ  කුමක් ද කියා?

**සාක්ෂිකරුː** රජය විසින් තේව්පුරම්, විශ්වමඩු හා සුරන්දිපුරම් කියන ආරක්ෂක කලාප පිහිටුවා අපේ මිනිසුන්ට එතැනට යන්න කිව්වා එතන ආරක්ෂාව හොඳයි කියලා. එහෙම නැතිව අපට ඉඩ දුන්නා නම් අපිට ම රජයේ ආරක්ෂක කලාපයට යන්න කියලා මේ  තරම් දුක් විදින්නේ නැතුව අපට යන්න තිබුනා.

**ආචාර්ය රොහාන් පෙරේරාː** ඒ කියන්නේ ඒ ප්‍රදේශයේ ඉන්න සිවිල් වැසියන් ට?

**සාක්ෂිකරුː** මිනිස්සු ආරක්ෂක කලාපයට ගියේ ආණ්ඩුව මිනිස්සුන් ට එහි යන්න කියපු නිසා. එහි ප්‍රතිඵලය වුනේ එල් ටි ටි ඊ ය විසින් එම ප්‍රදේශය වට කිරිමයි. මට හිතෙන්නේ ඇත්තටම ආණ්ඩුව ආරක්ෂක කලාප පිහිටුවිමෙන් කළේ  එල් ටි ටි ඊ යට අවස්ථාවක් දුන්නා තමන් ගේ ආයුධ සමග පලා ගොස් ආරක්ෂක ස්ථානයකට යන්න. ගුවන් ප්‍රහාර නිසා මගේ තක්සේරුවේ හැටියට දිනකට 350-650 සිවිල් වැසියන් තුවාල ලැබුවා. තවත් 200 විතර මිය ගියා. මිනිස්සු කැළෑ මැදින් වවුනියාවට පළා යන්න උත්සාහ කළ විට එල් ටි ටි ඊ ය මග රැක සිටි වෙඩි තිබ්බා නැත්නම් පොල්පිති වලින් තඩි බෑවා. රජයේ හමුද වලට මේ සෝෂාව ඇහෙන විට ඔවුන් කළේ පළා යන සිවිල් වැසියන් ගේ හඩ වල් ඔස්සේ ගුවන් ප්‍රහාර එල්ල කිරිමයි. මේ අවස්ථාව වන විට මම හා මගේ පවුලේ උදවිය ආපසු සුරන්දීරම්පුරම් වලින් පිට වි පුදුමතලාන් ප්‍රදේශයට යන්න තීරණය කළා.

**මොහොමඩ් ජිෆ්රි මහතාː** ඔබට නිශ්චිත වම දින වකවානු කිව හැකිද?

**සාක්ෂිකරුː** 2009 ජනවාරි 19 වන දයින් පසුව. එදින හි රාත්‍රි අපි සුරන්දීරම්පුරම් එල් ටි ටි ඊ ග්‍රහණයෙන් මිදි පලා යන්නට තැත් කරන විට ඔවුන් අපිට අණ කළා රජයේ ආරක්ෂකකලාපයට යන ලෙසට. පසුද දහවල් වන විට අපි අච්චිතෝට්ටම් කියන ප්‍රදේශයට ළඟා වුනා.අපිට දක්නට ලැබුනා රජයේ හමුද විසින් අපි සිටි ප්‍රදේශයට ගුවන් පහර එල්ල කළා. ඒ ප්‍රහාර ආවේ රජයේ පාලන ප්‍රදේශය පැත්තෙන්. මේ බෝම්බ ප්‍රහාර නිසා එද කාන්තාවන් 17 දෙනෙක් හා ළමයින් 6 දෙනෙක් මිය ගියා. එද රාත්‍රි අපි කොහොම හරි අම්බලන්කොකොනායි පහු කර ගෙන ඉරන්පාලෙයි කරා පැමිණියා. ඒ ආපු ගමනේ දි අපි සන්තක සියළු දේවල් අපට අහිමි වුනා. ඒක කොයි තරම් දුෂ්කර ගමනක් කිව්වොත් කිලෝමිටරයක් යන්න පැය තුනක් ගත වුනා. එදින අපි තාර ෂිට් වලින් අටවා ගත්තු ආවරණයක් යට රාත්‍රිය ගත කලා. උදේ නැගිටලා බලන කොට හතර වටේ ම මළ මිනී යන්තම් භාගෙට වළ දමා තිබුනා.

**ආචාර්ය රෝහාන් පෙරේරාමහතාː** ඔබ කියනවා මිනිවළ වල් පිරිලා තිබුනා කියලා. ඒවා කවුරු කරන්න ඇති කියලා ද ඔබ හිතන්නේ ?

**සාක්ෂිකරු:** මේ හුගක් වළ වල් හෑරෙන්න ඇත්තේ බෝම්බ ප්‍රහාර නිසා. බෝම්බ ප්‍රහාර වලින් මිනිසුන් මිය ගියා ම මේ වළ වල් වලට දමලා නිකං පස් ටිකක් උඩින් දමලා ජීවත් වෙලා ඉන්න  අයට යන්න වුනා. මේ කියන ප්‍රදේශය එල් ටි ටි ඊ පාලන ප්‍රදේශයක්. නමුත් මම කියන්න දන්නේ නැහ මේ මරණ සිද්ධ වුනේ එල් ටි ටි ඊ ප්‍රහාර නිසා ද නැත්නම් රජයේ පහර දීම් නිසා ද කියලා කියන්න දන්නේ නැහ.

**සභාපති:** ඔය කියන ප්‍රදේශය එල් ටි ටි ඊ පාලන ප්‍රදේශයක් නම් යුද්ධ හමුදව ඇවිත් මේ මරණ සිද්ධ කළේ කොහොමද?

**සාක්ෂිකරු:**

ඒවා යුද්ධ හමුදව විසින් කෙලින් ම පහර දිලා සිද්ධ වුන මරණ නොවෙයි. කාලතුවක්කු හෝ ගුවන් බෝම්බ ප්‍රහාර නිසා සිද්ධ වුන මරණ. මේ තත්වය යටතේ තමයි මිනිස්සු එල් ටි ටි ඊ පාලන ප්‍රදේශයක් වු අම්බලන්කෝන හා පුදුමතලාන් දක්වා පැමිණියේ. ටික දවසක් එහි සාමකාමී බවක් තිබුනා. මේ ප්‍රදේශයේ 12,000 පමණ රැදි සිටියා. මේ අතර ආණ්ඩුව මේ ප්‍රදේශයත් ආරක්ෂක කලාපයක් ලෙසට නම් කළා. නමුත් ඒ ප්‍රදේශයේ කිසිම ගොවිතැනක් තිබුනේ නැහ. සමහර අවස්ථාවලදි එල් ටි ටි ඊ ය විසින් ආහාර පාන සපයනු ලැබුවත් ඒවා පාවිච්චියට ගන්න බැරි තරමට නරක් වෙලා තිබුනේ. මිනිස්සු ඇත්තටම හිටියේ සාගින්නේ. බීමට ජලය තිබුනේත් නැහ. අඳින්න ඇදුම් තිබුනේ නැහ. එකම ඇදුම ඇද ගෙන දවස් ගණනක් ඉන්න වුනා.නැව් වලින් සපයනු ලැබු ආහාර පාන එල් ටි ටි ඊ ය විසින් රැගෙන ගියා. ඉරනපාලෙයි කියන ප්‍රදේශයේ එල් ටි ටි ඊ ය සතු පොල් වතු තිබුනා. කන්න දෙයක් නැති නිසා සමහර අය ඒ වතු වලට ගිහින් පොල් කඩා ගෙන ආවා. පස්සේ ඒ පොල් පාවිච්චි කළ අය ගෙන් එල් ටි ටි ඊ ය පොළ් වලට  රුපියල් 500-1000 අතර මුදලක් අය කළා. පොල් කඩන්න ගිය අය එල් ටි ටි ඊ ය විසින් බලහත්කාරයෙන් රැගෙන ගියා. අප වින්ද දුක් ගැහට වචනයෙන් කියන්න බැහ.

ටික දවසකින් යුද්ධ හමුදව මේ ආරක්ෂක කලාපය ආසන්නයට ළඟා වුන අතර එල් ටි ටි ඊ හට පිරිස් හා යුද්ධ හමුදව අතර පරතරය අඩු වෙන්න පටන් ගත්තා. එල් ටි ටි ඊ ය විසින් ගොඩ නගපු ඇන්ටනා කුළුනු මේ ප්‍රදේශයේ තිබුනා. හමුදව මේ ඇන්ටනා කුළුනු වලට ප්‍රහාර එල්ල කරන්න පටන් ගත්තා. එල් ටි ටි ඊ යත් ප්‍රතිප්‍රහාර එල්ල කළා. මේ නිසා දවසකට 300 ත් 400 ත් අතර පිරිසක් දිනපතා තුවාල ලැබුවා. හමුදව විසින් පොකුරු බෝම්බ ද හෙළනු ලැබුවා. මේ නිසා මිනිසුන් ට බංකර් වලට රිංගන්න වුනා. 2009 අප්‍රියෙල් 18වන දින මේ වගේ ප්‍රහාරයකින් මගේ දුවත් තුවාල ලැබුවා. එක් වෙඩි උණ්ඩයක් ඇය ගේ මුහුනට වැදුන අතර ඒ නිසා එයාගේ කටේ ඔක්කෝම දත් ගැලවි ගියා. අද ඒ ළමයා ඉගෙන ගන්නවා.

**ආචාර්ය රෝහාන් පෙරේරා මහතා.:** හමුදව ඔබගේ දුවට වෙඩි තබනවා ඔබ දුටුවාද?

**සාක්ෂිකරු:** ඔව් මම දැක්කා.

**ආචාර්ය රෝහාන් පෙරේරා:** දෙපැත්තම වෙඩි තියා ගන්නවා. යුද්ධ හමුදව සිතා මතා ම ඔබ ගේ දුවට වෙඩි තබන්නට නැතුව ඇති. දෙපැත්ත ම වෙඩි තියා ගන්න කොට එහෙම වෙන්න පුළුවන්.

**සාක්ෂිකරු:** ඔව්. දෙපැත්තම වෙඩි තියා ගත්තා තමයි. ඒත් එල් ටි ටි ඊ ය මේ ආරක්ෂ කලාපය ඇතුලේ ඉඳලා වෙඩි තියලා පැනලා යනවා. නමුත් එල් ටි ටි ඊ යෙන් පළි ගැනීම ට හමුදව සිවිල් ජනතාවට වෙඩි තියනවා. මේ නිසා හානිය වෙන්නේ ජනතාවටමයි. එක දවසක් එල් ටි ටි ඊ ය විසින් ගැබිනි මව්වරුන් ට හා ත්‍රිපෝෂ දෙනවා කියලා කාන්තාවෝ හා ළමයි සාමාන්‍යයෙන් ඒවා බෙද දෙන ස්ථානයේ රැස් වි සිටියා. මේ අවස්ථාවේ එල් ටි ටි ඊ සාමාජිකයෝ 'වෝකි ටෝකිස්' පාවිච්චි කලා. ඒ ගුවන් විදුලි සංඥා අනුව ක්‍රියා කළ හමුදව මෙම ස්ථානයට ගුවනින් පහර දුන්නා. මේ පහර දීම නිසා 40-45 විතර කාන්තාවෝ සහ ළමයි තුවාල ලැබුවා. ඒ වගේ ම ටැමිල් රිහැබිලිටේෂන් ඕගනයිශේෂන් කියන සංවිධානය විසින් ළමයින්ට කැඳ බෙද දෙන මධ්‍යස්ථානයක් තිබුනා මේ ප්‍රදේශයේ. ළමයි රැස් වෙලා ඉන්න වේලාවක එතනටත් හමුදව ප්‍රහාර එල්ල කළා.

**මහාචාර්ය කරුණාරත්න හඟවත්ත:** ඔබ මේ සියල්ල දන්නේ කොහොමද ? ඔබ මේ සෑම තැනකම හිටියා ද?.

**සාක්ෂිකරු:** මේ කියන සිද්ධීන් වෙන කොට මම එම ප්‍රදේශයේ සිටියා.

**මහාචාර්ය කරුණාරත්න හඟවත්ත මහතා :** කොයි කාලේ ද?

**සාක්ෂිකරු:** 2009 අප්‍රියෙල් මාසයේ. මගේ දුවට වෙඩි වැදුනට පස්සේ මම එයාව පුදුමතලාන් රෝහලට ඇතුල් කළා. එම රෝහල් එල් ටි ටි ඊ පාලනය යටතේ තිබුන රෝහලක්. එල් ටි ටි ඊ සාමාජිකයින් හා ඔවුන් ගේ පවුල් වල අයට එහි විශේෂ සැලකිලි තිබුනා. බරපතළ ලෙඩ්ඩු ත්‍රිකුණාමලයට නැවෙන් ගෙන ගියා. එතකොට එල් ටි ටි ඊ සාමාජිකයින්ට හා ඔවුන් ගේ පවුල් වල අයට ප්‍රමුඛත්වයක් ලැබුනා. මමවත් මගේ පවුලේ අයවත් එල් ටි ටි ඊ යට සම්බන්ධ නැති නිසා දුවව ත්‍රිකුණාමලයට ගෙනි යන්න රෝහල් කාර්ය මන්ඩලය උනන්දු වුනේ නැහ. මම අත් දෙක ඔස්සලා වැන්ද කොහොම හරි මගේ දුව නැවෙන් ත්‍රිකුණාමලයට යවන්න කියලා. අන්තිමේ දි දුව නැවෙන් ත්‍රිකුණාමලයට යැව්වා. එයා එතනින් කන්තලේටත් පසුව වවුනියාවටත් මාරු කලා.

**මහාචාර්ය කරුණාරත්න හඟවත්ත :** ඔබගේ දුවට වෙඩි වැදුනේ කවදද?

**සාක්ෂිකරු:** 2009 අප්‍රියෙල් 15 වන ද. එල් ටි ටි ඊ සංවිධානය මට මගේ දුව ඒ සංවිධානයට බඳවන්න ඉතා විශාල බලපෑමක් කළා.

**පරාක්‍රම පරණගම මහතා:** ඔබ පළා යද්දි වැඩියෙන් ම පීඩනය ආවේ එල් ටි ටි ඊ යෙන් ද එහෙම නැත්නම් රජයේ හමුද වලින් ද?

**සාක්ෂිකරු:** අපිට හුඟක් කරදර තිබුනේ එල් ටි ටි ඊ සංවිධානයෙන්. යුද්ධ හමුදවෙනුත් කරදර නොතිබුනා නොවේ. 2009 අප්‍රියෙල් 24 වන දින යුද්ධ හමුදව පුදුමතලාන් ප්‍රදේශයට ඇතුල් වුනා.

**ආචාර්ය රොහාන් පෙරේරා:** මට සිද්ධ වුන දෙය හරියටම පැහැදිලිව දැන ගන්න අවශ්‍යයයි. දැන් ඔබේ දියණිය තුවාල වෙලා. එතකොට එයා එල් ටි ටි ඊ සාමාජිකයින් ට හා ඔවුන් ගේ පවුලේ උදවියට පමණයි රෝහලේ ප්‍රමුඛත්වය දෙන්නේ. එතකොට ඔබට දුවට ප්‍රතිකාර ගන්න වෛද්‍යවරයාට වදින්නත් වෙනවා. කොයි අවස්ථාවේ ද එල් ටි ටි ඊ සංවිධානය ඔබේ දියණිය බඳවා ගැනිමට වැයම් කළේ?.

**සාක්ෂිකරු:** ඒ 2009 අප්‍රියෙල් 15ත් 20 ත් අතර. ඔවුන් ගේ උත්සාහය මට වළක්වා ගන්න පුළුවන් වුනා. එහෙත් හුගක් අයට එසේ කරන්න බැරි වුන නිසා ඒ ගොල්ලන්ට තමන් ගේ දරුවන් අහිමි වුනා.

**ආචාර්ය රොහාන් පෙරේරා:** කලින් ඔබ කිව්වා ඔබ ඔවුන්ට බැගෑපත් වුනා කියලා.

**සාක්ෂිකරු:** මම බැගෑපත් වුනේ එම රෝහල එල් ටි ටි ඊ සාමාජිකයින් හා ඔවුන් ගේ පවුල් වල අයට ප්‍රමුඛත්වය දුන් රෝහලක් නිසා. ඒ නිසා මම අත් දෙක එකතු කොට දෙස්තරට වැන්ද. අන්තිමේ දි ඔවුන් දුවව නැවෙන් ත්‍රිකුණාමලයට පිටත් කළා.

අප්‍රියෙල් 23 හෝ 24 වනද උදසන වන විට යුද්ධ හමුදව පුදුමතලාන් හා අම්බලන්කෝනායි වලට ඇතුළ් වුනා. යුද්ධ හමුද වෙඩි තිබ්බත් අවසානයේ දි අපිව බංකර් වලින් එළියට අරගෙන ආරක්ෂිත ස්ථානයකට රැගෙන ගියා. 25වනද අපිව තවත් පවුල් ගණනාවක් සමග චෙට්ටිකුලම් වලට රැගෙන ගියා.

මේ ඔක්කෝම මගේ අත් දැකිම්. මට මතක හැටියට කිව්වේ.

ශ්‍රී ලංකා යුද්ධ හමුදව විසින් දැනුවත් ම පුදුකුඩුඉරිප්පු රෝහලට 2009 පෙබරවාරි මස ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළ බවට චෝදනා එල්ල වේ.[58] මෙම සිද්ධිය ඇසින් දුටු සාක්ෂිකරුවෙක් වු වෛද්‍ය ටි. වර්ධරාජා මහතාය. ඔහු එම අවස්ථාවේ දි පුදුකුඩුඉරිප්පු රෝහලේ සේවයේ යෙදි සිටි රජයේ වෛද්‍යවරයා වු අතර යුද්ධය නිම වු විගසම ඔහු රජයේ ආරක්ෂක හමුද විසින් අත් අඩංගුවට ගන්නා ලදි. උගත් පාඩම් සංහිඳියා කොමිෂන් සභාව ඉදිරියේ ඔහු සාක්ෂි දුන් අවස්ථාවේ දි ඔහු ගෙන් නොකඩවාම ප්‍රශ්න කරන ලද්දේ එල් ටි ටි ඊ හමුද රෝහළ් පරිශ්‍රය හා ඒ අවට ආයුධ සන්නද්ධව ස්ථාන ගත වි සිටි ආකාරය ගැන මිස රජයේ හමුද විසින් එම රෝහළට බෝම්බ හෙළිම පිළිබඳ චෝදනාව ගැන නොවේ.[59] ( වෛද්‍ය වර්ධරාජා අත් අඩංගුවේ සිටියදි රජය විසින් සංවිධානය කරන ලද මාධ්‍ය සාකච්ඡාවකට පෙනි සිටිමින් කළින් කරන ලද ප්‍රකාශයන් ට හාත්පසින් ම ප්‍රතිවිරෝධි ප්‍රකාශයන් සිදු කරන ලද්දේය.)[60]

**වෛද්‍ය වර්ධරාජා හා කොමසාරිස්වරුන් කොළඹ පැවති සැසියේ දි සිදු වු සාකච්ඡාවෙන් උපුටා ගත් කොටස් කිහිපයක් පහත දැක්වේ.**

**චන්දිරපාල් චන්මුගම් මහතා:** වෛද්‍ය වර්ධරාජා ඔබ පුදුකුඩුඉරිප්පු රෝහලින් පිට ව ගියේ කවද ද?

**වෛද්‍ය වර්ධරාජා:** පෙබරවාරි 3 නැත්නම් 4 උදේ.

**චන්දිරපාල් චන්මුගම් මහතා:** එම අවස්ථාවේ දි රෝහලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වෙමින් තිබුනා ද?

---

[58] බලන්න ' පි ටි කේ රෝහලට ශ්‍රී ලංකා යුද්ධ හමුදව විසින් බෝම්බ හෙළිම' විද්වත් කමිටු වාර්තා 25-26 පිටු

[59] වෛද්‍ය ටි වර්ධරාජා මහතා ගේ සාක්ෂිය: 2010 නොවැම්බර් 30 , http://www.llrc.lk/images/stories/LLRC_30.11_-_Dr._T.Vartharajah.pdf

[60] ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය: වෛද්‍යවරු සතර දෙනෙක් නිදහස්: තවත් එක් අයෙක් අනතුරේ: (UA: 129/09 Index: ASA 37/020/2009) http://www.amnesty.org/en/library/asset/ASA37/020/2009/en/829e6aef-4a2a-4862-97dd-c8a40405b3bd/asa370202009eng.html

**වෛද්‍ය වර්ධරාජා**: පෙබරවාරි 4 වනදා අපේ නිදහස් දිනය. මිනිස්සු අතර කටකථාවක් තිබුනා පෙබරවාරි 4 වන යුද්ධ හමුදාව පුදුකුඩුඉරිප්පු එදාට අල්ල ගන්නවා කියලා.මේ කියන දින රාත්‍රි පුදුකුඩුඉප්පු අවට ඒ කියන්නේ මීටර් 500 වගේ ඇතුළත තද සටන් පැවතුනා. ආරක්ෂාව පිණිස මිනිස්සු රෝහල් පරිශ්‍රය තුළ එක් රැස් වන්නට පටන් ගත්තා. මේසේ පැමිණි පිරිස ගෙන් වැඩි පිරිසකුත් රෝහල් කාර්‍ය මණ්ඩලයත් බංකර් ඇතුළට ගිහින් හිටිය නිසා මට බංකරයක් ඇතුළට යන්න බැරි වුනා. මමත් තවත් දෙදෙනෙකුත් ආරක්ෂිත තාප්පයක් අසළ රැදී සිටියා. ෂෙල් වෙඩි ප්‍රහාර ඉතාමත් ළඟින් ම ඇසුන අතර කොයි වෙලේ හරි ඒවා අපේ ඔළුවට වැටෙයි කියලාත් හිතුනා.

**චන්දිරපාල් චන්මුගම්**: එල් ටි ටි ඊ ය සතුව පැවති බර ආයුධ මෙතන තිබුනා ද? ඒවා රෝහලින් කොපමණ දුරින් ද තිබුනේ?

**වෛද්‍ය වර්ධරාජා**: මට හරියට ම කියන්න බැහ. නමුත් රෝහල ආසන්නයේ තිබුනා යැයි කියන්නට පුළුවන්.

**සභාපති**: දැන් ඔබ කීවා රෝහළ ආරක්ෂිත ස්ථානයක් නිසා සෙනඟ එම ස්ථානයට එක් රොක් වු බව.

**වෛද්‍ය වර්ධරාජා**: ඔව්.

**සභාපති**: එතකොට එල් ටි ටි ඊ සාමාජිකයෝ රෝහළට ඇතුල් වුනේ නැද්ද?

**වෛද්‍ය වර්ධරාජා**: සාමාන්‍යයෙන් ආයුධ සන්නද්ධව හා නිල ඇඳුම් ඇඳ ගෙන එල් ටි ටි ඊ සාමාජිකයින් ට රෝහළ පරිශ්‍රයට ඇතුළ් වන්නට ඉඩ දෙන්නේ නැහ. ඔවුන් රෝහලට එන්නේ තුවාලයක් සිදු වුනොත් පමණි.

**පරාක්‍රම පරණගම මහතා**: මිනිසුන් ආරක්ෂිත ස්ථාන කරා යාම එල් ටි ටි ඊ විසින් වැළැක්වුවාද?

**වෛද්‍ය වර්ධරාජා මහතා**: එල් ටි ටි ඊ පාලන ප්‍රදේශයන් ගෙන් පිටතට යාමට ඔවුන් ගේ අවසර පත්‍රයක් ලබා ගත යුතුයි. මෙය වෛද්‍යවරුන්ටත් අදාළයි. ඔවුන් මෙම තත්වය අන්තිම මොහොත දක්වා ම පවත්වා ගත්තා.

**සභාපති**: ඒ කියන්නේ ඔවුන් ගේ අවසරයක් නොමැතිව එල් ටි ටි ඊ පාලන ප්‍රදේශයෙන් පිටතට යන අයට ඔවුන් වෙඩි තිබ්බා?

**වෛද්‍ය වර්ධරාජා**: මම එහෙම සිද්ධීන් සිදු වු බව අසා තිබෙනවා. නමුත් කවදාමත් ඇසින් දැක නැහ. පුදුමතලාන් හා මුල්ලිවයික්කාල් හි මිනිසුන් එසේ කථා කළා.

**පරාක්‍රම පරණගම මහතා**: හමුදාව විසින් පාලනය කළ ප්‍රදේශයන් ට පිටත්ව යාම සඳහා අවසර පත්‍රයක් නිකුත් කළේ කුමන පදනමක් මත ද?

**වෛද්‍ය වර්ධරාජා**: සාමකාලයන් හි දි ඒ කියන්නේ යුද්ධයට පෙර ඔවුන් යම්කිසි සාධාරණ හේතුවක් සඳහන් කළ යුතුයි. ( මංගල උත්සවයකට: මරණයකට යනාදි වශයෙන්) මෙය වෛද්‍යවරුන් ටත් වලංගු නීතියක්. නමුත් යුද්ධය පටන් ගත්තා ට පස්සේ එල් ටි ටි ඊ පාලන ප්‍රදේශයන් ගෙන් පිටව යාමට ඉඩ දුන්නේ බරපතළ ලෙස තුවාල ලැබු අයට පමණයි යන්න ඉඩ දුන්නේ.

**සභාපති**: ඒ කියන්නේ යුද්ධය පැවති සමයේ බරපතළ ලෙස තුවාල නොලැබුවෙකුට එල් ටි ටි ඊ පාලන ප්‍රදේශයෙන් පිටව යාමට අවසර දුන්නේ නැහ.

**වෛද්‍ය වර්ධරාජා**: අවසර පත්‍රයක් ලබා ගන්නට බැරි අය එක්කෝ හිමිදිරි පාන්දරම එසේත් නැත්නම් ආණ්ඩුවේ පාලන ප්‍රදේශ ආසන්නයේ හමුද හටයින් ගැවසෙන ස්ථාන අසලින් රජයේ පාලන ප්‍රදේශයන් ට ඇතුළ් වුනා. මේක දිනපතා සිද්ධ වෙච්ච දෙයක්.

**සභාපති**: ඒ කියන්නේ එල් ටි ටි ඊ ය දුටුවොත් යම්කිසිවෙක් අවසර නැතිව පලා යනවා ඔවුන්ට වෙඩි තියනවා.

**වෛද්‍ය වර්ධරාජා**: ඔව්.

**පරාක්‍රම පරණගම මහතා**: එල් ටි ටි ඊ සිවිල් වැසියන්ට නිදහසේ රජයේ පාලන ප්‍රදේශයන් ට යාමට ඉඩ දුන්නා නම් තුවාල ලැබුවන් ගේ සංඛ්‍යාව මීට වඩා අඩු විමට ඉඩ තිබුනා.

**වෛද්‍ය වර්ධරාජා**: ඒක ඉතාමත් ප්‍රත්‍යක්ෂ දෙයක්. කවුරුත් දන්නවා.

**මහාචාර්ය කරුණාරත්න හඟවත්ත**: ඔබ කීවා පුදුකුඩියුරුප්පු  රෝහළ තාප්පයක් අසළ රැඳි සිටිය දි ඒ අවට ෂෙල් වෙඩි පත්තු වෙන ශබ්දය ඇසුනා කියා. මම අහන්නේ ....

**වෛද්‍ය වර්ධරාජා**: ඒ ශබ්දය අති විශාලයි. මම හිතුවේ ෂෙල් වෙඩි මගේ ඔළුවට වැටෙනවා කියලා.

**මහාචාර්ය කරුණාරත්න හඟවත්ත** : මම අහන ප්‍රශ්නය ඒක නෙවෙයි. රෝහළ පරිශ්‍රය ආසන්නයේ එල් ටි  ටි ඊ ය විසින් කාලතුවක්කු අටවා තිබුනා ද?

**වෛද්‍ය වර්ධරාජා**: යුද්ධය ඉතාමත් දරුණු විධියට ගියා. ඒ නිසා අපි කවුරුවත් රෝහලින් පිටතට ගියේ නැහ.

**සභාපති**: නමුත් ඔබ කීවා එල් ටි ටි ඊ බර ආයුධ රෝහළ අවට අටවා තිබුනා කියලා.

වෛද්‍ය වර්ධරාජා: මට කාලතුවක්කු වල ප්‍රමාණය හෝ වර්ග ගැන දැනුමක් නැහ. නමුත් ඒවායින් පිට වු ශබ්දය අනුව එම කාලතුවක්කු රෝහළ පරිශ්‍රය ආසන්නයේ දි පාවිච්චි කළ බව පැහැදිලියි.

**මහාචාර්ය කරුණාරත්න හඟවත්ත**: ප්‍රශ්නය ඒක නොවෙයි. මම හිතන්නේ ප්‍රශ්නය වැරදියට තේරුම් ගත්තා. මම අහන්නේ එල් ටි ටි ඊ කාලතුවක්කු රෝහළ පරිශ්‍රය ආශ්‍රිතව ස්ථාන ගත කර තිබුනා ද කියලයි ?

**වෛද්‍ය වර්ධරාජා**: ඒවා රෝහළ පරිශ්‍රය ආසන්නයේ ස්ථාන ගත ව තිබුනා ද කියලා මට කියන්න බැහ. නමුත් ශබ්දය අනුව රෝහළ පරිශ්‍රය ආසන්නයේ පිහිටා තිබු බව කියන්න පුළුවන්.

**මහාචාර්ය කරුණාරත්න හඟවත්ත**: ඔබ මෙම රෝහලේ සේවය කළ නිසා ඔබට කියන්න පුළුවන් කම තිබෙන්නට ඕනෑ එල් ටි ටි ඊ කාලතුවක්කු රෝහළ ආශ්‍රයේ පිහිටා තිබුනා ද නැද්ද කියලා ?

**වෛද්‍ය වර්ධරාජා**: මම එලියට ගියා නම් ෂෙල් වෙඩි ප්‍රහාර වලින් මැරෙනවා. මේ නිසා එලියට යාම අවදනම් බව අපි දන්නවා. අපි කාටවත් අපේ ජිවිත අවදානමකට ලක් කරන්නට අවශ්‍ය නෑ.

**චන්දිරපාල් චන්මුගම් මහතා**: තව එක ප්‍රශ්නයක්. ඔබ රෝහළ ඉවත් කර ගන්නා විට ඔබ රෝගීන් ද රැගෙන ගියා. ඇත්ත වශයෙන් ම ඔබ රෝහළ හිස් කළා. ඒ නිසා කිසිම කෙනෙකුට තුවාල වෙන්න ඉඩක් නැහ. කාට හරි තුවාල වුනා ද?

**වෛද්‍ය වර්ධරාජා**: අපි රෝහල් පරිශ්‍රයෙන් පලා යන විට සියළු ම රෝගීන් ද රැගෙන යාමට වග බලා ගත්තා. ඒ වන විට රෝහළ තුල බස් රථයක් ගිලන් රථයක් හා ලොරියක් තිබුනා. අපි මේ වාහන පාවිච්චි කර රෝගීන් වෙනත් ස්ථානයකට ගෙන ගියා.

## බලහත්කාර පැහැර ගෙන යාම හා අතුරුදහන් කිරිම:

යුද්ධය නිසා ආගිය අතක් නොමැති තැනැත්තන් හා බලහත්කාරයෙන් රැගෙන ගොස් අතුරුදහන් වුවන් පිලිබඳ පැමිණිලි බොහෝමයක් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවට ලැබි තිබින. සාක්ෂිකරුවන් බොහෝමයක් සිය ප්‍රකාශ වලදී මේ සම්බන්ධයෙන්
ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවේ විශේෂයෙන් ම යුද්ධ හමුදාවේ හා විශේෂ කාර්‍ය බලකායේ ද , කරුණා, ඊ පි ඩි පි හා එල් ටි ටි ඊ වැනි ආයුධ සන්නද්ධ කණ්ඩායම් සාමාජිකයින් ද චූදිතයින් වශයෙන් නම් කරන ලදි. දැනට ප්‍රසිධ කොට ඇති තොරතුරු වලට අනුව කොමසාරිස්වරුන් මෙම චූදිතයින් හඳුනා ගැනිම සම්බන්ධයෙන් විස්තර ලබා ගැනිමට කිසිදු උනන්දුවක් නොදක්වූ අතර ආගිය අතක් නොමැති තැනැත්තන් නැවත සොයා ගැනිම පිණිස විමර්ශනයන් ආරම්භ කිරිමට උනන්දු නොවිය. බලහත්කාරයෙන් අතුරුදහන් කිරිම මුලික මානව හිමිකම් උල්ලංඝණයක් වන අතර තවමත් පසුගිය දශක තුන තුළ ශ්‍රී ලංකාවේ ඉහළ මට්ටමක පැවති බලහත්කාරයෙන් කළ අතුරුදහන් විම් සම්බන්ධයෙන් කිසිදු අපරාධකරුවෙක් හඳුනා ගෙන දඩුවම් කිරිම ඉලක්ක කර ගත් විමර්ශනයක් සිදු නොවිය. තවද බලහත්කාර අතුරුදහන් කිරිම ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය යටතේ වරදක් නොවන අතර උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව මෙබඳු ප්‍රශ්න සම්බන්ධයෙන් වගවිම ස්ථාපිත කිරිමට කිසිදු උත්සාහයක් නොගත්තේය.
උදහරණයක් වශයෙන්, එක් සාක්ෂිකාරියක් සිය පුතා ඇතුළු තරුණයන් පස් දෙනෙක් බලහත්කාර අතුරුදහන් කිරිම පිලිබඳව සිය සාක්ෂියේ දි සඳහන් කළත් කොමසාරිස්වරුන් තවදුරටත් ප්‍රශ්න විචාරීම මගින් අතුරුදහන් වුවන් පිළිබඳව සොයා බැලිමටවත් වගකිව යුතු ආරක්ෂක අංශ නිලධාරීන් හඳුනා ගැනිමටවත් උනන්දුවක් නොදැක්වීය.

**මඩු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය: 2011 ජනවාරි 9 සාක්ෂි අංක 21** [61]

**සාක්ෂිකාරිය:** මගේ පුතා ඇතුළු තරුණයින් පස් දෙනෙක් වන්නාකුලියන්කුලම් හි පිහිටි වැවේ ධිවර රැකියාව කරමින් සිටියා. මේ වැව අසල ගුවන් හමුදාවේ හා යුද්ධ හමුදාවේ කඳවුරු පිහිටුවා තිබුනා. 2007 මැයි 17 වනදත් ධිවර රැකියාව පිණිස මේ කන්ඩායම වන්නාකුලියන්කුලම් වැවට පිටත් ව ගියා. වැව ආසන්නයේදි යුද්ධ හමුදාව විසින් අත් අඩංගුවට ගත් මේ පිරිසට ඔවුන් ගේ කමිස ගලවා අත් ඔසවා ගෙන සිටින ලෙස නියෝග කොට ඔවුන් කඳවුර තුළට ගෙන යනු වැව ආසන්නයේ ධිවර කර්මාන්තයේ යෙදි සිටි වැඩිහිටියන් දෙදෙනකු දැක තිබුනා. සවස් භාගයේ මේ පණිවුඩය අපට ලැබුනත් අපි කඳවුරට යන්න විධියක් තිබුනේ නැහ අන්ධකාර විමට ආසන්න වු නිසා. අපි හමුද කඳවුරට ගොස් මේ ගැන පැමිණිලි කළා. අතුරුදහන්විම පිළිබඳව කිසිත් නොදන්නා බව කි ඔවුන් කැලෑව

[61] සාක්ෂි අංක 21: ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඩු 2011 ජනවාරි 9

තුල මේ තරුණයන් සොයන්නට සාහය දෙන බව කියා අපව ආපසු පිටත් කලා. ගමේ මිනිස්සු ඔක්කෝම ඒ කියන්නේ සිය ගණනක් අවට කැලෑව පීරා බැලුවත් ඔවුන් හමු වුනේ නැහ. හමුදුව සාහය දෙනවා කිව්වට සාහය දුන්නේත් නැහ.

**මහාචාර්ය කරුණාරත්න හඟවත්ත:** මේ සිද්ධිය වුනේ කවද ද?

**සාක්ෂිකාරිය:** 2007 මැයි 17 වනද. අපි අන්තර් ජාතික රතු කුරුස සංවිධානය ඇතුළු සියළුම බලධාරීන්ට මේ ගැන දැනුම් දුන්නා. අද දක්වා මේ තරුණයන් පිළිබඳව කිසිම තොරතුරක් නැහ.

**සභාපති:** අපි උත්සාහ කරල බලන්නම් යම් කිසි කඳවුරක මේ අය ඉන්නවා ද කියලා බලන්න.

**සාක්ෂිකාරිය:** ස්තුතියි

තවත් එක් අවස්ථාවක දි මවක් එල් ටි ටි ඊ ය විසින් සිය පුතා පැහැර ගෙන ගිය බව කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කළ විට කොමසාරිස් වරුන් ගේ ප්‍රතිචාරය වුයේ එල් ටි ටි ඊ ය විසින් කරනු ලැබු අපරාධ සම්බන්ධයෙන් රජයට වගකිමක් නොමැති බවයි.

**සිරිපාල පලිහක්කාර මහතා:** (පරිවර්ථක මගින්) කරුණාකර සිය දරුවා රැගෙන ගොස් තිබෙන්නේ එල් ටි ටි ඊ සංවිධානයෙන් නිසා රජයට වගකිමක් ගැනිමට අසීරු බව මැයට කියන්න. ඇයගේ ශෝචනීය කථා පුවතට අපිත් කණගාටු වන බවත්, සභාපතිවරයා ආරක්ෂක බලධාරීන් මගින් මේ දරුවා යම්කිසි ස්ථානයක සිටින්නේ දැයි සොයා බලන බවත් කියන්න.[62]

## බාර වු එල් ටි ටි ඊ නායකයින් බලහත්කාර අතුරුදහන් කිරිම පිළිබඳ චෝදනාව:

කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙන ලද ඇතැම් සාක්ෂිකරුවන් යුද්ධයේ අවසාන අදියරේ දි මුලතිව් හි දි රජයට භාර වු එල් ටි ටි ඊ නායකයින් බස් රථ වලට නංවා ගත් බව තමන් ඇසින් දුටු බව කියා සිටි අතර ඉන් පසු ඔවුන් අතුරුදහන් වි ඇතැයි කියා සිටියෝය.
2010 නොවැම්බර් මස අරියාලේ හි දි සාක්ෂි දුන් කාන්තාවක් 2009 මැයි 18 වන දින
(මුලතිව් හිදි) තම සැමියා ඇතුළු පනස් දෙනෙකුට ආසන්න පිරිසක් රජයට බාර වු පසු බස් රථ වලට නංවා ගත් බව කියා සිටියාය.[63] තවත් කාන්තාවක් තමන් එබඳු බස් රථ දහසයක් ගණන් කළ බව කියා සිටියාය. මෙසේ බස් රථ වලට නංවා ගත් පිරිස අතර, ඉලම්පත්ත්‍රි (පුදුකුඩුඉරියප්පු හි දේශපාලන නායක), රූබන්, බාබු හා වෙලාවන්, එල් ටි ටි ඊ කවියෙක් වු පුතුවාහි රතිමන්තුරෙයි, අධ්‍යාපන අංශය භාර ව සිටි බේබි සුබ්‍රමනියම් හා කලක් එල් ටි ටි ඊ අන්තර් ජාතික අංශය භාර ව සිටි තයිලගර් යන අන්වර්ථ නාමයන් ගෙන් හඳුන්වන ලද එල් ටි ටි ඊ නායකයින් සිටි බව තවත් සාක්ෂිකාරියක් කියා සිටියාය.

[62] සාක්ෂි අංක 8: ප්‍රාදේශීය ලේකම් කාර්යාලය: නැදුන්කර්නි අගෝස්තු 11 2010

[63] සාක්ෂි අංක 1: අරියාලේ 2010 නොවැම්බර් 11

බන්දවාලෙයිහි දි සාක්ෂි දුන් එක් සාක්ෂිකාරියක් 2009 මැයි 18 වන දින රජයට බාර වු පසු අතුරුදහන් වු තැනැත්තන් අතර තම පුතා පමණක් නොව පුජකවරයෙක් හා ඔහු සමග භාර වු තරුණියන් කිහිප දෙනෙක් හා අත දරුවෙක් ද සිටි බවකියා සිටියේය. කොමසාරිස්වරුන් විසින් මෙම සාක්ෂිකරුවන් ගෙන් රජයට භාර වු එල් ටි ටි ඊ නායකයින් අත් අඩංගුවට පත් පසු අතුරුදහන් විම පිළිබඳ සිද්ධීන් ට වගකිව යුතු යුද්ධ හමුද නිලධාරීන් හදුනා ගැනිමට අවශ්‍ය ආකාරයේ ප්‍රශ්න කිරිම් දක්නට නොලැබින.

**කන්දවාලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයඃ සාක්ෂි අංක 3ඃ**[64]

**සාක්ෂිකාරියඃ**2009 මැයි 17 වන ද අපි රැදි සිටියේ මුලතිව් හි වඩුවායිකල් ප්‍රදේශයේ. 18 වනද උදෑසන 10.00 ට පමණ යුද්ධ හමුදව ශබ්ද විකාශන යන්ත්‍ර මගින් නිවේදනයක් නිකුත් කරමින් එල් ටි ටි ඊ සංවිධානය සමග සම්බන්ධකම් තිබු සියළු දෙනාටම තමන් වෙත භාර වෙන ලෙස දැනුම් දුන්නා. පුජ්‍ය ප්‍රැන්සිස් හා පුජ්‍ය රෙජිනොල්ඩ් යන දෙදෙනා වඩුවායිකල් හි සිටි මගේ ළමයි හතර දෙනාත් ඇතුළුව එල් ටි ටි ඊ සම්බන්ධකම් තිබු තැනැත්තන් සමග ගොස් රජයට භාර වුන හැටි මම ඇස් දෙකින් දැක්කා.

**සභාපතිඃ** ප්‍රැන්සිස් පියතුමා දැන් කෝ?

**සාක්ෂිකාරියඃ** මමත් එයාව හොයනවා කොහේ ඉන්නවාද දන්නේ නැහ.

**සභාපතිඃ** රෙජිනොල්ඩ් පියතුමා කෝ?

**සාක්ෂිකාරියඃ** මම එයාවත් හොයනවා. ඔවුන් කොහේ දැයි මා දන්නේ නැහ.

**සභාපතිඃ** ඔබේ දරුවන් ඉන්නේ කොහේ ද කියා ඔබට යම් අදහසක් තිබෙනවාද?

**සාක්ෂිකාරියඃ** මමත් හොයනවා.එහෙත් තව ම ආරංචියක් නැහ. මම හුදකලා වෙලා ඉන්නේ. මම හැම තැනම හොයනවා ඒත් තවම දරුවන් හමු වුනේ නැහ. මම හිතනවා ඔබෙන් මට සතුටුදයක පිළිතුරක් ලැබේයැයි කියා. අඩුම තරමින් අනාගත පරපුරවත් සාමයෙන් ජිවත් විය යුතුයි. මම මුදල්වත්, ඉඩම් හෝ දේපළ ඉල්ලන්නේ නැහ. මගේ එකම වස්තුව වුනේ දරුවන්. ඒ අය මට ලබා දෙන්න. වැඩිමහල් දරුවා, එයා එල් ටි ටි ඊ සාමාජිකයෙක් නිසා වරදක් කර තිබෙනවා නම් හොයලා බලලා දඩුවම් දෙන්න. ඒත් අනික් පොඩි ළමයින් එල් ටි ටි ඊ සාමාජිකයින් නොවෙයි. ඇයි ඒ කුඩා ළමයින් පියතුමා සමග යුද්ධ හමුද විසින් අත් අඩංගුවට ගත්තේ.

**සභාපතිඃ** ඔවුන් ගේ වයස කීයද?

**සාක්ෂිකාරියඃ** බෑනාට 32 යි. දුවට 29යි. ළමයි ඉපදුනේ 2006 දි.

**සභාපතිඃ** ඒ අයත් භාර දුන්නාද?

**සාක්ෂිකාරියඃ** මුළු පවුලම අත් අඩංගුවට ගත්තා. ප්‍රැන්සිස් පියතුමා බෑනායි දුවයි ළමයි දෙන්නායි අර ගෙන ගියා. මම පියතුමාට ආයාචනය කළා ළමයිව තියලා යන්න කියලා.

[64] සැසිවාරයඃ කන්දවාල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2010 සැප්තැම්බර් 19

නමුත් පියතුමා කිව්වා මුළු පවුලම භාර වෙන්න ඕනෑ කියලා ළමයින් ගේ අත් දෙකෙන් අල්ලා ගෙන ගිහින් පියතුමා එක්කම යුද්ධ හමුදාවට භාර වුනා.

**සභාපති:** ප්‍රැන්සිස් පියතුමා ගේ පල්ලිය තියෙන්නේ කොහෙද?

**සාක්ෂිකාරිය:** මම එයාව දන්නේ නැහැ. මම එයාව දැක්කේ භාර වෙන්න යන වෙලාවේ.

**සභාපති:** ඔබේ බෑනා සහ ප්‍රැන්සිස් පියතුමා අතර තිබුන සම්බන්ධය මොකක්ද?

**සාක්ෂිකාරිය:** මගේ බෑනා එල් ටී ටී ඊ සාමාජිකයෙක්. ඔවුන් බස් රථ දහසයකින් ගෙන ගියා. ඔවුන් මුලතිව් හා පිහිටි වඩුවාල් හි සිට ප්‍රධාන පාරට ගෙන ගියා. බෑනා එල් ටී ටී ඊ බස් එකේ හිටියා. නමුත් දුව හා ළමයි ඒ බස් එකේ හිටියේ නැහැ. ඔවුන් ප්‍රැන්සිස් පියතුමා සමග ගියා. පස්සේ 'හොස්ටල් ' එකේ හිටපු කාන්තාවක් මට කිව්වා ප්‍රැන්සිස් පියතුමාව රෝහළට ගෙන ගියා කියලා. මම ප්‍රැන්සිස් පියතුමා පළමු වරට දැක්කේ මගේ පවුල යුද්ධ හමුදාවට භාර දෙන්න ආපු වෙලාවේ. වවුනියාවේ තියෙනවා පොයිකුලම් දේවාලය කියලා දේවාලයක්. එතන මොන්ටිසෝරියක් තියෙනවා. ඒකේ ගුරුතුමීය මට කිව්වා එයා දැක්කා කියලා ප්‍රැන්සිස් පියතුමා යුද්ධ හමුදාව විසින් රෝහළට ගෙන යනවා. ඒ ගුරුතමීය මට කිව්වා එයාට ප්‍රැන්සිස් පියතුමාට කථා කරන්න ඕනෑ වුනත් යුද්ධ හමුදාව හිටිය නිසා බයට කථා කළේ නැහැ කියලා.

**සභාපති:** හොඳයි අපි ඒ ගැන හොයලා බලන්නම්.

## අත්තනෝමතිකව රඳවා තබා ගැනීම:

එල් ටී ටී ඊ සාමාජිකයින්, එසේත් නැත්නම් සාමාජිකයින් යැයි සැක කළ තැනැත්තන් හෝ කිසියම් සම්බන්ධයක් එල් ටී ටී ඊ ය සමග තිබුනේ යැයි සැක කොට අත්අඩංගුවට ගත් තැනැත්තන් පිළිබඳව උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවට සිය ගණනක් පැමිණිලි ඔවුන් ගේ කාලත්‍රයන් හා ඥාතීන් විසින් ඉදිරිපත් කොට ඔවුන් කඩිනමින් නිදහස් කරන මෙන් ඉල්ලා තිබුනි. බොහෝ පැමිණිලි සම්බන්ධයෙන් කොමිෂන් සභාව වැඩි විස්තර ලිඛිත ව ඉල්ලා සිටි අතර එම පැමිණිලි සම්බන්ධයෙන් බලධාරීන් සමග සොයා බලන බවට ප්‍රතිඥාවක් දෙන ලදි. පසු අවස්ථාවන් හි දී විශේෂයෙන්ම කොමිෂන් සභාව සිය අතුරු වාර්තාව නිකුත් කළාට පසුව කොමිෂන් සභාවේ පිලිතුර වුයේ ශ්‍රී ලංකා රජය විසින් 'විශේෂ යාන්ත්‍රණයක්' පිහිටු විමට නියමිත බවත් එමඟින් අත්තනෝමතිකව රඳවා සිටින්නන් කඩිනමින් නිදහස් කිරිමට කටයුතු කරන බවත්ය.

යුද්ධයේ අවසාන අදියරේ දි එල් ටී ටී ඊ ය සමග සම්බන්ධකම් තිබුනේ යැයි සැක කරන ලද තැනැත්තන් 11,000 කට ආසන්න ප්‍රමාණයක් අත්තනෝමතිකව රඳවා ගන්නා ලදි. ඉන් බොහෝ දෙනෙක් යුද්ධ හමුදාවට භාර වු තැනැත්තන්ය. තවත් බොහෝ දෙනෙක් සරණාගත කඳවුරු වලදි අත් අඩංගුවට ගැනින. මෙයින් බහුතර පිරිසක් රජය විසින් 'පුනරුත්ථාපන කඳ වුරු' නමින් හඳුන්වන කඩිනමින් නිර්මාණය කරන ලද රැඳවුම් කඳවුරු තුළ මහේස්ත්‍රාත් වරයෙකුට ඉදිරිපත් නොකොට රඳවා සිටිති. රැඳවියන් ට එරෙහිව චෝදනා ගොනු කොට නොමැති අතර නීතිඥ සහාය ලබා ගැනිමට ද පහසුකම් සලසා නැත. තවද, 1,900 කට ආසන්න පිරිසක් ත්‍රස්ත විමර්ශන ඒකකය විසින් බූස්සේ මෙන් ම කොළඹ ත්‍රස්ත විමර්ශන ඒකකයේ රඳවා ගෙන සිටින අතර ඔවුන් සම්බන්ධයෙන් ද විමර්ශන කටයුතු තවමත්

අවසාන කොට නොමැත. මෙයින් ඇතැම් රැඳවියන් අවුරුදු ගණනාවක් කිසිදු චෝදනාවක් ඉදිරිපත් නොකොට රඳවා ගෙන සිටින රැඳවියන්ය. ක්‍රමක් ක්‍රමයෙන් රැඳවියන් ගේ කාලත්‍රයන් ට හා ඥාතීන්ට සමහර රැඳවියන් මුණ ගැසීමට අවසර ලැබි ඇතත් බොහෝ රැඳවියන්, රැඳවුම් මධ්‍යස්ථානයෙන් රැඳවුම් මධ්‍යස්ථානයට විටින් විට මාරු කිරීම නිසා ඔවුන් ගේ කාලත්‍රයන් ට හා ඥාතීන් ට මෙම රැඳවියන් රඳවා සිටින ස්ථානය දැන ගැනීමට අසීරු වීම නිසා මුණ ගැසීම ද අසීරු කටයුත්තක් වී ඇත.

## 3. උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ රාජ්‍ය පාක්ෂිකභාවය පිළිබඳ සාධකඃ

**ආණ්ඩුවේ සාක්ෂිකරුවන් විභාග කිරීමේ දි ආණ්ඩුවේ කටයුතු පිළිබඳ සවිස්තරාත්මකව විමර්ශනය කිරීමට අසමත් වීම**

සිවිල් වැසියන් කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දීමේ දි ඔවුන් ට නිශේධාත්මක ලෙස සළකනු ලැබුවත් ආණ්ඩුවේ නිලධාරීන් සාක්ෂි දීමේ දි ඔවුන්ට ඉතාමත් හරසරින් සැලකූ බවට සාධක එමට හමුවේ. කොමිෂන් සභා සාමාජිකයෝ කොන්දේසි විරහිතව ම ගෝඨාභය රාජපක්ෂ ඇතුළු රජයේ සාක්ෂිකරුවන් ට රජය විසින් නිරන්තරයෙන් ම 'ශූන්‍ය හානි ' පිළිවෙතක් අනුගමනය කළ බව හා අවසාන ත්‍රිවිධ හමුදා ක්‍රියාන්විතය වනාහි මානුෂික මෙහෙයුමකි යන්න පුන පුනා කීමට මුනිවත රැක්ක බව පෙනී යයි.[65] කොමිෂන් සභාව වෙත ඒ වන විටත් රජයේ හමුදා විසින් යුද්ධ කිරීම පිළිබඳ ජිනීවා සම්මුතිය හා අනෙකුත් නීති බරපතළ ලෙස උල්ලංඝණය කළ බවට සාක්ෂි තිබියදී රජයේ සාක්ෂිකරුවන් ගෙන් ඒ පිළිබඳව සවිස්තරාත්මකව විමසීමට උත්සුක නොවූහ.

**ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින් දෙන ලද සාක්ෂියේ උද්ධෘත කිහිපයක්ඃ**

**ගෝඨාභය රාජපක්ෂ මහතාඃ** ජනාධිපතිවරයා කියා සිටියේ මෙම මෙහෙයුම වනාහි යුද්ධමය ක්‍රියාන්විතයක් නොව උතුරේ ජනතාව මුදවා ගැනීමේ මානුෂික මෙහෙයුමක් නිසා මෙම ක්‍රියාන්විතය මානුෂික මෙහෙයුමක් ලෙසට හඳුන්වන්නට උපදෙස් දුන්නා. ඔබ දන්නා පරිදි වර්ෂ ගණනාවක්ම යුද්ධ හමුදාවේ භාවිතය මෙය නොවූ නිසා කිසි යම් කෙනෙක් මෙය සුළු කොට තකන්නට පුළුවන්. එහෙත් ඉහළ සිට පහළට ජනාධිපතිවරයා විසින් දුන් මෙම පණිවුඩය අනුව ක්‍රියා කළ යුතු වු අතර සියළු දෙනාම විසින් ම මෙම ක්‍රියාන්විතය මානුෂික මෙහෙයුමක් ලෙස සලකා ක්‍රියා කිරීම අපේක්ෂා කළා. ඒ නිසා මෙම ක්‍රියාන්විතය මානුෂික මෙහෙයුමක් ලෙස අපි නම් කළා. මේ අතර තවත් වැදගත් පියවරක් අපි ගත්තා.

---

[65] ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් දෙන ලද සාක්ෂියඃ 2010 අගෝස්තු 17 කොළඹ සැසිවාරය
http://www.llrc.lk/images/stories/docs/August2010/Gotabaya%20Rajapakshe.pdf

තවදුරටත් බලන්නඃ ගුවන් හමුදපති ඩබ්.ආර්.එම්.ජේ.ගුණතිලක 2010 සැප්තැම්බර් 8
http://www.llrc.lk/images/stories/docs/Roshan%20Gunatillake%20-%20Air%20Force%20Commander.pdf

ජනාධිපතිවරයා හා ආරක්ෂක මණ්ඩලය විසින් තීරණය කළා 'ශූන්‍ය හානි ' ප්‍රතිපත්තිය තදින් ම ක්‍රියාත්මක කළ යුතුයි කියා. මේ අනුව සියළුම ක්‍රියාන්විත නියෝග ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට, නාවික හමුදාවට හා ගුවන් හමුදාවට නිකුත් කිරීමේ දී එම නියෝගයන් හි ශීර්ෂයට මෙම සංකල්පය ඇතුළත් කළා. මේ අනුව ඉහළ සිට පහළට ත්‍රිවිධ හමුදාවේ සියළු දෙනාම මෙම සංකල්පය අනුව යමින් ක්‍රියාන්විතයේ දී සිවිල් වැසියන් ට අවම හානියක් වීමේ පදනමේ සිට ක්‍රියා කළා.'[66]

කොමසාරිස්වරුන් රජයේ නිලධාරීන් ගෙන් යුද්ධය පැවති අවස්ථාවේ දී ඒ සම්බන්ධයෙන් මහජනයා වෙත නිකුත් කරන ලද තොරතුරු වල නිරවද්‍යභාවය පිළිඳව කවර අවස්ථාවක දී ප්‍රශ්න නොකළේය.මෙලෙස මහජනයා වෙත නිකුත් කරන ලද තොරතුරු අතර ඉතාමත් මතභෙදයට තුඩු දුන් ප්‍රවෘත්තිය වුයේ වන්නියේ කොටු වී සිටි සිවිල් වැසියන් ගේ සංඛ්‍යාව පිළිබඳ ප්‍රවෘත්තියයි. 2009 ආරම්භයේ දී රජයේ නිල ස්ථාවරය වුයේ වන්නියේ කොටු වී සිටින සිවිල් වැසියන් ගේ සංඛ්‍යාව 100,000 බවයි. පසුව රජය විසින් ම එම සංඛ්‍යාව 300,000 වන බව පිළි ගනිමින් සිවිල් වැසියන් සිටින ප්‍රදේශයන්හි දී ත්‍රිවිධ හමුදාව බර ආයුධ පාවිච්චි නොකරන බව කියා සිටියේය.[67]

කොමසාරිස්වරුන් රජයේ නිලධාරීන් ගෙන් මෙන් ම වගකිව යුතු දේශපාලනඥයින් ගෙන් ද යුද්ධය අවසාන අදියරේ දී සිදු වු මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව සවිස්තරාත්මක ප්‍රශ්න කිරීමක් නොකළහ. කොමසාරිස්වරුන් අමාත්‍ය ඩග්ලස් දේවානන්ද, අමාත්‍ය වී මුරලිදරන් හා නැගෙනහිර පලාත් මහාමාත්‍ය එස් චන්ද්‍රසේකරන් ගේ සාක්ෂි විභාගයේ දී මෙය මැනවින් කැපී පෙනුනි. මෙම තිදෙනාම ද්‍රවිඩ ආයුධ සන්නද්ධ කණ්ඩායම් හි නායකයින් වන අතර ප්‍රධාන ධාරාවේ දේශපාලනයට ඇතුළත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍ය අනුග්‍රහය ද නොමඳව භුක්ති විඳින්නෝය. මොවුන් ගේ අනුගාමිකයෝ බරපතළ මානව හිමිකම් උල්ලංඝණයන් කිරීම පිළිබඳ නිරන්තරයෙන් ම චෝදනා වලට ඉලක්ක වුවෝය. මෙම දේශපානඥයින් තිදෙනාම කොමිෂන් සභාව ඉදිරියට පැමිණි අවස්ථාවන් හි ඉතා දිර්ඝ වශයෙන් ඉඩම් හා නැවත පදිංචි කිරීම ආර්ථික සංවර්ධනය ජාතික ඒකාග්‍රතාවය වැනි ගැටළු පිළිබඳව සාකච්ඡා කළත් අතුරුදහන් වීම් කප්පම් ගැනීම් වැනි ඔවුන් සිය බලය පවත්වා ගෙන යන ප්‍රදේශයන් හි සිදු කරන මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව ප්‍රශ්න කිරීමට ගන්නා ලද්දේ ඉතාමත් සුළු කාලයක් පමණි.

**අමාත්‍ය ඩග්ලස් දේවානන්දඃ**

ඩග්ලස් දේවානන්ද ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නිර්මාතෘ හා නායකයා වන අතර වර්තමාන ආණ්ඩුවේ සම්ප්‍රදයික කර්මාන්ත හා කුඩා කර්මාන්ත විෂය භාර කැබිනට්

[66] ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් දෙන ලද සාක්ෂියඃ කොළඹ සැසිවාරය 2010 අගෝස්තු 10 http://www.llrc.lk/images/stories/docs/August2010/Gotabaya%20Rajapakshe.pdf

[67] ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයඃ ශ්‍රී ලංකාවඃ රජය යුද්ධයේ පරිමාව පිළිබඳ අසත්‍ය තොරතුරු පවසයි. (Index: ASA 37/012/2009) http://www.amnesty.org/en/library/asset/ASA37/012/2009/en/0a7a7b9b-93b8-4dc1-bb2b-3e1955c7e567/asa370122009en.html

අමාත්‍යවරයෙක් වෙයි. ඊ පි ඩි පි පක්ෂය 1990 ගණන් වල දි එල් ටි ටි ඊ සංවිධානයෙන් කැඩි වෙන් වූ අතර එතැන් පටන් ආණ්ඩු සමග කටයුතු කරන යාපනය තුළ බලයක් ඇති පක්ෂයකි. මානව හිමිකම් නිරික්ෂකයින් ගේ වාර්තාවන් ට අනුව ඊ පි ඩි පි පක්ෂය මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව දිර්ඝ ඉතිහාසයක් ඇති පක්ෂයකි. උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව ඉදිරියට පැමිණි සාක්ෂිකරුවන් විසින් ඊ පි ඩි පි පක්ෂය විසින් යුද්ධය අවසාන අදියරේ රජයේ අනුග්‍රහය ලබන ආයුධ සන්නද්ධ කණ්ඩායමක් ලෙසට සිදු කරන ලද පැහැර ගෙන යාම් හා සාවද්‍ය මිනිස් ඝාතන ඇතුළු මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව සාක්ෂි ඉදිරිපත් කරන ලදි.

2010 සැප්තැම්බර් 03 දින පැවති සැසිවාරයේ දි කොමසාරිස්වරයෙක් වූ සිරිපාල පලිහක්කාර මහතා අමත්‍ය ඩග්ලස් දේවානන්ද සමග දිර්ඝ සංවාදයකින් පසුව මේසේ ඇසීය. ' එල් ටි ටි ඊ ය තුරන් කොට හමාරය. නමුත් මෙම කොමිෂන් සභාව ඉදිරියට පැමිණි යාපනයේ වැසියෝ තවමත් එල් ටි ටි ඊ ය විසින් කරන ලද පැහැර ගෙන යාම් හා කප්පම් ගැනිම් ඇතුළු කෲර අවමන් සහගත වධහිංසා වලට සමාන ක්‍රියා තවදුරටත් නොකඩවාම සිදුවන බවත් එය කවරෙක් විසින් කරන්නේ දැයි නොදන්නා බවත් මෙම කොමිෂන් සභාවට පැමිණිලි කර සිටියෝය. ඔබට මේ තත්වය වැළැක්විම පිණිස ඉදිරිපත් කළ හැකි යෝජනා කිසිවක් තිබේද?'[68]

අමාත්‍ය ඩග්ලස් දේවානන්ද ආරම්භයේ දි මේ පිළිබඳ වගකිම එල් ටි ටි ඊ කොටස් තවම ශේෂව සිටින බව ප්‍රකාශ කරමින් ඔවුන් මත වගකිම පැටවිමට උත්සාහ දරමින් ඔවුන් සම්බන්ධයෙන් දැඩි පියවරක් ගන්නා මෙන් කොමිෂන් ් සභාවෙන් ඉල්ලා සිටියේය. කොමසාරිස් පරණගම මහතා නැවත වරක් උත්සහායක් දරමින් ආණ්ඩුව සමග අත්වැල් බැඳ ගෙන සිටින දේශපාලන පක්ෂවලට මෙම චෝදනාව එල්ල වන බව ප්‍රකාශ කළත් ඊ පි ඩි පි පක්ෂයේ නම චුදිතයෙක් වශයෙන් සෘජුවම සඳහන් කිරිමට පසුබට විය.

**පරක්‍රාම පරණගමඃ** අපි ( යාපනයේ දි ) සිවිල් වැසියන් මුණ ගැසුන විට ඔවුන් ආණ්ඩුව හා සම්බන්ධ ද්‍රවිඩ දේශපාලන පක්ෂ හා එම පක්ෂවල අනුගාමිකයින් විසින් බලය අයුතු ලෙස භාවිතා කරමින් වී ගොවීන් ගෙන් කප්පම් ගන්නා බව අප සමග කියා සිටියා. [69]

අමාත්‍ය ඩග්ලස් දේවානන්ද ආණ්ඩු පාක්ෂික දේශපාලන පක්ෂ අනුගාමිකයෝ ආයුධ සන්නද්ධව සිවිල් වැසියන්ට වධහිංසා පමුණුවන බව පිළිගත් අතර දැන් තත්වය පාලනය වි ඇතැයි කියා සිටියේය.

**අමාත්‍ය ඩග්ලස් දේවානන්දඃ** ඔව්. ඔබ හරි. දැන් තත්වය සම්පුර්ණයෙන් ම පාලනය කරලයි තිබෙන්නේ. සමහර ප්‍රශ්න තවමත් ඉතිරි වෙලා තිබෙනවා. ඒවා ගැන මම ප්‍රසිද්ධියේ කථා කරන්නේ නැහ. ඕනෑම සමාජයක හොඳ හා නරක මිනිස්සු ඉන්නවා. විශේෂයෙන් ම පශ්චාත් යුද්ධ කාලීන සමාජයක මෙය සුලබ දෙයක්. ඉස්සර වැටක මායිමකට ආරවුලක් ඇති දුර දිග ගියොත් අර ගන්නේ මන්නා පිහිය. දැන් අර ගන්නේ ටි 56 ක් එහෙම නැත්නම් අත් බෝම්බයක් හරි බිම් බෝම්බයක්. ද්‍රවිඩ ප්‍රජාව තුළ සිද්ධ වූ අවාසනාවන්ත සිද්ධීන් එක්ක

[68] අමාත්‍ය ඩග්ලස් දේවානන්ද විසින් දෙන ලද සාක්ෂියඃ කොළඹ සැසිවාරය 2010 සැප්තැම්බර් 03

[69] ඉහත සාක්ෂිය

අවසානයේ ඇති වු සංස්කෘතිය තමයි මේක. සංහිඳියාව යටතේ ඔබට මේ ගැනත් හිතන්න වෙයි.[70]

මේ අවස්ථාවේ දි සභාපතිවරයා විසින් අමාත්‍ය ඩග්ලස් දේවානන්ද සමග සැසිවාරය අවසාන කළේය.

**නියෝජ්‍ය අමාත්‍ය වි මුරලිදරන්:**[71]

වි මුරලිදරන් (කරුණා හෝ කරුණා අම්මාන් ) ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වර්තමාන උප-සභාපතිවරයා මෙන් ම නැවත පදිංචි කිරිම පිළිබඳ විෂය භාර නියෝජ්‍ය අමාත්‍යවරයා ද වෙයි. නියෝජ්‍ය අමාත්‍ය මුරලිදරන් ගේ දේශපාලනය ආරම්භ වන්නේ එල් ටි ටි ඊ සංවිධානයේ දි නැගෙනහිර පළාත භාර නායකයා වශයෙනි. පසුව එල් ටි ටි ඊ සංවිධානයෙන් කැඩි වෙන් වන ඔහු ටි එම් වි පි හෙවත් තමිල් මක්කල් විදුලායි පුලුක්කාල් පක්ෂය පිහිටුවා ගත් අතර පසුව හෙතෙම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකත්වය ගනිමින් ටි එම් වි පි පක්ෂයෙන් ඉවත් වි ප්‍රධාන දේශපාලන ධාරාවට එක් විය. එල් ටි ටි ඊ සංවිධානය යටතේ නියෝජ්‍ය අමාත්‍ය මුරලිදරන් හට 1990 නැගෙනහිර පළාතේ පොලිස් නිලධාරින් ඝාතනය කිරිම හා මුස්ලිම් සිවිල් වැසියන් ඝාතනය ඇතුළු බරපතළ මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව චෝදනා ලැබුවෙකි.

නියෝජ්‍ය අමාත්‍ය මුරලිදරන් සමග කොමිෂන් සභා සැසිවාරයේ දි වර්තමාන ටි එම් වි පි පක්ෂය විසින් සිදු කරනු ලබන කප්පම් ගැනිම් ඇතුළු වධ හිංසා පිළිබඳව සාකච්ඡා කරනු ලැබු අතර වැඩි අවධානයක් යොමු කරන ලද්දේ තවදුරටත් මානව හිමිකම් උල්ලංඝණයන් සිදු විම වැළැක්විම හා වන්දි ගෙවිම සම්බන්ධයෙන් මිස යුක්තිය, සත්‍යාවේක්ෂණයහා පුර්ණ හානිපුර්ණය පිළිබඳ ව දක්වන ලද්දේ ඉතාමත් අඩු අවධානයකි.

**සිරිපාල පලිහක්කාර මහතා:** නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබේ සහභාගිත්වයට ඉතාමත් ස්තුතියි. අපි මඩකලපුවේ සංචාරය කළ අවස්ථාවේ දි බොහෝ සිවිල් වැසියන් එල් ටි ටි ඊ සංවිධානය තුරන් වුවත් තවමත් එල් ටි ටි ඊ විසින් පවත්වා ගෙන ගිය කප්පම් ගැනිම් ආදිය පමණක් නොව නාඳුනන කණ්ඩායම් විසින් පුද්ගලයින් පැහැර ගෙන යාම් ආදිය නිතර සිදුවන බවට පැමිණිලි කළා. සමහර අවස්ථාවලදි ටි එම් වි පි පක්ෂයේ නම පවා සඳහන් කළා. සිවිල් වැසියන් දැඩි පිඩනයකින් ඉන්න බව පේනවා. ඔබ අමාත්‍ය වරයා වශයෙන් මේ තත්වය වළක්වා ගැනිමට යෝජනා කරන විසඳුම් මොනවාද?

**නියෝජ්‍ය අමාත්‍ය මුරලිදරන්:** මම හිතන්නේ පසුගිය අවුරුදු දෙක තුළ මඩකලපුවේ බරපතළ සිද්ධීන් කිසිවක් වාර්තා වුනේ නැහ. ඉතාමත් සාමකාමියි. එල් ටි ටි ඊ පාලනය පැවති කාලයේ බොහෝ සිද්ධීන් සිද්ධ වුනේ එල් ටි ටි ඊ ය විසින් සිවිල් වැසියන් බලහත්කාරයෙන් සිය සංවිධානයට බඳවා ගත්තා, පැහැර ගෙන ගිය නිසා. අන්තිමේ දි සටන් පෙරමුණේ මිය ගියේ කවුද කියලා කියන්න බැරි තරමට සංවිධානය ව්‍යාකුල වෙලයි තිබුනේ. විශේෂයෙන් ම

[70] ඉහත සාක්ෂිය

[71] නියෝජ්‍ය අමාත්‍ය විනයාගමුර්ති මුරලිදන් විසින් දෙන ලද සාක්ෂිය කොළඹ සැසි වාරය 2010 දෙසැම්බර් 2010

තොප්පිගල සටනේ දි එල් ටි ටි ඊ සාමාජිකයින් ඉතා විශාල පිරිසක් මිය ගියා. පසුව මම පත්තර වල දැක්කා ටි එම් වි පි සංවිධානයටත් දොස් පවරලා තිබුනා ඇතැම් සිදුවීම් සම්බන්ධයෙන්. මම තවදුරටත් ටි එම් වි පි සාමාජිකයෙක් නොවෙයි. මම දැන් ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක්. මම රජයටත් සම්බන්ධ වුනා. දැන් ටි එම් වි පි පක්ෂ නායකයා නැගෙනහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා. මේ දවස් වල නීතිය හා සාමය පිහිටුවා තිබෙන නිසා මම හිතන්නේ නෑ ඔවුන් මේ වගේ වැඩ කරනවා කියලා. දැන් ගිනි අවි සිවිල් වැසියන් අතේ නෑ. කිසිවෙක් ගිනි අවි රැගෙන ඒ මේ අත යන්නේ නෑ. පොලිසිය විසින් සියළුම ගිනි අවි එකතු කළා. ඇත්තටම පොලිසිය උතුරු හා නැගෙනහිර සාමය හා නීතිය ක්‍රියාත්මක කිරිමට ඉතා හොඳ මෙහෙවරක් කරනවා. ඒත් සමහර පුද්ගලයන් කලබල ඇති කිරිම පිණිස යම් යම් සිද්ධීන් ඇති කරනවා. ඊයේත් මම දැක්කා පුවත් පතක පළ වෙළා තිබුනා කොළඹ රන් ආභරණ වෙළඳ සැලක් කොල්ල කන්න ආපු හය දෙනෙක් පොලිසිය අතින් මැරුම් කාලා තිබුනා. තවදුරටත් එල් ටි ටි ඊ සංවිධානය හෝ වෙනත් සංවිධානයක් නැති නිසා තවදුරටත් ඉස්සර වෙච්ච සිද්ධීන් යලිත් ඇති වෙයි කියලා කියන්න බැහ.'[72]

ඉන් අනතුරුව කොමසාරිස්වරුන් විසින් මාතෘකාව වෙනස් කරමින් විවිධ ප්‍රශ්න ඇසිමට කාලය ගත්තේය. ' එල් ටි ටි ඊ සංවිධානය විසින් 1990 නැගෙනහිර ඝාතනය කරන ලද මුස්ලිම් ජාතිකයින් සඳහා වන්දි ගෙවිම සුදුසු ද?' (සාක්ෂිකරු ඔව් ) තමා එල් ටි ටි ඊ සංවිධානයට බලහත්කාරයෙන් බඳවා ගත්තෙක් ද? ( සාක්ෂිකරු නැහ) කවර ආකාරයක දේශපාලන විසඳුමක් සුදුසු ද? ( සාක්ෂිකරු බහුතර ජන කොටස එකඟ වන) විවිධ ජන කොටස් අතර සංහිඳියාව ඇති කිරිම පිණිස ඔබ යෝජනා කරන නිර්දේශ මොනවාද? (සාක්ෂිකරු ද්‍රවිඩ දේශපාලනඥයින් එක්ව කටයුතු කරමින් ජනාධිපතිවරයාට සහයෝගය දිය යුතුයි.)ආණ්ඩුව උතුරු හා නැගෙනහිර පළාතේ ජනගහණ ව්‍යාප්තිය වෙනස් කිරිම පිණිස සිංහලකරණයක් ක්‍රියාත්මක කර තිබේ ද? (සාක්ෂිකරු නැත)

කොමිෂන් සභාවේ සාමාජික සිරිපාල පලිහක්කාර මහතා යලිත් වරක් මුල් ප්‍රශ්නය සාක්ෂිකරුට ඉදිරිපත් කළ නමුත් එම ප්‍රශ්න කිරිම ඉදිරියට ගෙන යාමට අපොහොසත් වු බව පෙනේ.

**සිරිපාල පලිහක්කාර මහතා**ඃ නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබ ගේ පිළිතුරු වළට ඉතාමත් ස්තුතියි. නමුත් ඔබ මගේ ප්‍රශ්නයේ අවසාන කොටසට තවමත් පිළිතුරු දුන්නේ නැහ. අපි මඩකලපුවට ගිය අවස්ථාවේ දි සිවිල් වැසියන් ගෙන් තවමත් කප්පම් ගැනිම් හා බලහත්කාරයෙන් බඳවා ගැනිම් නාදුනන කණ්ඩායම් විසින් සිදු කරන බවට පැමිණිලි ලැබුනා. මේ තත්වය වැළැක්විම පිණිස අපට කළ හැක්කේ කුමක්ද?. ඔබ යෝජනා කරන්නේ කුමක් ද? මෙය සංහිඳියාවට එරෙහිව යන්නක්. මේවා සිවිල් වැසියන් අපට කියන ලද දේවල්. මේවාට කුමක් ද කළ හැක්කේ? ගත යුතු පියවරවල් මොනවාද?

**නියෝජ්‍ය අමාත්‍ය මුරලිදරන්:** මම මෙම කොමිෂන් සභාවට ගරු කරනවා. මේ සම්බන්ධයෙන් කරුණු කිහිපයක් කියන්න කැමතියි. මම මඩකලපුවේ නියෝජ්‍ය පොලිස්

[72] ඉහත

අධිකාරීවරයාට මේ පිළිබඳව දැනුම් දුන්නා මේ පිලිබඳව සොයා බලන ලෙසට. කප්පම් ගැනීම් සමහර පුද්ගලයින් කරනවා. සමහර විට අපේ නමත් පාවිච්චි කරනවා. දුර කථනයෙන් එබඳු තර්ජනයන් කරපු කිහිප දෙනෙකු ගේ දුර කථන අංක මම පොලිසියට ලබා දී පරීක්ෂණ පවත්වන්න කිවා. බලහත්කාරයෙන් බඳවා ගැනීම් සිදුවන්න විධියක් නැහ. දැන් එල් ටි ටි ඊ ය හෝ වෙනත් ආයුධ සන්නද්ධ කණ්ඩායම් නැති නිසා. එබඳු සිද්ධීන් දෙකක් තුනක් වාර්තා වු බව මාත් පිලි ගන්නවා. මෙබඳු සිද්ධියක් වුනාම මටත් දැනුම් දෙන්න කියලයි තියෙන්නේ. එතකොට මමත් පොලිසියට දැනුම් දෙනවා මේ ගැන සොයා බලන්න කියලා. මේ අනුව ක්‍රියා කරපු පොලිසිය කිහිප දෙනෙක් ම අත් අඩංගුවට ගත්තා. මම හිතන්නේ තත්වය යහපත් අතට හැරෙමින් තියෙනවා. ඔබේ ප්‍රශ්නයට මගේ පිළිතුර නම් මෙය පොලිසියේ රාජකාරිය බවයි මගේ හැගිම. සෑම ස්ථානයක ම පොලිස් ස්ථාන පිහිටුවා තිබෙන නිසා නීතිය හා සාමය රැක ගැනිම පොලිසියේ රාජකාරියක්.

මෙම අවස්ථාවේ දී කොමසාරිස්වරයා මාතෘකාව වෙනස් කළ අතර යලිත් කප්පම් ගැනීම් හා පැහැර ගැනීම් පිළිබඳ මාතෘකාවට නොපැමිණියේය.

1990 මඩකලපු පොලිස් නිලධාරින් 600ක ගේ ඝාතනය පිළිබඳව මීට පෙර කොමිෂන් සභා සැසිවාරයකදි කොමිෂන් සභාවේ සභාපතිවරයා හා නියෝජ්‍ය අමාත්‍ය මුරලිදරන් අතර දිගු අදහස් හුවමාරුවක් ඇති විය. සභාපතිවරයා ගේ ප්‍රථම ප්‍රශ්නය වුයේ එම ඝාතනය සම්බන්ධයෙන් ලබා ගත හැකි සාක්ෂි මොනාවදැයි අදහසක් ඇත් ද යන්නයි. සාක්ෂිකරු 'එල් ටි ටි ඊ ය තමන්ට යටත් වු පොලිස් නිලධාරීන් ග්‍රහණයට ගෙන ඝාතනය කිරිම සිදුවන අවස්ථාවේ තමා සිටියේ යාපනයේය. ඒ සිද්ධිය පිළිබඳව තමා ගේ කිසිදු වගකීමක් නොමැත. සිද්ධියේ සම්පුර්ණ වගකිම එල් ටි ටි ඊ අධිපති ප්‍රභාකරන් විසින් හා ඝාතනය ක්‍රියාත්මක කරන ලද බුද්ධි අංශයේ නායකයා වු පොට්ටු අම්මාන් විසින් දැරිය යුතුය'. ( මේ දෙදෙනාම දැන් මිය ගොසිනි) කියා සිටියේය.

'මෙම සිද්ධිය සිදු වුනේ 1989 ඉන්දීය සාම හමුදව ශ්‍රී ලංකාවෙන් පිටව ගිය වහාම යැයි සිතමි. ප්‍රභා සියළු දෙනාටම ප්‍රහාර දියත් කරන මෙන් නියෝග කළේය. ඇත්ත වශයෙන් මෙම සිද්ධිය සිදු වු අවස්ථාවේ මම සිටියේ මඩකලපුවේ නොව යාපනයේය. නමුත් මට මේ සිද්ධිය ආරංචි වුනා. ඔවුන් අත් අඩංගුවට ගෙන බුද්ධි අංශයේ නායක පොට්ටු ට භාර දී ඇති අතර ඊට පසු ඔවුන්ට කුමක් විදැයි තමන් නොදන්නා බව කියා සිටයේය. මේක තමයි සත්‍ය කථාව. සියළුම කෘෘර සිද්ධීන් මෙහෙය වන ලද්දේ ප්‍රභා විසිනි. මම මිල්ටරි අංශය භාරව සිටි එක් නායකයෙක් පමණී. ඒ නිසා අපි පුර්ණ කාලීනව යුධ මෙහෙයුම් මෙහෙය පිණිස සටන් පෙරමුණේ සිටියෙමු. බෝම්බ පිපිරවීම්, සිවිල් වැසියන් ඝාතනය යනාදි සියල්ලක් ම සිදු කරන ලද්දේ ඔවුන් විසිනි. අවස්ථා කිහිපයකදිම මම ප්‍රභාකරන් නිවරදි කිරිමට උත්සාහ කළෙමි. සෑම සිද්ධියකටම පසු මම ඔහුට යලිත් මෙවැන්නක් නොකරන මෙන් ඉල්ලා සිටියෙමි. අපි මේ ව්‍යාපාරයට බැදුනේ විමුක්තිකාමී අරගලකරුවන් වශයෙනී. මනුෂ්‍ය ඝාතන කිරිම අපිට නොහොබි. ඔහු නිසි පිළිතුරක් නොදුන් අතර ඝාතන නතර

කළේ ද නැත. නැවත නැවතත් ලංකා බැංකු මූලස්ථාන බෝම්බය, දළදා මාලිගා බෝම්බය යනාදි වශයෙන් දිගින් දිගටම ඔවුන් බෝම්බ පිපිරවීම් සිදු කළා. [73]

ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය සම්බන්ධයෙන් මෙම සිද්ධියේ තිබෙන ඓතිහාසික වැදගත්කම හා කරුණා විසින් සඳහන් කරන ලද සිද්ධීන් සම්බන්ධයෙන් කොමසාරිස්වරුන් සවිස්තරාත්මක ප්‍රශ්න විචාරීමක් නොකළෝය.

**ඔහාමාත්‍ය එස්.චන්ද්‍රකාන්තඃ**

සිවනේසාතුරෙයි චන්ද්‍රකාන්තන් හෙවත් පිල්ලේයාන් නැගෙනහිර පළාතේ මහා ඇමතිවරයාය. ළමා සොල්දාදුවෙක් වශයෙන් එල් ටි ටි ඊ සංවිධානයට බැඳුන පිල්ලේයාන්, පසුව ටි එම් වි පි පක්ෂයේ නියෝජ්‍ය නායකයා බවට පත් වූ අතර කරුණා ගේ නික්ම යාමෙන් පසු එම පක්ෂයේ නායකයා වූයේය. එල් ටි ටි ඊ සාමාජිකයෙක් වශයෙන් මෙන්ම ටි එම් වි පි පක්ෂයේ නායකයා වශයෙන් ද සිවිල් වැසියන්ට ඍජුව ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව චෝදනා එල්ල වි තිබේ. මහ ඇමති පිල්ලේයාන් ගේ අනුගාමිකයින් විසින් පැහැර ගෙන යාම් හි ඝාතනය කිරීම් ඇතුළු නොකඩවාම කරනු ලබන මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව චෝදනා කොමිෂන් ් සභාවට ඉදිරිපත් කරන ලදි. මෙම සිද්ධීන් බොහොමයක් ටි එම් වි පි පක්ෂයෙන් කැඩී වෙන් වී ගිය කරුණා පාර්ශවයේ ආධාර කරුවන් ට එරෙහි ව කරණු ලබන බව ද සඳහන් කරන ලදි. එස්. චන්ද්‍රකාන්තන් සම්බන්ධයෙන් කොමිෂන් ් සභාව අනුගමනය කළ පිළිවෙත අනෙක් සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් අනුගමනය කළ පිළිවෙතට වඩා 'දියාරු' එකක් විය. මෙම සාක්ෂිකරු සම්බන්ධයෙන් කොමිෂන් ් සභාව වෙත අන් සියළු සාක්ෂිකරුවන් ට වඩා පැමිණිලි ලැබි තිබුනත් කොමිෂන් ් සභාව එකී චෝදනා සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු ගෙන් සවිස්තරාත්මක ප්‍රශ්න කිරීමට නොගියේය.[74]

**සිරිපාල පලිහක්කාර මහතාඃ** ඔබට ඉදිරිපත් කිරීමට ප්‍රශ්න දෙකක් තිබෙනවා. පළමුවෙනි ප්‍රශ්නය තමයි අපි මඩකලපුවේ සංචාරය කළ අවස්ථාවේ දි සිවිල් වැසියන් බොහෝ දෙනෙක් එල් ටි ටි ඊ සංවිධානය තුරන් කළත් ඔවුන් ගේ වධහිංසා තවදුරටත් එලෙසම සිදුවන බවට පැමිණිලි කළා. කප්පම් ගැනීම්, ළමයින් පැහැර ගැනීම් හා ජනතාවට අඩන්තේට්ටම් කිරීම තවදුරටත් එලෙසම සිද්ධවන බව සඳහන් කළා. මේ සම්බන්ධයෙන් ඔබගේ අදහස කුමක්ද? හා අපි කුමන පියවරක් ගත යුතු ද?.

**මහාමාත්‍ය චන්ද්‍රකාන්තන්ඃ** ඇත්ත වශයෙන් ම යම් යම් සිද්ධීන් සිදු වූ බව වාර්තා වුනා. ඔබට ඍජුව ම කියන්න පුළුවන් නම් අසවල් සිද්ධිය සම්බන්ධයෙන් කියා මට වඩාත් නිශ්චිත පිළිතුරක් දෙන්න පුළුවන්. ඒ වගේ ම අනෙකුත් පළාත් වලත් අනෙකුත් ප්‍රදේශ වලත් මේ හා සමාන සිද්ධීන් සිදු වෙනවා. එම සිද්ධීන් සම්බන්ධයෙන් නීතිය හා අධිකරණය හරහා නිසි ක්‍රියා මාර්ග ගැනීමට අපි කටයුතු කරනවා.

[73] ඉහත
[74] නැගෙනහිර මහාමාත්‍ය සිවනේෂන් චන්ද්‍රකාන්තන් විසින් දෙන ලද සාක්ෂියඃ කොළඹ සැසිවාරය 2010 ඔක්තෝබර් 20

**සිරිපාල පලිහක්කාර මහතා:** ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද?

**මහාමාත්‍ය චන්ද්‍රකාන්තන්:** ඔබට සිද්ධීන් පිළිබඳව නිශ්චිත ව සඳහන් කළ හැකි නම් මට යමක් නිශ්චිතව කිව හැකියි. පැහැර ගෙන යාම් එකක් හෝ දෙකක් නම් සිදු වුනා තමයි.

**සිරිපාල පලිහක්කාර මහ**තා: හොඳයි. මම හිතන්නේ මම නිශ්චිත ව ප්‍රශ්නය ඉදිරිපත් කළා කියලයි. මම හිතන්නේ මඩකලපු ජනතාව යම්කිසි දේශපාලන පක්ෂයක නම පවා සඳහන් කළා යැයි කියලයි.

**මහාමාත්‍ය චන්ද්‍රකාන්තන්:** මමත් ඒවා පුවත්පත් වල දැක්කා. ඒවා රටේ අනෙකුත් පළාත් වල සිදුවන සිද්ධීන් ට සමානයි. මීට වඩා බොහෝ සිද්ධීන් 2002-2008 අතර කාලයේ දි සිදු වි තිබුනා. අපේ දේශපාලන පක්ෂයේ ව්‍යුහය ගත්තාම එකම පවුලේ අය ගෙන් සමහරක් එල් ටි ටි ඊ අනෙක් අය ටිඑම් වි පි. ඉතින් මේ දෙගොල්ල අතර ඇන කොටා ගැනීම් ඇති වෙනවා. ඒ නිසා නීතිමය රාමුවක්, නීතිමය පද්ධතියක් අවශ්‍යයයි මේ වගේ ප්‍රශ්න විසඳන්න.

කොමසාරිස්වරුන් මෙහිදීත් නිශ්චිත ප්‍රශ්න ඉදිරිපත් කිරිමට අසමත් වෙනවා පමණක් නොව අසන ලද ප්‍රශ්න වලට සපයන ලද 'දියාරු' පිළිතුරු හඹා ගොස් වින්දිතයින් වෙනුවෙන් යුක්තිය හා හානිපුර්ණය ඉටු කිරිමට අසමත් වු බව මැනවින් පෙනි යයි. පසු අවස්ථාවක දි ඉඩම් ප්‍රශ්නය පිළිබඳව ඇති වු සාකච්ඡා වලදි, සාක්ෂිකරුවන් මහාමත්‍යවරයාට බියෙන් ඇතැම් කරුණු ඉදිරිපත් කිරිමට අකැමැති කොමසාරිස්වරුන් ට ඒත්තු ගිය බව පෙනින.

**මනෝහාරි රාමනාදන් මහත්මිය:** අපි මඩකලපුවේ සංචාරය කොට ආපසු පැමිණියේ ඉතාමත් කණගාටුවෙන්. මඩකලපුවේ බොහෝ දෙනෙක් කැමරාව ඉදිරියේ සාක්ෂි දිමට ඉදිරිපත් වුනා. යුද්ධයෙන් ඔවුන් අවතැන් වු නිසා තමන්ට තමන් ගේ ඉඩම් වල යලි පදිංචි විමට හෝ විකිණිමට නොහැකි තත්වයක් උදවි ඇති බව ප්‍රකාශ කළා. අපි ඇහුව්වා ඇයි ඔබට බය ද කියලා?.

**මහාමාත්‍ය චන්ද්‍රකාන්තන්:** මට බොහෝ කණගාටුයි. එහේ තත්වය ඒක නම් මට ඔවුන් ගැන ඉතාමත් කණගාටුයි.

**මනෝහාරි රාමනාදන් මහත්මිය:** ඔවුන් ඔබට බයයි කියන එක සත්‍යයක් ද කට කථාවක්ද?

මහාමාත්‍ය චන්ද්‍රකාන්තන්: ඔවුන් බිය විය යුතු නැහ. තමන් ගේ අයිතිවාසිකම් ආපසු ලබා ගන්නට හෝ අයිතිවාසිකම් භුක්ති විදිමට ඔවුන් පසුබට විමට හෝ බිය විමට හේතුවක් නැහ. මෙබඳු ප්‍රශ්න ඇති වු වහාම මම ඒ ස්ථානයට ගොස් එම ප්‍රශ්න විසඳිමට වැයම් කරනවා. ඔබට පුළුවන් නම් ඔබට මා ගැන සහතික විය හැකි නම් හා මා විශ්වාශ කරනවා නම් එම පැමිණිලි මට කියන්න. මම ඒවා අධ්‍යනය කරලා විසඳන්නම්.

**මනෝහාරි රාමනාදන් මහත්මිය:** ඔවුන් අපිට කීවා ඔබට බයයි කියලා.

පුදුමයකට මෙන් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව පිල්ලයාන් සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් විසින් පළ කරන ලද භිතීයට තුඩු දුන් හේතුන් වටහා ගැනිමට අසමත් වුවා පමණක් නොව හිටපු ( සහ වර්තමාන) ආයුධ සන්නද්ධ කණ්ඩායම් නායකයෙකුට සහාය දැක්වු බවක් හැඟි යයි.

මහාමාත්‍ය චන්ද්‍රකාන්තන් ගේ සාක්ෂි විභාගයේ දි කොමිෂන් සභාවේ සභාපතිවරයා නැවත වරක් 1990 නැගෙනහිර පළාතේ පොලිස් නිලධාරීන් 600 දෙනා ගේ ඝාතනය සම්බන්ධ ප්‍රශ්නය සාකචඡා කරන්නට උත්සාහ කරමින් යටත් වු පොලිස් නිලධාරීන් සාක්ෂිකරු යටතේ

සිටි සඳහන් කරමින් එම සමුහ ඝාතනයට තමා සම්බන්ධ බවට චෝදනා තිබෙන බව පෙන්වා දුන්නේය. නමුත් එම ඝාතනය සිදු වු ආකාරය පැහැදිලි කර ගැනිමක් හෝ වගකිව යුතු පුද්ගලයින් හඳුනා ගැනිමකට උපකාර වන ආකාරයේ ප්‍රශ්න කිරිමකින් තොරව කොමිෂන් [P] සභාව උත්සාහ කළේ ප්‍රසිධ සමාවක් ගැනිම පිළිබඳව සාක්ෂිකරු ගේ ස්ථාවරයයි.

ව්‍යාකූලත්වයක් ඇති කරමින් කොමිෂන් සභාව මෙම සිද්ධිය සම්බන්ධයෙන් වගකිම බාර ගැනිමට යොමු නොකොට මෙම සිද්ධියත් තිස් අවුරුදු යුද්ධයේ තවත් එක් බරපතළ සිදුවිමක් ලෙසට වාර්තා කිරිමකට සිමා කළේය.

මහාමාත්‍ය චන්ද්‍රකාන්තන් මෙම ඝාතනය පිළිබඳ සම්බන්ධතාවය ප්‍රතික්ෂේප කළ අතර තමාගේ වර්තමාන එදිරිවාදියා වන නියෝජ්‍ය අමාත්‍ය මුරලිදරන් යෝජනා කළ ප්‍රසිද්ධියේ කණගාටුව පළ කිරිම වඩා සුදුසු යැයි යෝජනා කළේය.

**සභාපති**: චන්ද්‍රකාන්තන් මැතිතුමනි. ඔබ දන්නවා 600 කට ආසන්න පොලිස් නිලධාරීන් සංඛ්‍යාවකට යටත් වන ලෙස දැනුම් දි ඔවුන් පෙළ ගස්වා වෙඩි තබා ඝාතනය කිරිම සම්බන්ධයෙන් ඔබේ කණ්ඩායමේ සාමාජිකයින් මැදිහත් වු බව. දැන් ඔබ හිතන්නේ නැද්ද වාර්ගික සංහිඳියාව ඇති කිරිම අරමුණු කොට ගෙන ඔබේ කණ්ඩායම විසින් එම රජයේ නිලධාරීන් ගේ පවුල් වල සාමාජිකයින් ගෙන් ප්‍රසිධියේ කණගාටුව පළ කිරිමක් කළ යුතුයි කියා.

**මහාමාත්‍ය චන්ද්‍රකාන්තන්**: ඔබ ඉතාමත් වැදගත් ප්‍රශ්නයක් මතු කළේ. ඒ කියන්නේ අපිට සමාවක් ඉල්ලන්න කියන්නේ එල් ටි ටි ඊ සාමාජිකයින් හැටියටද ?

**සභාපති**: සමාව ඉල්ලිමක් නොවේ කණගාටුව පළ කිරිමක්.

මහාමාත්‍ය චන්ද්‍රකාන්තන්: කලින් සාක්ෂි වලදීත් මම කියා සිටියා 1990 ජුනි 11 වන දින මම පාසැල් ශිෂ්‍යයෙක්. ඒ දවස් වල එල් ටි ටි ඊ ය බොහෝ පළාත් අල්ලා ගෙනයි හිටියේ. මම එල් ටි ටි ඊ සංවිධානයට බැඳුනේ 1991 පෙබරවාරි 04 වන ද. මට මතකයි මිනිස්සු කීව්වා එල් ටි ටි ඊ ය විසින් වට කරන ලද පොලිස් නිලධාරීන් පසුව එල් ටි ටි ඊ ය විසින් ගෙන ගොස් සති දෙක තුනකට පසු ඝාතනය කළා කියලා. ඔබ කියනවා නම් අපි ඒ අය ගේ පවුල් වලින් ප්‍රසිද්ධියේ සමාව ඉල්ලා සිටිය යුතුයි කියලා මම හිතන්නේ වඩාත් ම සුදුසු පුද්ගලයා එවකට නායකයාව සිටි කරුණා මහත්මයා.

පහත උපුටා දක්වන අදහස් හුවමාරුව ද සිත් කළඹයි. මහාමාත්‍ය චන්ද්‍රකාන්තන් ගෙන් ඔහු ශ්‍රී ලංකා ආරක්ෂක හමුද ප්‍රචණ්ඩ ක්‍රියාවන් හි නිරතවන බව දුටුවේ දැයි විමසු කළ ඔහු ගේ පිළිතුර වුයේ තරුණයෙක් ලෙසට 1990 ගණන් වල එබඳු සිද්ධීන් තමාට දුටු බව කියා සිටියේය. නමුත් කොමසාරිවරුන් ගේ ප්‍රශ්න කිරිම් තුළින් ව්‍යංගයෙන් ධවනිත කරන ලද්දේ එබඳු සිද්ධීන් 'යුද්ධයක කොටසක්' බවයි. නැවත වරක් සාක්ෂිකරු ගෙන් තමා දුටු සිද්ධීන් සිදු වුයේ කොහෙද කවදද යන්න සහතික කර ගැනිමට අවශ්‍ය ප්‍රශ්න විචාරිමක් සිදු නොවිය. කොමසාරිස්වරුන් ගේ නිගමනය වුයේ වඩාත් ම සුදුසු ප්‍රතිචාරය වන්නේ ප්‍රසිද්ධ සමාවක් ඉල්ලා සිටිම බවයි.

**පරාක්‍රම පරණගම**: සභාපතිවරයා ඔබෙන් විමසු ප්‍රශ්නය නිසා ඔබ සිතන්න පුළුවන් අපි සැම විටම එල් ටි ටි ඊ ය කළ වැරදි පමණක් අසනවාකියා. ඔබටත් සාධාරණයක් වන්නට ඔබට

කියන්න පුළුවන් ද අපේ ආරක්ෂක හමුදා යම්කිසි බරපතළ අපරාධ කළ අවස්ථාවන් තිබෙනවාද කියා?.

**මහාමාත්‍ය චන්ද්‍රකාන්තන්** : මම 1990 එබඳු සිද්ධියන් රාශියක් ඇසින් දුටුවා.

**පරාක්‍රම පරණගම මහතා:** සිද්ධීන් කියක් විතර?

**මහාමාත්‍ය චන්ද්‍රකාන්තන්:** මගේ අසල්වැසියෙක් වු සීන්න තම්බි නැමැත්තා ආරක්ෂක හමුද විසින් ඝාතනය කළා. පාරවල් වල හැම තැනම බාගෙට පිළිස්සු මළ කඳන් විසිරි තිබුනා. වෙට්ටු පාටි හෙවත් කපා කොටා දමන කණ්ඩායම ලෙස හැදින්වූ විශේෂ කණ්ඩායමක් අපේ ගමට ආවා. මම දැකලා තියෙනවා මිනිස්සුන්ව ඇද ගෙන ගිහින් එක්කෝ කපලා එහෙම නැත්නම් වෙඩි තියලා ගඟට විසි කරනවා. මගේ අසල්වැසියන් දෙදෙනෙක් තව රාසා කියලා කෙනෙක් මහ රෑ ආමි එකෙන් ඇවිත් අර ගෙන ගිහින් දණ ගස්සලා ආමි එකට වදින්න කියලා ඊට පස්සේ එතනම වෙඩි තියලා දැම්මා. මගේ වයස එතකොට අවුරුදු 16 යි මටත් ආමි එකෙන් ගහලා තියෙනවා.

**පරාක්‍රම පරණගම මහතා:** නමුත් ඒවා ඒ කාලයේ තිබුන යුද්ධයේ කොටසක් නේද?.

මහාමත්‍යා චන්ද්‍රකාන්තන්: ඔව්.අනිවාර්යෙන් ම. මෙම සිද්ධීන් පිටුපස ඇති දේශපාලන පසුබිම දිහා අපි බලන්නට ඕනෑ සහ මෙබඳු සිද්ධීන්ට අනුබල හා ආශිර්වාද කළ සියළුම දේශපාලන නායකයින් ප්‍රසිධියේ පොදු කණගාටුවක් ප්‍රකාශ කරන්න ඕනෑ.

**සභාපති:** මහාමාත්‍ය චන්ද්‍රකාන්තන් මැතිතුමනි. මම හිතනවා රජයත් ප්‍රසිධ කණාගාටුවක් පළ කළ යුතුයි කියලා. මම මේ අවස්ථාවේ මෙහි පැමිණ අවංකවම තමන් ගේ අදහස් ප්‍රකාශ කිරිම ගැන මම ස්තුතිවන්ත වෙනවා. ඔබ ඉදිරිපත් කළ ඇතැම් අදහස් ඉතාමත් ප්‍රයෝජනවත් අපි ඒවා අපගේ නිර්දේශයන් සකස් කිරිමේ දි සලකා බලන්නම්.

(සැසිවාරය නිම විය)

උගත් පාඩම් හා සංහිදියා කොමිෂන් සභාව ඉදිරියට පැමිණි අමාත්‍ය ඩග්ලස් දේවානන්ද; නියෝජ්‍ය අමාත්‍ය වි මුරලිදරන් හා එස් චන්ද්‍රකාන්තන් ඇතුළු සියළුම සාක්ෂිකරුවන් මෙම කොමිෂන් සභාව පිහිටුවිමේ දි, පරික්ෂණ කොමිෂන් සභා පනතේ 14 වන වගන්තිය මෙම කොමිෂන් සභාවට අදාළ කිරිමෙන්, සාක්ෂිකරුවන්ට නිර්මුක්තියක් සැපයීම මගින් සාක්ෂි පදනම් කොට ගෙන නඩුකරයන් පවත්වා ගෙන යාම වළක්වන ලදි.

## සාක්ෂිකරුවන් ගෙන් ප්‍රශ්න කිරිමේ දි කොමිෂන් සභාව සිය මතය උත්තරාරෝපණය කිරිම:

කොමිෂන් සභාව ඉදිරියට සාක්ෂි දිමට පැමිණි සාක්ෂිකරුවන් විභාග කිරිමේදි කොමිෂන් සභා සාමාජිකයින් ඇතැම් විට සිය පෞද්ගලික මතය උත්තරාරෝපණය කිරිමට උත්සාහ දරන ලද බවට සාධක තිබේ.

**කොමිෂන් සභාවේ සභාපති සි ආර් ද සිල්වා හා වන්නියේ ප්‍රධාන අණදෙණ නිලධාරි මේජර් ජනරාල් කමල් ගුණරත්න අතර ඇති වූ අදහස් හුවමාරුව:**

**සභාපතිඃ** ජනරාල්තුමනි, අපි එක් කාරණයක් පිළිබඳව සැලකිලිමත් වෙනවා. ඔබ පවසන දෙය අපි සම්පූර්ණයෙන් ම තේරුම් ගත්තා. එල් ටි ටි ඊ සාමාජිකයින් භාර වීමේ ක්‍රියාපටිපාටිය හා භාරවුවන් ඝාතනය කිරිම පිළිබඳ ඔබ කියන කාරණය ජාත්‍යන්තර මාධ්‍යයන් හි පළ වු වාර්තා. එහෙම චෝදනාවක් තිබෙනවා තමයි. අප ගේ අවසාන නිර්දේශ සකස් කිරිම පිණිස මේ සම්බන්ධයෙන් ඔබගේ අදහස් ප්‍රකාශ කරන්න.

**මේජර් ජනරාල් කමල් ගුණරත්නඃ** ඒ චෝදනා සම්බන්ධයෙන් මම එකඟ වන්නේ නැහ. මම කලිනුත් ප්‍රකාශ කළාක් මෙන් අපි මෙම මානුෂික මෙහෙයුම සිදු කළේ ඉතාමත් පැහැදිලි මනසකින් යුක්තවයි. යුද්ධ හමුදවට භාර වු සියළු දෙනාම අපි බලධාරින්ට බාර දුන්නා මිස කිසි කෙනෙක් ව ඝාතනය කළේ නැහ.

**සභාපතිඃ** ඇත්ත වශයෙන්ම කියනවා නම් යුද්ධයේ අවසාන අදියරේ භාර වු තැනැත්තන් අපි විසින් ප්‍රශ්න කළා. ඔවුන් කිසිම කෙනෙක් තමන් හෝ වෙනත් භාර වු තැනැත්තෙකුට යුද්ධ හමුදව විසින් අමානුෂික ලෙස හා කෲර ලෙස සැලකු බවක් අප සමග ප්‍රකාශ කළේ නැහ. ඇතැම් අවස්ථාවලදි ආරක්ෂක හමුදව තමන්ට සමහර අවස්ථාවන්හි බිම් බෝම්බ සහ අනෙකුත් බාධක මග හරිමින් ආරක්ෂක ස්ථාන වලට යාමට උපකාර කළ බවත් සඳහන් කළා. මම මේ ප්‍රශ්නය ඔබෙන් ඇසුවේ ඒ නිසයි. භාර වු තැනැත්තන්ට කිසියම් ආකාරයක බලපෑමක් ආරක්ෂක හමුද විසින් කළේය යන චෝදනාව ඔබ ප්‍රතික්ෂේප කරනවා නේද?.

**මේජර් ජනරාල් කමල් ගුණරත්නඃ** හරියටම හරි. මම තදින් ම ඒ චෝදනාව ප්‍රතික්ෂේප කරනවා. වෘත්තීය නිපුණත්වයක් ඇති හමුද නිලධාරින් වන අපි දන්නවා භාර වෙන එල් ටි ටි ඊ සාමාජිකයින් තොරතුරු ලබා ගැනිම සම්බන්ධයෙන් කොයි තරම් හොඳ මුලාශ්‍රයක් ද කියලා. ඒ මිනිසුන් ට හොඳට හොඳට සැලකුවාම හදවතේ තියෙන දේ කියනවා.

**කොමිෂන් ් සභා සාමාජික සිරිපාල පලිහක්කාර මහතා සහ නාවික හමුදවේ අණ දෙන නිලධාරි තිසර සමරසිංහ අතර ඇති වු අදහස් හුවමාරුවඃ**[75]

**අණ දෙන නිලධාරි තිසර සමරසිංහඃ** මම අවසාන වශයෙන් කියන්න කැමතියි 2009 ක්‍රියාන්විතය භාර සිටි මම ඉතාමත් කිට්ටුවෙන් අන්තර් ජාතික රතු කුරුස සංවිධානය සමග වැඩ කළා. එම සංවිධානයේ පෝල් මහතා අපගේ සේවය අගය කරමින් අපිට ලිපියක් ලියා ස්තුතිය පළ කළා. සමහර විට මෙම ලිපියේ පිටපතක් ආරක්ෂක ලේකම් වරයා ගේ මාර්ගයෙන් ලැබෙන්නටත් ඇති. රටේ ඉහළම තැන සිට පහළට කාන්දු වු පණිවුඩයට අනුව ඉටු කරන අපේ මෙහෙවර මානුෂික මෙහෙයුමක් කිරිම වු බවත් අවම අලාභ වන බවට සහතිකයක් තිබු බවත් අපේ උත්තරීතර වෘත්තීයේ ගෞරවය රැක ගෙන ක්‍රියා කළ බවත් ප්‍රකාශ කරන්නනේ අන් කිසිවෙක් නොව අන්තර් ජාතික රතු කුරුස සංවිධානයේ ප්‍රධානියා.

**සිරිපාල පලිහක්කාර මහතාඃ** මානවීය මුලධර්ම වලට ගරු කරන ඔබ ගේ වෘත්තීය කැපවිම මා පුද්ගලිකව දන්නා කාරණයක්. මෙහි පැමිණ සාක්ෂි දුන්නාට ඉතාමත් ස්තුතියි. මම හිතන්නේ ඔබ වන්නියේ එල් ටි ටි ඊ භාරයේ සිර වි සිටි 300,000 සිවිල් ජනතාව ගේ එකම බලාපොරොත්තුව ඔබගේ භූමිකාව මත රැදුන ආකාරය පැහැදිලි කළා. ඔබ කියා සිටියා

[75] නාවික හමුදපති තිසර සමරසිංහ විසින් දෙන ලද සාක්ෂියඃ කොළඹ සැසිවාරය 2010 සැප්තැම්බර් 08

සිවිල් වැසියන් ට  අවශ්‍ය සැපයුම් සපයා ආපසු එන අතර වාරයේ තුවාල ලැබූ  සිවිල් වැසියන් පවා ආරක්ෂක ස්ථාන වලට රැගෙන ආ බව. ඒ අතර එල් ටි ටි ඊ සාමාජිකයින් ද සිටින්නට ඇති. මේ සියළු විස්තර කොමිෂන් සභාවට ලබා දෙන්න.
මම ඔබෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. අපගේ අධිකාරියට අනුව අප විසින් සටන් විරාම ගිවිසුම සම්බන්ධයෙන් උගත් පාඩම් මොනවාදැයි විමසිය යුතු වෙනවා. මේ සම්බන්ධයෙන් ඔබ ගේ අදහස් මොනවාද?.විශේෂයෙන්ම සටන් විරාම ගිවිසුමෙන් නාවික හමුදාව ඉවත් කර තිබුනා. මේ නිසා නාවික හමුදාවේ නියාමනයෙන් තොර වූ නිසා සාගරය එල් ටි ටි ඊ යට නිදහස් වුනා. මෙලෙස සටන් විරාම ගිවිසුමෙන් ඉවත් කළ නාවික හමුදාව යුද්ධයේ අවසාන අදියරේ දි එල් ටි ටි ඊ ග්‍රහණයේ සිටි සිවිල් වැසියන් නිදහස් කොට ගෙන ඒම උප්තෝකෝටිකයක්. ඔබ හොඳින් දැන සිටින්නට ඇති සිවිල් වැසියන් ට සපයන ආහාර පාන වලින් කොටසක් එල් ටි ටි ඊ සාමාජිකයින් අතට පත්වන බව. ඔබ මේ තත්වයට මුහුණ දුන්නේ කෙසේද?

## රාජ්‍ය විවේචනයට ලක් කළ සාක්ෂිකරුවන් හා විශේෂඥයින් දැඩි අධියෝගයකට ලක් කිරිමඃ

සාක්ෂි දිමට පැමිණි රාජ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් මෘදු භාවයක් පෙන්නුම් කළ කොමිෂන් සභාව රාජ්‍ය විවේචනය කළ සාක්ෂිකරුවන් හා විශේෂඥ සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් දැඩි විවේචන එල්ල කළේය. ඇතැම් අවස්ථා වලදි රජයේ සාක්ෂිකරුවන් ගේ සාක්ෂි උපුටා දක්වමින් එබඳු සාක්ෂිකරුවන් ගේ සාක්ෂි ප්‍රශ්න කළ අතර තවත් සමහර අවස්ථාවලදි සාක්ෂිකරු ගේ සාක්ෂි දීමට තිබෙන වලංගුභාවය ප්‍රශ්න කළේය.

**කොමිෂන්  සභාවේ සභාපති සි ආර් ද සිල්වා මහතා හා එංගලන්ත සභාවේ අගරද ගුරු අති උතුම් ඩුලිප් ඩි චිකේරා අතර අදහස් හුවමාරුවඃ**[76]

**අති උතුම් ඩුලිප් ඩි චිකේරාඃ** යුද්ධ හමුදාව යුද්ධයෙන් පසු යහපත් වැඩ කොටසක් ඉටු කර තිබෙනවා. ඒ පිළිබඳව කිසිම විවාදයක් නැහ. නමුත් යෝජනාවක් තිබෙනවා 100,000 හමුදා පවුල් මේ ප්‍රදේශයේ පදිංචි කිරිමේ යෝජනාවක්  තිබෙනවා. එම යෝජනාව, ඒ කියන්නේ දැනට මේ ප්‍රදේශයේ සිටින ජනගහනයෙන් හතරෙන් එකක් මෙලෙස පදිංචි කිරිම නිසා මේ ප්‍රදේශයේ ජනගහන ව්‍යාප්තියේ වෙනසක් වෙනවා.
**සභාපතිඃ** ඇත්තටම මෙම ප්‍රශ්නය අපි ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ගෙන් විමසුවා. ඔහු ස්ථිර වශයෙන් ම සහතික කොට ප්‍රකාශ කළා රජයේ එබඳු සැලැස්මක් නැති

[76] අතිඋතුම් ඩුලිප් ඩි චිකේරා අගරදතුමාඃ එංගලන්ත සභාව උන් වහන්සේ 2001 මැයි මාසයේ සිට 2010 දෙසැම්බර් 31 දක්වා මෙම ධුරය දැරිය.

බව. ඇත්ත වශයෙන් ම යුද්ධ හමුද පවුල් පදිංචි කිරිමට රජයේ කිසිම සැලැස්මක් නැති බව ආරක්ෂ ලේකම් විසින් ස්ථිර ලෙසම ප්‍රකාශ කළා. අප ඉදිරියට පැමිණි ඇතැම් සාක්ෂිකරුවන් ද රජය යුද්ධ හමුද පවුල් පදිංචි කිරිම නිසා ජනගහන ව්‍යාප්තියේ ඇති විය හැකි වෙනස් කම් පිළිබඳව බිය-සැක පළ කළා. ආරක්ෂක ලේකම් මෙය සම්පුර්ණයෙන් ම බැහැර කළා.

එල් ටි ටි ඊ ය විසින් සුළුතරයක් වු ද්‍රවිඩ ජනතාව වෙනුවෙන් වෙනම රාජ්‍යයක් පිහිටුවිමේ අධිප්‍රාය හේතුවෙන් ශ්‍රී ලංකාවේ තිස් අවුරුදු යුද්ධයට වාර්ගික සාධක ඇතුළත් වුයේය. ඒ නිසා ශ්‍රී ලංකාව ජනගහන ව්‍යාප්තිය අනුව බෙදිමට තැත් කිරිමේ ප්‍රතිඵලයක් වශයෙන් පළාත් බඳ ජනගහන සංයුතිය දේශපාලන වශයෙන් ඉතාමත් සංවේදි සාධකයක් වෙයි. මේ අතර දැන් යුද්ධයබ නිම වි ඇති නිසා දකුණේ සිංහලයන් උතුරට හා නැගෙනහිරට සංක්‍රමණය වි නව ආර්ථික අවස්ථාවන් උරගා බැලිමට තැත් කිරිම වැළැක්විය නොහැක. එසේත් නැත්නම් යුද්ධය ආරම්භ විමට පෙර තමන් පදිංචිව සිටි උතුරු හා නැගෙනහිර මුල් ගම්බිම් බලා ආපසු පදිංචියට යාම ද තර්කානුකුලය. මේ අතර යුද්ධය නිමාවිමත් සමගම යුද්ධ හමුද සාමාජිකයින් ප්‍රමුඛ සිංහලයින් සිය පාරම්පරික ගම්බිම් ආක්‍රමණය කරති යන භීතිය ද්‍රවිඩ ජනතාව තුළ ඇති විම ද වැළැක්විය නොහැක. මේ සියළු ප්‍රවණතතාවයන් විසින් පාරම්පාරිකව ද්‍රවිඩ ජනතාව භුක්ති වින්ද භුමියට හා ආර්ථික සම්පත් සඳහා තරගකාරිත්වයක් ඇති කරනවා පමණක් නොව දේශපාලන හා සංස්කෘතික බලපෑමක් එල්ල කරයි. ජනතාව තුළ ඇති වි තිබෙන මෙම සැකය සියළුම දේශපාලනඥ යින් විසින් සිය වාසියට හරවා ගෙන තිබේ.

මුස්ලිම්වරුන් ද අනෙක් සුළු ජාතීන් ට වඩා සංඛ්‍යාවෙන් ජන සංඛ්‍යාවෙන් අඩු සුළු ජන කොටසක් වන අතර බහුතරයක් මුස්ලිම්වරු ද්‍රවිඩ බස ව්‍යවහාර කරති. පාරම්පාරිකව මුස්ලිම් වරුන් උතුරු හා නැගෙනහිර පළාත් වල ද්‍රවිඩ ජාතීන් සමග ජිවත් වුහ. යුද්ධය ඇවිලි යද්දී දේශපාලනඥයින් විසින් ද්‍රවිඩ හා මුස්ලිම් ජාතීන් අතර ඇති විෂමතා ප්‍රයෝජනයට ගැනිමේ ප්‍රතිඵලයක් වුයේ මෙම ජන කොටස් අතර ද වාර්ගික ගැටුම් ඇති වි දෙපාර්ශවයේම මානව හිමිකම් උල්ලංඝණයන් සිදු විමය. උදහරණයක් වශයෙන් නැගෙනහිර පළාතේ මුස්ලිම් හා ද්‍රවිඩ ජාතීන් සමුල ඝාතනයත් එල් ටි ටි ඊ ය විසින් 1990 දි යාපනයෙන් මුස්ලිම් ජාතීන් පිටුවහල් කිරිමත් සඳහන් කළ හැකිය.

**කොමිෂන් සභාවේ සාමාජිකයින් හා මුස්ලිම් තොරතුරු මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂක එම් අයි එම් මොහිඩීන් අතර ඇති වු අදහස් හුවමාරුව:**[77]

**ආචාර්ය රෝහාන් පෙරේරා මහතා:** මොහිඩීන් මහත්මයාණෙනි ඔබගේ අදහස් දැක්විමේ දි ඔබ මුතුර් හි දි එල් ටි ටි ඊ ය හා ආරක්ෂක හමුද යන දෙපාර්ශවය විසින් ම සිවිල් වැසියන් ඝාතනය කළ බව ඔබ සඳහන් කළා. මේ සිද්ධිය තවදුරටත් පැහැදිලි කරන්න පුළුවන් ද?. මෙහි දි සිදුවුනේ සිතාමතාම සිවිල් වැසියන් ට පහර දිමක් ද එසේ නැත්නම් සිවිල් වැසියන් රජයේ හමුද හා එල් ටි ටි ඊ අතර වෙඩි හුවමාරුවකට මැදි වුනාද එසේත් නැත්නම් එල් ටි

[77] එම් අයි එම් මොහිදීන් මහතා විසින් දෙන ලද සාක්ෂිය: කොළඹ සැසිවාරය 2010 සැප්තැම්බර් 3

ටි ඊ ය විසින් සිවිල් වැසියන් මිනිස් පලිහක් ලෙසට පාවිච්චි කළා ද යන්න කරුණාකර පැහැදිලි කරන්න.

**එම් අයි එම් මොහිඩීන් මහතා:** මුස්ලිම් ජාතිකයින් හිතාමතාම ඉලක්ක කරා යැයි කියන්නට බැහ. නමුත් මුතූර් සිංහළ ගම්මානයක් වුනා නම් ආරක්ෂක හමුද මීට වඩා පරිස්සම් වෙනවා වගේ ම මුතූර් දවිඩ ගම්මානයක් වුනා නම් එල් ටි ටි ඊ යත් මේ විධියට හැසිරෙන්නේ නැහ. මා පෙන්වා දෙන්නට උත්සාහ කරන්නේ රජයේ ආරක්ෂක හමුද මෙන් ම එල් ටි ටි ඊ ය ද මුස්ලිම් ජාතිකයින් ගේ ආරක්ෂාව පිළිබඳ ව තැකිමක් කළේ නැහ කියන එකයි ඔබේ ප්‍රශ්නයට මගේ පිළිතුර.

මේ මුතූර් සිද්ධියේ දි එල් ටි ටි ඊ ය මුස්ලිම් ජාතිකයින් 200 පමණ ප්‍රාණ ඇපකාරයින් ලෙසට ගෙන ගියා. පැය 48 යන තුරු ආහාර හෝ පානීය ජලය ගමට ලැබුනේ නැහ. රජයේ හමුද හෝ රජයේ නිලධාරීන් මෙම සහනාධාර සැපයිම සිය වගකිමක් ලෙස සැලකුවේ නැහ. මම මෙතන දි පෙන්වා දෙන්න හදන්නේ අහිංසක මිනිසුන් වින්දිතයින් බවට පත් නොවන තැනට වැඩ කිරිමේ වගකිමක් රජයට තිබෙනවා කියලයි. මේක යුද්ධ අපරාධයක්. දෙපාර්ශවයම අහිංසක මිනිසුන්ට වෙඩි තිබ්බා, බෝම්බ ගැහුවා විතරක් නෙවෙයි රොකට් ප්‍රහාර පවා එල්ල කළා. මේ ප්‍රහාර වලින් පාසැල් රෝහල් පල්ලි විනාශ වුනා.

මගේ අත්දැකිම නම් අපි රජයේ හමුදවල පිළිසරණ නොසොයා සිටියා නම් අපිට අනතුරක් වෙන්න තිබුන ඉඩ ඉතාමත් අඩුයි. අපට ආරක්ෂාව සැපයිමට කීනියාවේ සිට මුතූර් වලට හමුද භටයින් 400 මාරු කළා. මේක එල් ටි ටි ඊ යට අවස්ථාවක් වුනා මුතූර් වලට පැමිණ හමුදවට පහර දෙන්න. ඔවුන් හමුදවට පමණක් නොවෙයි එක්කෝ මුස්ලිම් ජාතිකයන් ටත් පහර දුන්නා එසේත් නැත්නම් ප්‍රාණ ඇපකරුවන් ලෙසට අල්ලා ගෙන ගියා. එල් ටි ටි ඊ ය මුස්ලිම් ජාතිකයින්ට වධහිංසා පැමිණ වුයේ නැගෙහිර පළාතේ පමණක් නොවෙයි. උතුරු පළාතේත් තත්වය ඒකමයි. ඔවුන් ට උවමනා කළේ පුළුවන් තරම් මුස්ලිම් ජාතිකයින් ඝාතනය කරන්න. යුද්ධය ඊට ඉතා හොඳ අවස්ථාවක් උද කළා. නමුත් ආරක්ෂක හමුද මුස්ලිම් ජාතිකයින් ආරක්ෂා කරන්න කිසිම පියවරක් ගත්තේ නැහ. මෙය සම්පුරණයෙන්ම නොසලකා හැරිමක්. අපි උගත් පාඩම නම් ආරක්ෂක හමුද කිසිම අවස්ථාවක අප කෙරෙහි සැලකිල්ලක් දක්වන්නේ නැති බවයි. ඕනෑම කෙනෙකුට අපිට හානි කරන්නට ඉඩ දීලා ආරක්ෂක හමුද බලා සිටින බවයි අපිට පෙනි යන්නේ. මුස්ලිම් ජාතිකයින් ත්‍රස්තවාදයට සහයෝගය නොදුන්නත් අපි සියළුම බලාපොරොත්තු සුන් කර ගෙනයි ජිවත් වන්නේ.

**ආචාර්ය රෝහාන් පෙරේරා:** ඔබ විසින් පැහැදිලි කළ කාරණා සාරංශ කොට දක්වනවා නම් ඔබේ ස්ථාවරය වන්නේ සිතාමතා පහර දුන්නා නොව සිවිල් වැසියන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් රැකවරණයක් දිමට අපොහොසත් වු බවයි. මේක ද ඔබේ ස්ථාවරය?.

**එම් අයි එම් මොහිඩීන් මහතා:** මගේ ස්ථාවරය මා යලිත් පැහැදිලි කරන්නම්. මුතූර් සිංහළ ගම්මානයක් වුනා නම් ආණ්ඩුවේ හමුද වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනිමට ඉඩ තිබුනා. මුතූර් දවිඩ ගම්මානයක් වුනා නම් එල් ටි ටි ඊ ය වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනිමට ඉඩ තිබුනා. එහෙම වුනේ නැත්තේ මේක මුස්ලිම් ගම්මානයක් වු නිසා. මේක මුස්ලිම් ජාතිකයින්ට එරෙහි ව කරන ලද යුද්ධ අපරාධයක්.

**මහාචාර්ය කරුණාරත්න හඟවත්ත මැතිතුමා:** ඔබ ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයිමට අපොහොසත් විම නිසා මුස්ලිම් මිනිසුන් ඝාතනය කරන බවට උපකල්පනය කරනවා. මෙය සනාථ කිරිමට සාක්ෂි තිබෙනවාද? මම හිතන්නේ සාක්ෂි නැහ කියලයි. මම එහෙම කියන්න හේතුව නැගෙනහිර පළාතේ පමණක් නොව උතුරු හා උතුරු මැද පළාතේ සිංහළ ගම්මාන වලටත් එල් ටි ටි ඊ ය පහර දුන්නා.සිවිල් වැසියන්ව ගම්මාන වලින් නෙරපා හැරියා. එතන දි ආරක්ෂක හමුද සිවිල් වැසියන් ට ආරක්ෂාව දිමට අසමත් වන්නේ ඔවුන් සිංහළයන් විම නිසාද?

**එම් අයි එම් මොහිඩීන් මහතා:** මම ඔවුන් ඍජුවම මුස්ලිම් ජාතිකයින් ඉලක්ක කළා යැයි කියන්නේ නැහ. මුතුර් හි මුස්ලිම් ජාතිකයින් 32 මිය ගිය අතර 7 දෙනෙක් තවමත් ආගිය අතක් නැහ. මම හිතන්නේ මෙය යුද්ධය විසින් මුස්ලිම් ජනතාව ගේ උවමනාවන් ට විශාල හානියක් කළ බවට ප්‍රමාණවත් සාක්ෂියක්.

**මහාචාර්ය කරුණාරත්න හඟවත්ත මැතිතුමා:** මම ඒක පිළිගන්නවා. ඒත් අනිත් ජාතීන්ටත් මේ වගේම හානි සිද්ධ වුනා.

**එම් අයි එම් මොහිඩීන් මහතා:** මුස්ලිම් ජාතිකයින් සම්බන්ධයෙන් ප්‍රවේශය සැමවිටම වෙනස් එකක් වුනා.

මිට සමානවම උතුරු හා නැගෙනහිර පළාත් වල කොමිෂන් [78]සභාව පවත්වන ලද සැසි වාර වලදි ඇතැම් විට ප්‍රධාන සාක්ෂිකරුවන් ශ්‍රී ලංකා රජය හෝ යම්කිසි නිශ්චිත මානව හිමිකම් උල්ලංඝණයක් පිළිබඳව කරුණු ඉදිරිපත් කිරිමේ දි කොමසාරිස්වරුන් රජය ආරක්ෂා කිරිමට උත්සුක වු බව පෙනි ගිය අවස්ථා කිහිපයක්ම විය. උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව මේ ආකාරයට හැසිරිම පිළිබඳ ඉතාමත් කදිම නිදර්ශනයක් හාර වු එල් ටි ටි ඊ

[78] කොමිෂන් සභාව 2010 අගෝස්තු 14 වන දින සිට 2011 පෙබරවාරි 19 දින අතරතුර කාලයේ දි කොළඹින් පිට දිස්ත්‍රික්කයන් හි සැසිවාර ගණනාවක් පවත්වන ලදි.
2010 අගෝස්තු 14 ප්‍රාලේ වවුනියාව: ප්‍රාලේ චෙට්ටිකුලම්: මැණික් ෆාම් සරණාගත කඳවුර;
2010 අගෝස්තු 15 ප්‍රාලේ නැදුන්කර්නි, කිලිනොච්චි හා මුලතිව්:
2010 සැප්තැම්බර් 18 ප්‍රාලේ කිලිනොච්චි හා පච්චිලයිපල්ලි
2010 සැප්තැම්බර් 19 ප්‍රාලේ පුනාකරි
2010 සැප්තැම්බර් 20 ප්‍රාලේ මුලතිව්
2010 සැප්තැම්බර් 20 මුලතිව් ආරක්ෂක හමුද මුලස්ථානය
2010 ඔක්තෝබර් 09 ප්‍රාලේ මඩකලපුව
2010 ඔක්තෝබර් 09 ප්‍රාලේ ඔටර්මාවඩි මඩකලපුව
2010 ඔක්තෝබර් 11 ප්‍රාලේ ඒරාවුර්පත්තු මඩකලපුව
2010 නොවැම්බර් 11 ප්‍රාලේ අරියාලේ යාපනය
2010 නොවැම්බර් 12 ප්‍රාලේ ගුරුනගර් යාපනය
2010 නොවැම්බර් 12 ප්‍රාලේ වාඩුක්කෝඩෙයි නැගෙනහිර
2010 නොවැම්බර් 12 ප්‍රාලේ සිත්තරකර්නි
2010 නොවැම්බර් 14 ශාන්ත අන්තෝනි දේවස්ථානය කයිට්ස්
2010 දෙසැම්බර් 03 දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය ත්‍රිකුණාමලය
2010 දෙසැම්බර් 04 ප්‍රාලේ මුතුර්
2011 ජනවාරි 11 දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය පුත්තලම
2011 ජනවාරි 08 දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය මන්නාරම
2011 ජනවාරි 09 ප්‍රාලේ මඩු
2011 පෙබරවාරි 18 දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය මාතර
2011 පෙබරවාරි 19 දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය ගාල්ල

සාමාජිකයෙක් විසින් සාක්ෂි දීමේ දී පැහැදිලි විය. මෙම සාක්ෂිකරු යුද්ධ මුක්ත කලාපයේ එල් ටි ටි ඊ සංවිධානය විසින් බර අවි පාවිච්චි නොකළ බව ප්‍රකාශ කළ විට කොමිෂන් සභාව රජයේ සථාවරය සනාථ කිරිමේ වෑයමක නිරත වුයේය.

**කොමිෂන් සභාවේ සාමාජික සිරිපාල පලිහක්කාර මහතා හා රජයට භාර වු එල් ටි ටි ඊ මාධ්‍ය අංශය මෙහෙය වු ඉහළ පෙළේ නායකයෙක් අතර ඇති වු අදහස් හුවමාරුවඃ ශාන්ත අන්තෝනි දේවස්ථානය කයිට්ස් 2010 නොවැම්බර් 14**

**සිරිපාල පලිහක්කාර මහතාඃ** සිවිල් ජනතාවට සිදු වු හානි පිළිබඳව ඔබට යම්කිසි අදහසක් තිබේ ද.?

**සාක්ෂිකරු** නැහ

**සිරිපාල පලිහක්කාර මහතාඃ** එල් ටි ටි ඊ සංවිධානය සිවිල් වැසියන් මිනිස් පළිහයක් ලෙසට යොද ගත්තේ නැත්නම් සිවිල් වැසියන් ගේ මරන සංඛ්‍යාව මිට වඩා බොහෝ සෙයින් අඩුවිමට ඉඩ තිබුනා නේද?

**සාක්ෂිකරුඃ** ඇත්ත වශයෙන් ම සිද්ධ වුනේ යුද්ධයේ අන්තිම දවස් වල සිවිල් වැසියන් මාතලන් සහ කාකානායි හි පටු තීරයකට කොටු වුනා. මේ තැන් වල ඉඳ ගෙන එල් ටි ටි ඊ ය විසින් යුද්ධ හමුදවට ෂෙල් වෙඩි ගැහුවා. ආණ්ඩුවේ හමුදත් එල් ටි ටි ඊය ඔවුන් රැදි සිටි ස්ථාන ඉලක්ක කොට ප්‍රහාර එල්ල කළා. මේ නිසා සිවිල් වැසියන් විශාල සංඛ්‍යාවක් මිය ගියා. ඒ නිසයි මම කිව්වේ සිවිල් වැසියන් මිය යාම ගැන දෙපැත්තම වගකිව යුතුයි කියලා. යුද්ධයේ අවසාන දවස් වල එල් ටි ටි ඊ ය සිවිල් වැසියන් ට පිට වි යාමට ඉඩ දුන්නා නම් බොහෝ දෙනෙකු ගේ ජීවිත බේරෙන්නට තිබුනා.

**සිරිපාල පලිහක්කාර මහතාඃ** එල් ටි ටි ඊ ය විසින් ආයුධ යුද්ධ මුක්ත කලාපයට රැගෙන ආවාද?

**සාක්ෂිකරුඃ** ආයුධ නම් දකින්නට තිබුනේ නැහ.

**සිරිපාල පලිහක්කාර මහතාඃ** යුද්ධ මුක්ත කලාප තුනක් තිබුනා. එල් ටි ටි ඊ ය ප්‍රහාර එල්ල කළේ මේ යුද්ධ මුක්ත කලාප වල ඉඳ ගෙන.

**සාක්ෂිකරුඃ** දෙපැත්තෙන් එක පැත්තක් වත් යුද්ධ මුක්ත කලාපය පිළිබඳ සැලකිලිමත් වුනේ නැහ.[79]

## වින්දිතයින් ගේ කාලත්‍රයන්ට හා පවුල් සාමාජිකයින්ට නිසි සැලකිලි දැක්විමට අසමත්විමඃ

[79] සැසිවාරය ශාන්ත අන්තෝනි දේවස්ථානය කයිට්ස් 2010 නොමැම්බර් 14 http://www.llrc.lk/images/stories/Kayts_Public_Sittings_Amended.pdf

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව විසින් යුද්ධය පැවති ප්‍රදේශයන් හි ප්‍රසිධ සැසිවාර පවත්වන බව නිවේදනය කිරීමත් සමගම දහස් ගණනක් සිවිල් වැසියන් කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දිමට ඉදිරිපත් වූවෝය. මෙයින් බොහෝ දෙනෙක් වැන්දඹු කාන්තාවන් වූ අතර ඔවුහු සිය මිය ගිය එසේත් නැත්නම් හමුද අත් අඩංගුවේ සිටින හෝ අතුරුදහන් වූ සිය සැමියන්, දරුවන් හෝ පවුලේ සාමාජිකයින් පිළිබඳ තොරතුරු සොයා පැමිණියෝය. නමුත් බොහෝ දෙනෙකුට කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දීමට ඉඩක් නොලැබුන අතර ඔවුන්ට ලිඛිතව සිය කරුණු ඉදිරිපත් කරන මෙන් ඉල්ලා සිටින ලදි. සාක්ෂි දිමට අවසර ලැබූ තැනැත්තන් ඇතැම් සාක්ෂිකරුවන් විසින් දෙපාර්ශය ම සිදු කරන ලද කෲර වධ හිංසා හෙළිදරව් කරන ලද්දේ එම තොරතුරු හෙළිදරව් කිරීම නිසා සිය ජීවිත වලට පවා එල්ල විය හැකි තර්ජන නොසලකමිනි.

උතුරු හා නැගෙනහිර පළාත් වල පවත්වන ලද සැසිවාරයන් හි දි කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිකරුවන් විසින් යුද්ධ සමයේ සිදු වූ කෲර වධහිංසා පිළිබඳ සාක්ෂි විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් කරන ලද්දේය. බොහෝ අවස්ථාවලදි මෙම සැසිවාර ඉතාමත් කෙටි විය. කොමසාරිස්වරුන් ගේ සාක්ෂි විභාගයන් පිළිබඳ අනවධානයෙන් සිටින බව පෙනුන අතර සවිස්තරාත්මක ප්‍රශ්න කිරීමකින් සත්‍ය කරුණු රැස් කිරීමට තමන් තුළ උනන්දුවක් නැති බව මැනවින් ප්‍රදර්ශනය කළෝය. බොහෝ විට අනුගමනය කළ උපාය වූයේ කෙටි ප්‍රශ්න දෙක තුනක් අසා අනෙක් විස්තර ලිඛිතව ලේකම් කාර්යංශයට බාර දෙන මෙන් උපදේස් දීමය. පහත දැක්වෙන්නේ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ පළ කොට තිබූ සැසිවාර දෙකක වාර්තා වලින් උපුටා ගන්නා ලද කොටස්ය. මෙම කොටස් නිරීක්ෂණය කරන විට සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් කොමසාරිස්වරුන් තුළ මානව දයාවක් නොතිබුන බව මැනවින් පෙනි යයි.

**කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයඃ2010 සැප්තැම්බර් 18ඃ සාක්ෂි අංක 9**[80]

**සාක්ෂිකරුඃ** මගේ පුතා වැලිකන්ද රැඳවුම් කඳවුරේ රඳවා ගෙන සිටිනවා. මගේ සැමියා බරපතළ ලෙස රෝගාතුර වී ඔත්පලයි. අනෙක් දරුවන් හතර දෙනා ම ගෑනු ළමයි. යුද්ධ හමුදව එල් ටි ටි ඊ ය සමග සම්බන්ධතා තිබූ සියළු දෙනාටම සිය නම් තමන් වෙත ලියාපදිංචි කරන මෙන් දැනුම් දුන්නා. ඒ අනුව මගේ පුතාත් එහි ගොස් ලියා පදිංචි වුනා. නමුත් ඔහු අත් අඩංගුවට අර ගෙන දැනට මාස හයක් වෙනවා. මේ දක්වා ඔහු තාම නිදහස් කළේ නැහ.

**කොමසාරිස්වරයෙක්ඃ** ඇයට කියන්න අපි නිසි බලධාරින් ට ලිඛිත දැනුම් දෙන බව.

**සාක්ෂිකරුඃ** කරුණාකර අපිට උදව් කරන්න. වවුනියා පොලිසියේ මේ ගැන අපි පැමිණිලි කර තිබෙනවා. කිහිම වතාවක් ම වවුනියා පොලිසියට ගියා, එත් වැඩක් වුනේ නැහ.

---

[80] සැසිවාරයඃ දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය කිලිනොච්චිය 2010 සැප්තැම්බර් 18 LLRC/PS/18-09-10/01. http://www.llrc.lk/images/stories/docs/Sep2010/Killinochchi_Div_Sec_-_Amended.docx

ඔවුන් පුතාව මාස හයකින් නිදහස් කරන බව කිව්වා. දැනට අවුරුද්දක් වෙනවා තවම නිදහස් කළේ නැහ.

**කොමසාරිස්වරයෙක්:** හරි හරි.

## ගුරුනගර් සංස්කෘතික ශාලාව: යාපනය: 2010 නොවැම්බර් 12[81]

**සභාපතිවරයා:** අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව ඔබ විස්තර ලබා දුන්නා ද?

**පරිවර්තක: ( සභාපති වරයාට)** ඇය ඊයේ එය ලබා දුන්නා.

**සභාපති:** ඔබ ඊයේ දුන්නා නම් අද වෙන කොට අපිට වෙලා මදි.

**සාක්ෂිකාරිය:** මට ළමයි හතර දෙනෙක් ඉන්නවා. මට කාගෙන්වත් උදව්වක් නැහ. මට මගේ සැමියා සොයා දෙන්න. එයා කොහේ ඉන්නවාදැයි මා දන්නේ නැහ.

**සභාපති:** අපි සොයා දෙන්න උත්සාහ කරන්නම්.

**සාක්ෂිකාරිය:** මගේ ලොකු පුතාට අවුරුදු 14 යි.එයා තවම පාසැල් ශිෂ්‍යයෙක්.

**සභාපති:** ( පරිවර්ථකට) එයාට කියන්ඩ. දීලා තියෙන්නේ ඊයේ. අදම ඒක කරලා දෙන්ඩ පුළුවන්ද?

යාපනයේ සැසිවාරයන් නිරික්ෂණය කළ සිවිල් සංවිධානයන් ගේ මතය වුයේ කොමිෂන් සභාව අති විශාල සාක්ෂිකරුවන් පිරිසක් බලාපොරොත්තු නොවූ බැවින් ඔවුන් ගේ සුදනම් විම අප්‍රමාණවත් වූ බවයි. එක් සාක්ෂිකරුවෙකු වෙන් කරන ලද කාලය ඉතාමත් කෙටි වූ අතර ප්‍රමාණවත් භාෂා පරිවර්ථකයින් සංඛ්‍යාවක් ද නොසිටියෝය.

යාවත්කාලීන කරන ලද කොමිෂන් සභා පිහිටුවිම පිළිබඳ අන්තර් ජාතික සම්මුතියට අනුව 'යම් කිසි සාක්ෂි විභාගයක දි සාක්ෂිකරුට හෝ සාක්ෂිකාරියට සහාය විම පිණිස සමාජ සේවකයින් ආදළ අවස්ථාවන් හි දි සෞඛ්‍ය සේවකයින් හා මනෝ චිකිත්සකයින් ගේ සේවය ලබා ගත යුතුය. විශේෂයෙන්ම පරිවර්ථකයින් ගේ සාහය සාක්ෂි දිමට පෙර හා පසුවත් ලබා දිම වැදගත් වේ.[82] මෙකී සේවාවන් සැපයීම සම්පුර්ණයෙන් ම රජයේ වියදමින් කළ යුතුවේ'.[83]

2010 සැප්තැම්බර් 18 වන දින පච්චවිල්ලපල්ලෙයි ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පැවැති සැසිවාරය ආර්මභ කරන ලද්දේ නියමිත වේලාවට වඩා ප්‍රමාද වීය. සාක්ෂි කූඩුවට නැගුන ප්‍රථම සාක්ෂිකාරිය මේ කාරණය සම්බන්ධයෙන් පැමිණිලි කරන්නට පසුබට නොවිය.

---

81 සාක්ෂි අංක 12, ගුරුනගර් සංස්කෘතික ශාලාව යාපනය 2010 නොවැම්බර් 12

82 10(b) වන මුලධර්මය යාවත්කාලින කරන ලද මානව හිමිකම් ආරක්ෂා කොට ප්‍රවර්ධනය කිරිම මගින් වරදින් නිදෙස් විම මැඩීම පිළිබඳ මුලධර්ම සංග්‍රහය: 2005, United Nations, E/CN.4/2005/102/Add.1, 8 February 2005 http://daccess-dds-ny.un.org/doc/UNDOC/GEN/G05/109/00/PDF/G0510900.pdf?OpenElement

83 එම 10 (c) http://daccess-dds-ny.un.org/doc/UNDOC/GEN/G05/109/00/PDF/G0510900.pdf?OpenElement

'අපි මෙතන පැය දෙකකට වඩා බලා ගෙන හිටියා. අපිට දැනුම් දුන්නේ කොමිෂන් සභාවේ වැඩ 2.30ට පටන් ගන්නවා කියලා. නමුත් දැන් 4.30 යි. හුඟක් සාක්ෂිකරුවන් ආපසු ගියා.'[84]

ද සෙන්ටර් ෆෝ හියුමන් රයිට්ස් නැමති ශ්‍රී ලංකික රාජ්‍ය නොවන සංවිධානය විසින් 2011 ජනවාරි 8 වන දින මන්නාරමේ පැවති කොමිෂන් සභා සැසිවාරය පිළිබඳව අදහස් දක්වමින් කියා සිටියේ ඇතැම් සාක්ෂිකරුවන් ට විශේෂ සැලකිලි දැක් වූ අතර සාමාන්‍ය ජනතාවට එතරම් සැලකිල්ලක් නොදැක් වූ බවයි.

ජනවාරි 8 වන දින 9.30 ට ආරම්භ කිරීමට නියමිත වූ සැසිවාරය ආරම්භ කරන ලද්දේ 10.30ට ය. හියුමන් රයිට්ස් සංවිධානයට අනුව රැස්වීම් ශාලාවේ ප්‍රමාණවත් ආසන නොතිබුන හෙයින් ඉතා දුර බැහැර සිට පා ගමනින් රැස්වීම් පැමිණි පිරිස් වලට එළි මහනේ තැන් තැන් වල රැදී සිටීමට සිදුවීමෙන් දැඩි වෙහෙසකාරී තත්වයකට පත් වූවන් ට සාක්ෂි දීම පිණිස අවස්ථාව ලබා දෙන ලද්දේ සවස 4.30 ට පමණය.

මෙදින මන්නාරමේ අගරදගුරු අතිඋතුම් රායප්පා ජෝශප් හිමිපාණනන් ඇතුළු ආගමික හා ප්‍රජා නායකයින් කිහිප දෙනෙක් කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන්නෝය. දේශීය හා ජාත්‍යයන්තර මාධ්‍යවේදීන් මෙම සාක්ෂිකරුවන් ගේ සැසිවාරය ආවරණය කිරීමට මහත් උනන්දුවක් දක්වන ලද්දේය. තවද, මෙම සාක්ෂිකරුවන් සිය සාක්ෂි ඉදිරිපත් කිරීම පිණිස ඉතා දීර්ඝ කාලයක් ගත් හෙයින් යුද්ධය නිසා විවිධ වධහිංසංවන් ට ගොදුරු වූ සාමාන්‍ය සිවිල් වැසියන්ට සිය සාක්ෂි ඉදිරිපත් කිරීමටත් අවස්ථාවක් නොලැබීම මෙම සැසිවාරයන් නිම කරන ලද්දේය.

එසේම මෙම සැසිවාරයේ දී උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ සභාපතිවරයා සිය අතුරු වාර්තාව මගින් මහජනතාව මුහුණ දී සිටින ගැටළු වලට විසඳුම් සපයා තිබෙන බව ප්‍රකාශ කළ නමුත් ඉංග්‍රිසි බසින් කළ එම කථාව දමිල බසට පරිවර්ථනය නොකළ නිසා සභා ශාලාවේ සිටි බහුතරයකට සභාපතිවරයා කියන්නේ කුමක්දැයි නොතේරින.[85]

ශ්‍රී ලංකා රජය ඇත්ත වශයෙන් ම ( ජාතීන් අතර ) සංහිඳියාව ප්‍රාර්ථනා කරන්නේ නම් සත්‍ය හෙළිදරව් කර ගැනිමට හා යුක්තිය ඉෂ්ට කිරීමට අවංක උත්සාහයක් දැරිය යුතුය. යුද්ධය නිසා සිවිල් වැසියන් ට මුහුණ දීමට සිදුවූ දුක් ගැහැට විමසා බැලීමට කිසියම් යාන්ත්‍රණයක් පිහිටුවන්නේ නම්, එම යාන්ත්‍රණයේ අරමුණු ආවරණය කරන අධිකාරියක් හා කළමනාකරණයට අවශ්‍ය සම්පත් ප්‍රමාණවත් පරිදි සම්පාදනය කළ යුතුවා පමණක් නොව එම යාන්ත්‍රණයේ සේවය පතන සිවිල් වැසියන් ට සාධාරණ සහභාගිත්වයක් ද සහතික කළ යුතුවේ. එබඳු උත්සාහයක දි සාක්ෂිකරුවන් ගේ ආරක්ෂාව සහතික කළ යුතුවාක් මෙන් ම මානුෂික මෙන් ම, රජයේ නිලධාරින්ට මෙන් ම එක සමානව සැලකිම ද අපේක්ෂා කෙරේ.

[84] සැසිවාරය පච්චලයිපල්ලි ප්‍රාදේශිය ලේකම් කාර්යාලය 2010 සැප්තැම්බර් 18 LLRC/PS/18-09-10/02, page 1

[85] රංජිත කිර්ති තෙන්නකෝන් ' උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභා මන්නාරම් සැසිවාරය: බලාපොරොත්තු හා කනස්සල්ල අතර දෝලනයක්'
http://www.srilankaguardian.org/2011/01/llrc-mannar-sessions-oscillation.html

**සාක්ෂිකරුවන් ට එල්ල කරන ලද තර්ජන වැළැක්වීමට අපොහොසත් වීම:**

ශ්‍රී ලංකාව විශේෂයෙන් ම උතුරු හා නැගෙනහිර පළාත් හි සිවිල් ජනතාව බලහත්කාර අතුරුදහන් කිරීම් හා අධිකරණ බාහිර ඝාතන ඇතුළු විවිධ තර්ජනයන් ට අඛණ්ඩව මුහුණ දුන් බව වාර්තා වේ. විශේෂයෙන් ම අත් අඩංගුවේ පසුවන හිටපු එල් ටී ටී ඊ සාමාජිකයන්ට හා ඔවුන් ගේ කාලත්‍රයන් මෙන් ම  යම්කිසි සම්බන්ධයක් තිබූ තැනැත්තන් ද ඉතාමත් අනතුරුදායක  තත්වයක පසු වෙති. මානව හිමිකම් හා බරපතළ අපරාධ සම්බන්ධ සාක්ෂිකරුවන් ඝාතනය, තර්ජනය කිරීම හා අයුතු බලපෑම් කිරීම් ශ්‍රී ලංකාවේ ඉහළ පරිමාවකින් සිදු වන්නකි.

යම්කිසි විමර්ශනයක දී සාක්ෂිකරුවන් ගෙන් ප්‍රමාණවත් තොරතුරු ලබා ගැනීමට නම් ඊට සුදුසු වාතාවරණයක් නිර්මාණය කළ යුතු අතර සාක්ෂිකරුවන් ට එරෙහිව කරනු ලබන තර්ජන වැළැක්වීමට වැඩ පිළිවෙළක් තිබිය යුතුය. යාවත් කාලීන කරන ලද මූලධර්ම 10 ට අනුව සාක්ෂිකරුවන් ගේ ශාරීරික ආරක්ෂාව හා විශේෂයෙන් ම මානසික සුවතාව පිළිබඳ සැලකිලිමත් විය යුතු අතර ඉල්ලා සිටින්නේ නම් වින්දිතයින් ගේ හා සාක්ෂිකරුවන් ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කර දීමට ද කොමිෂන් ් සභා බැඳී සිටිය යුතු යැයි කියවේ.

කොමිෂන් ් සභාව සිය සැසිවාර පැවැත්වූ බොහොමයක් ස්ථානයන් හි සාක්සිකරුවන් මෙන් ම සිවිල් සංවිධාන නියෝජිතයින් ද  පීඩනයකට හසු කිරීමේ අරමුණින් නොයෙකුත් තාඩන පීඩන කරන ලදි. 2010 නොවැම්බර් මස කයිට්ස් හි පැවති සැසිවාරයේ දී ඊ පී ඩී පී සංවිධානයේ යැයි සැක කරනු ලැබූ තැනැත්තන් විසින් සැසිවාර පැවැත්වෙන අතර තුර දී සාක්ෂිකරුවන් ඡයාරූප ගත කොට ඉන් නොනැවති සිවිල් සංවිධාන නියෝජිතයින් ද ඡායාරූප ගත කරන ලද බව වාර්තා විය.

සෙන්ටර් ෆෝ හියුමන් රයිට්ස් සංවිධානය විසින් වාර්තා කළ ආකාරයට මඩු හි පෙරියපච්චන්රිචාන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති සැසි වාරයේ දී යුද්ධ හමුදාව විසින් සාක්ෂිකරුවන් ඡායාරූප ගත කළේය. එම සැසිවාරය උදෑසන 9ට ආරම්භ වීමට නියමිත ව තිබූ නමුත් 10.15 ට පමණ සැසිවාරය ආරම්භ කිරීමට පෙර එහි පැමිණි යුද්ධ හමුද නිලධාරීන් බැහැරින් පැමිණි කොමිෂන් ් සභා කාර්‍ය මණ්ඩලය හා සාක්ෂිකරුවන් ඡායරූප ගත කළේය. කොමිෂන් ් සභා සැසිවාරය ආරම්භ කරන ලද්දේ මේ ඡායාරූප ගත කිරීමේ කටයුතු නිමවීමෙන් පසු උදෑසන 10.45ට පමණය.

නමුත් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් ් සභාව ට සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ක්‍රියා පටිපාටියක් නොතිබුනි. කෙසේ වෙතත් මෙරට අධිකරණ පද්ධතියට ද සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පටිපාටියක් නොමැත. නීති ක්ෂේත්‍රයේ විශේෂඥයින් ගේ විවේචන මධ්‍යයේ වුවද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට 2007 දී ප්‍රථම වරට හඳුන්වා දෙන ලද සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම් පත නැවත 2008 දී ඉදිරිපත් කරන ලද නමුත් එය ද සම්මත වුයේ නැත.

කොමිෂන් ් සභාව ඉදිරියට පැමිණි සාක්ෂිකරුවන් සමහරක් දෙනා විවිධ තර්ජනයන් ට ගොදුරු වුවත්, ජනාධිපතිවරයා වෙත යවන ලද උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් ්

සභාවේ අතුරු වාර්තාවේ ද සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සම්බන්ධ නිර්දේශ කිසිවක් ඇතුලත් නොවිය.[86]

## 4 උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව: රජයේ ප්‍රතිචාරය

2010 සැප්තැම්බර් මස දී[87] උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව විසින් සිය අතුරු වාර්තාව ජනාධිපතිවරයාට බාර දෙන ලද්දේය. එහි සාක්ෂිකරුවන් විසින් පැමිණිලි කරන ලද බොහෝ කාරණා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කර තිබුනි. නමුත් අතීතයෙහි සිදු වූ වධහිංසා පිළිබඳව වගවීම සම්බන්ධයෙන් කිසිදු නිර්දේශයක් ඉදිරිපත් නොකෙරිණ.

2010 ඔක්තෝබර් මස අන්තර් අමාත්‍යංශ උපදේශක කමිටුවක් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ අතුරු නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස පිහිට වන ලදි. අත් අඩංගුවේ පසුවන රැඳවියන්; නීතිය හා සාමය; පරිපාලනය හා භාෂා හා සමාජ හා ආර්ථික ගැටළු උපදේශක කමිටුව විසින් ආමන්ත්‍රණය කරනු ඇතැයි අපේක්ෂා කෙරින. [88]

**අත්අඩංගුවේ තබා ගැනීම:**

බන්ධනාගාර හා ගැසට් පත්‍රයේ පළ කරන ලද රැඳවුම් මධ්‍යස්ථාන, පොලිසිය හා පුනරුත්ථාපන කඳවුරු හා විවිධ ආයුධ සන්නද්ධ කණ්ඩායම් විසින් පවත්වා ගෙන යන රැඳවුම් මධ්‍යස්ථාන ඇතුළු විවිධ ස්ථාන වල ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත හා හදිසි නීතිය යටතේ කිසිදු චෝදනාවකින් තොරව දහස් ගණනක් කාන්තාවන් හා පුරුෂයින් රඳවා සිටියි. 2010 සැප්තැම්බර් අතුරු වාර්තාවේ මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරන ලදි.

අ) මෙම රැඳවියන් පිළිබඳ චෝදනා වෙන වෙන ම විභාග කිරීම පිණිස විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරනු ඇත. තවද මෙම කාර්යය ට සහයෝගය දෙනු පිණිස නීතිපති දෙපාර්තුමේන්තුවේ විශේෂ කාර්‍ය භාර නිලයක් පිහිටු විය යුතුය.

ආ) කොමිෂන් සභාව ඉදිරියේ බොහෝ දෙනෙක් විසින් සිය පවුලේ උදවිය ආරක්ෂ අංශ විසින් අත් අඩංගුවට ගත් පසු කුමන ස්ථානයක රඳවා ඇත්දැයි නොදන්නා අතරම මෙම

---

[86] රංජිත් කිර්ති තෙන්නකෝන් ' උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව මන්නාරම සැසිවාරය' බලාපොරොත්තු හා කනස්සල්ල අතර දෝලනයක්' http://www.srilankaguardian.org/2011/01/llrc-mannar-sessions-oscillation.html

[87] ' උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව: රජයට ඉදිරිපත් කරන ලද අතුරු වාර්තාව' Groundviews, 11 November 2010, http://groundviews.org/2010/11/11/llrc-interim-report-to-government/

[88] මෙම කමිටුවේ සභාපතිත්වය උසුලන ලද්දේ නීතිපතිවරයා වූ මොහාන් පිරිස් විසිනි. කමිටුවේ අනෙක් සාමාජිකයින් වූයේ ආරක්ෂ අමාත්‍යංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම් පි බි අබේකෝන, අධිකරණ අමාත්‍යංශයේ ලේකම් සුහද ගම්ලත, ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ ලේකම් ආචාර්ය විලි ගමගේ, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ ලේකම් ඒ දිසානායක හා විදේශ කටයුතු අමාත්‍යංශයේ ලේකම් රොමේෂ් ජයසිංහ යන මහත්වරුන්ය. මෙම කමිටුවේ ලේකම් වූයේ උතුර සංවර්ධනය සඳහා පිහිටුවන ලද ජනාධිපති කාර්ය සාධක බලකායේ ලේකම් ඩි එස් දිවාරත්න මහතාය. 'Diplomatic lapses put SL under world pressure," *Sunday Times*, 6 March 2011 http://www.sundaytimes.lk/110306/Columns/political.html

රැඳවියන් පවුලේ සාමාජිකයින්ට දැනුම් දීමකින් තොරව රැඳවුම් ස්ථානයෙන් රැඳවුම් ස්ථානයට මාරු කරන බවට ද පැමිණිලි ඉදිරිපත් විය.

මේ අනුව කොමිෂන් සභාව විසින් පහත සඳහන් ගැටළු විසඳීම පිණිස අධිකරණ අමාත්‍යංශයෙහි වෙන ම ඒකකයක් පිහිට විය යුතු යැයි නිර්දේශ කරන ලදි.

1- රැඳවියන් ගේ නාම ලේඛනයක් ප්‍රසිද්ධ කිරීම
2- යම්කිසි රැඳවියෙක් නිදහස් කරන විට ඔහුට හෝ ඇයට නිදහස් කළ බවට සහතිකයක් නිකුත් කිරීම; එමගින් අළුත් සාක්ෂි අනාවරණය වුවහොත් මිස නිදහස් කළ රැඳිවියන් නැවත අත් අඩංගුවට ගැනීම වළක්වනු ඇත.
3- අධිකරණ පද්ධතියෙහි දැනට පවතින අනවශ්‍ය ප්‍රමාදය වැළැක්වීමට පියවර ගැනීම[89]

අන්තර් උපදේශක කමිටුවේ ප්‍රගති වාර්තාවට අනුව නීතිපති වරයා විසින් එල් ටි ටි ඊ සැකකරුවන් ගේ විමර්ශනයන් කඩිනම් කිරීම පිණිස නියෝජ්‍ය සොලිසිටර ජනරාල් වරයා සභාපතිත්වයෙන් සිව් පුද්ගල කමිටුවක් පත් කරන ලදි.[90] මෙම ප්‍රගති වාර්තාව ඒ සම්බන්ධයෙන් වැඩි විස්තරයක් ඉදිරිපත් නොකරන නමුත් ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් වෙත වාර්තාවන අන්දමට 2011 මාර්තු මස ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ බූස්සේ රඳවා සිටි එල් ටි ටි ඊ සැකකරුවන් 118 නිදහස් කළ ජනමාධ්‍ය මගින් ප්‍රසිධියක් දෙනු ලැබුවත් ඇත්ත වශයෙන් ම සිදු වී ඇත්තේ ත්‍රස්ත විමර්ශන ඒකකය යටතේ සිටි ඔවුහු බූස්සේ කඳවුරේ සිට හදිසි නීතිය යටතේ පූන්තෝට්ටම් කඳවුරට මාරු කිරීම පමණි.

මේ දක්වාම රැඳවියන් පිළිබඳ අංග සම්පූර්ණ නාම ලේඛනයක් ප්‍රසිධ කොට නැති අතර 3,000 ආසන්න පිරිසක් එසේ රඳවා ඇතැයි වාර්තා වේ.[91]

2011 ජූනි මාසයේ දි පොලිස් මාධ්‍ය ප්‍රකාශක විසින් ත්‍රස්තවාදි විමර්ශන ඒකකය මගින් පොලිස් අත් අඩංගුවේ සිටින රැඳවියන් පිලිබඳ තොරතුරු පවුලේ අයට පමණක් ලබා ගැනීම පිණිස මධ්‍යස්ථාන තුනක් පිහිටුවන බව ප්‍රකාශ කරන ලදි. පළමුවැන්න වවුනියාවේ නියෝජ්‍ය අධිකාරි කාර්යාලයේ ද දෙවැන්න කොළඹ ත්‍රස්ත විමර්ශන ඒකක මුලස්ථානයේ ද තුන්වැන්න බූස්සේ ද පිහිටුවන බව වාර්තා විය.රැඳවියන් විසින් ඉල්ලා සිටියත් පවුලේ අයට හැර වෙනත් කිසිම පුද්ගලයෙකුට හෝ සංවිධානයකට රැඳවියා පිළිබඳ තොරතුරු නිකුත් නොකරන බවද ඒ සමගම දැනුම් දි තිබුනි. 2011 ජූනි මස 24 දින පොලිස් මාධ්‍ය ප්‍රකාශක ප්‍රසාන්ත ජයකොඩි ප්‍රකාශයක් කරමින් වවුනියාව බූස්ස හා කොළඹ පිහිටි තොරතුරු මධ්‍යස්ථානයන් ගෙන් 1300 කට ආසන්න පිරිසක් පෞද්ගලිකව පැමිණ ද තවත් 250 කට ආසන්න පිරිසක් දුර කථන මගින් තොරතුරු විමසා

---

[89] කොමිෂන් සභාවේ අතුරු වාර්තාව සැප්තැම්බර් 2010

[90] එම

[91] එස් සේල්වර්කුමාර් "KP rehabilitated, says Keheliya" The Nation (Sri Lanka), 10 July 2011 http://www.nation.lk/2011/07/10/news5.htm

සිටි බවත් නමුත් අවශ්‍ය තොරතුරු ලබා දීමට හැකි වුයේ ඉන් සියයට 7 කට පමණ ප්‍රමාණයකට බවත් ප්‍රකාශ කළේය. මෙම තොරතුරු මධ්‍යස්ථාන වෙත ලැබූ ඉල්ලීම් බහුතරයක් යුද්ධ හමුදාව විසින් අත්අංඩගුවට ගත් තැනැත්තන් පිළිබඳව හා රඳවා ගැනීමේ නියෝගයකින් තොරව පොලිසිය විසින් අත් අඩංගුවේ තබා ගෙන සිටින තැනැත්තන් පිළිබඳව විය. ඉහත කී තොරතුරු මධ්‍යස්ථාන මගින් ලබා ගත හැක්කේ ත්‍රස්ත විමර්ශන ඒකකය සතු තොරතුරු පමණක් බවත් ඔහු තවදුරටත් කියා සිටියේය. මේ අනුව මෙ නව වැඩ පිළිවෙළ යටතේ තොරතුරු ලබා ගැනීමට උත්සාහ බොහෝ දෙනෙකු ගේ බලාපොරොත්තු අවසානයේ දී සුන් වුයේය.[92]

2011 ජුලි මස ශ්‍රී ලංකාවේ කැබිනට් මණ්ඩල ප්‍රකාශක 2011 අවසානය වන විට හදිසි නීතිය ක්‍රමයෙන් ලිහිල් කිරිමට බලාපොරොත්තු වන බව ප්‍රකාශ කළේය. මීට පෙර අවස්ථා කිහිපයක දීම රජය හදිසි නීතිය ඉවත් කරන බව ප්‍රකාශ කළත් හදිසි නීතියෙහි මුලික වෙනසක් කිරිමට රජය අපොහොසත් වු නිසා මෙම ප්‍රකාශය නියාමනය කළ යුත්තකි.[93]

**ඉඩම්:**

අන්තර් ආයතන උපදේශක කමිටුව ව සඳහන් කරන ආකාරයට ' ඇතැම් ප්‍රශ්න සඳහා අවශ්‍ය විසඳුම් පවතින නීතිමය රාමුව යටතේ ඇති විසඳුම් ඉදිරිපත් කළ නොහැකි' බව කියමින් ඉඩම් පිළිබඳ ප්‍රශ්නය නිරාකරණය කිරිම පිණිස ඉඩම් පරිහරණය පිළිබඳ නව ක්‍රමවේදයක් සකස් කළ යුතු යැයි කියයි. එම කමිටුව ශ්‍රී ලංකිකයින් ට ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක වාසය කිරිමට තිබෙන අයිතිය පිළිගත් අතර සිවිල් වැසියන් බලහත්කාරයෙන් පදිංචි කිරිමේ ප්‍රතිපත්තියක් නොමැති බව ද සඳහන් කරයි. ශ්‍රී ලංකාවේ රජය අධි ආරක්ෂක කලාපයන් හි පිහිටා ඇති ඉඩම් ආරක්ෂක හේතුන් මත හැර ක්‍රමානුකුලව නිදහස් කිරිමේ ක්‍රියා වලියකට මුල පිරිය යුතුය. එම කමිටුවට අනුව යාපනයේ පලාලියි හි පිහිටි නිවාස 256 ක් සිවිල් වැසියන්ට නැවත භාර දිමට පියවර ගෙන තිබෙන බවද සඳහන් කරයි. එම වාර්තාව තවදුරටත් බිම් බෝම්බ ඉවත් කිරිමෙන් පසු සිවිල් ජනතාවට ආපසු භාර දීම පිණිස හෙක්ටයාර් 2500 කට ආසන්න භුමි ප්‍රමාණයක් වෙන් කොට ඇති බව ද සඳහන් කළේය.

**භාෂාව:**

92 ආගිය අතක් නැති තැනැත්තන් ගෙන් තොරතුරු තිබෙන්නේ 7% ගේ පමණි. " *Daily Mirror* 24 June, 2011 http://www.dailymirror.lk/news/12099-only-seven-per-cent-get-information-on-detainees.html

93 නිදර්ශනයක් වශයෙන් බලන්න "Govt. to relax Emergency Regulations", *Daily News*, 28 July 2011 http://www.dailymirror.lk/news/12658-govt-to-relax-emergency-regulations.html

සහ "Prolong Emergency Regulations not Govt's Desire", *The Official Government News Portal of Sri Lanka*, 28 July 2011

භාෂාව පිළිබඳ අන්තර් ආයතන කමිටුවේ නිර්දේශය වුයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් දැනට නිකුත් කොට ඇති ගැසට් නිවේදන හා චක්‍රලේඛන ක්‍රියාත්මක කළ යුතු බව වූ අතර 2010 යෝජිත ද්‍රවිඩ පොලිස් නිලධාරින් පත් කිරිමේ වැඩ පිළිවෙළත් අගය කළේය.

**නීතිය හා සාමයඃ**

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව ඉදිරියට විශේෂයෙන් ම යාපනයේ දි සාක්ෂි දිමට පැමිණි සාක්ෂිකරුවන් විසින් කප්පම් ගැනිම්, පැහැර ගැනිම් හා අනෙකුත් බරපතළ අපරාධ උත්සන්න විමත් නීතිය හා සාමය බිඳ වැටිමත් අවධානයට යොමු කළේය. බොහෝ සිද්ධීන් සම්බන්ධයෙන් චෝදනා එල්ල කරන ලද්දේ ආරක්ෂක හමුදා නිලධාරීන් වෙතය. කොමිෂන් සභාවේ අතුරු කමිටු වාර්තාවේ එක් නිර්දේශයක් වුයේ ආයුධ සන්නද්ධ කණ්ඩායම් නිරායුධ කිරිමය. අන්තර් ආයතන කමිටුව වාර්තා කළේ ශ්‍රී ලංකා රජය එල් ටි ටි ඊ ය නැගෙනහිර පළාතේ පරාජය කිරිමෙන් පසු ක්‍රියාත්මක කළාක් උතුරු පළාත සම්බන්ධයෙන් ද සියළුම අනවසර ගිනි අවි වහාම බාර දෙන අවසාන දිනයක් ප්‍රකාශයට පත් කරන ලෙසය. ඔවුහු තවදුරටත් රජය ගිනි අවි ආඥා පනත සංශෝධනය කරමින් අනවසර ගිනි අවි හා බෝම්බ සන්තකයේ තබා ගැනිම ඇප ලබා නොදිය යුතු වරදක් වශයෙන් නීති ගත කිරිමට බලාපොරොත්තු වන බවත් එය බොහෝ විට අනවසර ගිනි අවි බාර දෙන තුරු පමණක් වලංගු විය හැකි බවත් කියා සිටියෝය.

2011 ජුනි මාසයේ අවසානය වන විටත් යාපනය දිස්ත්‍රික්කය තුළ පැහැර ගැනිම් හා ඝාතන දිගින් දිගටම වාර්තා වු නිසා ඉහත කී කාරණය සම්බන්ධයෙන් යම් ප්‍රගතියක් ඇති වුයේ ද යන්න නිශ්චිතව කිව නොහැකිය.[94] අපරාධ සිද්ධීන් සම්බන්ධයෙන් සැක කරනු ලැබු පුද්ගලයින් ආයුධ සන්නද්ධ කල්ලි වල සාමාජිකයෝ වන බවත් ඔවුහු ආරක්ෂක හමුදා සමඟ ඉතා කිට්ටු සම්බන්ධකම් පවත්වන බවත් කියනු ලැබේ.

2011 ජුලි මස ආරම්භ ප්‍රාදේශීය සභා මැතිවරණ සමයේ දි යාපනයේ දේශපාලන කටයුතු වල නියුතු වු විරුද්ධ දේශපාලන පක්ෂ සාමාජිකයින්ට කරනු ලබන නොයෙකුත් තර්ජන පිළිබඳව විශේෂයෙන් ම මැතිවරණ නිරීක්ෂණ කණ්ඩායම් වෙත ලැබුන පැමිණිලි වලින් කියවින.

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයේ ස්ථාවරය වන්නේ ආයුධ සන්නද්ධ කල්ලි නිරායුධ කිරිමෙන් පමණක් ම දැනට ගොඩ නැගි ඇති ප්‍රචණ්ඩ ක්‍රියා රැල්ල අවසාන කළ නොහැකි බවයි. වගවිම අනිවාර්ය වේ. ඉහත කි ආකාරයේ

[94] ඉතාමත් ආසන්නතම නිදර්ශනය නම් 2011 ජුනි 26 දින යාපනය අච්චුවේලි හි ක්‍රිඩා පිට්ටනියක් බාලචන්ද්‍රන් සාතුහුනරාජා ඝාතනය කොට ගෝල් කණුවක එල්ලා දමා තිබුනි . මේ ඝාතනය සම්බන්ධයෙන් යුද්ධ හමුදා බුද්ධි අංශයේ නිලධාරියෙක් සැක කරන ලද අතර ඝාතනයට හේතුව පෞද්ගලික හේතුවක් විය හැකි නමුත් මාධ්‍ය වාර්තාවන් ට අනුව බාලචන්ද්‍රන් නිදහස් වු එල් ටි ටී ඊ සාමාජිකයෙක් බව ද ප්‍රකාශ වින.

ප්‍රණ්ඩක්‍රියා සිදුවන  බව පිළි ගනිමින් එකී ප්‍රචණ්ඩ ක්‍රියා විමර්ශනය කොට අපරාධ කරුවන් නීතිය ඉදිරියට රැගෙන ඒ ශ්‍රී ලංකා බලධාරින් පසුබට වනතාක් දිවයිනේ ඇති වි අවනීතිය එලෙසම පවතිනු ඇත.

## සමාජ හා ආර්ථික ප්‍රශ්නඃ

අන්තර් ආයතනික උපදේශක කමිටුවේ ප්‍රගති වාර්තාව, මහනුවර සිට යාපනය දක්වා වැටි ඇති ඒ 9 මහා මාර්ගය ගමනා ගමනය සඳහා විවෘත කිරිම ආර්ථික සමාජ හා සංස්කෘතික අයිතීන් විෂයෙහි ඉතා විශාල ප්‍රගතියකී සඳහන් කරයි. උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව ඒ 9 මාර්ගය විවෘත කිරිම නිර්දේශ කරන්නට ඉදිරිපත් වන නමුත් මෙම කොමිෂන් සභාව පත් කිරිමට පෙර 2009 දීම ඒ 9 මාර්ගය ගමනාගමනය පිණිස විවෘත කළ බව ඔවුන්ට අමතක වි ඇති සේය.

සිවිල් ක්‍රියාකාරකම් යථා තත්වයට පත් කිරිම පිණිස දිස්ත්‍රික්ක ලේකම්වරුන් හා ආරක්ෂක හමුද අතර කිට්ටු සම්බන්ධයක් ඇති කිරිම අවශ්‍ය බව නිර්දේශ කරයි. මෙම නිර්දේශයේ ප්‍රගතිය සම්බන්ධයෙන් සාපේක්ෂක වශයෙන් අන්තර් ආයතන උපදේශක කමිටුවට ඇත්ත වශයෙන් ම කීමට යමක් නොතිබින. 'සිවිල් වැසියන් ජිවිත යථා තත්වයට පත් කිරිමට සංගුප්පිඩි පාලම විවෘත කොට  සිවිල් වැසියන් ඒ අවට පදිංචි කිරිම මගින් ඔවුන්ට ධීවර කර්මාන්තයේ යෙදෙන්නට අවස්ථාව උද වි යැයි කියයි.

ඇත්ත වශයෙන් ම උතුර තවමත් දැඩිව මිල්ටරිකරණයකට යටත් කොට තිබේ. දිවයිනේ අනෙකුත් පළාත් වල ආරක්ෂක අමාත්‍යංශය සිවිල් පාලනයට මැදිහත් වනවාට, වඩා උතුරේ සිවිල් පරිපාලනය, සහන සේවා හා සංවර්ධන කටයුතු යුද්ධ හමුදව හා ආරක්ෂක අමාත්‍යංශය භාරයේ පවතී.

## 5.ස්වාධීන ජාත්‍යන්තර විමර්ශනයක අවශ්‍යතාවයඃ

ශ්‍රී ලංකාවේ අසාර්ථක පරික්ෂණ කොමිෂන් සභා පිළිබඳ ඉතිහාසයත් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ සිත් කළකිරවන ක්‍රියා කලාපයත් ගත් කළ ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය මෙම කොමිෂන් සභාව මානය හිමිකම් උල්ලංඝණයන් හි වින්දිතයින් බවට පත්වු ශ්‍රී ලංකිකයින්ට යුක්තිය සත්‍යාවලෝකනය හා හානි පුර්ණය ලබා දෙති කිසිසේතම නොසලකයි.

යුද්ධයේ අවසාන අදියරේ සිදු වු අපරාධයන් හි පරිමාව සලකන කළ එබඳු පරිමාවකින් සිදු වු අපරාධ විමර්ශනයට සුදුසු යාන්ත්‍රණයක් වශයෙන් උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව සැලකිය නොහැකිය. සෑම මට්ටමකදිම එනම් අධිකාරිය හා සංකල්පය; සංයුතිය හා භාවිතය ගත් කළ එහි වංචනික ස්වභාවය හෙළිදරව් වේ. තවද වර්තමාන දේශපාලන සන්දර්භය තුළ ද වගවිමක් සිදු විමට තිබෙන ඉඩකඩ ඉතාමත් විරලය. වරදින් නිදෙස් කිරිම කලාතුරකින්

සිදුවන්නක් නොව රටේ නීතිය බවට පත් වී තිබේ. දශක ගණනාවක් ම මානව හිමිකම් උල්ලංඝණයන් ඉවසා සිටින රාජ්‍යතන්ත්‍රයක් ශ්‍රී ලංකාව තුළ වර්ධනය වී ඇත. යුද්ධයෙන් පසු ඇතිවූ ජයෝන්මාදය නිසා ආරක්ෂක හමුද විසින් සිදු කරන ලද මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳ වගකීම රජය සම්පූර්ණයෙන් ම ප්‍රතික් ෂේප කරනවා පමණක් නොව මෙම ප්‍රතිපත්තිය විවේචනය කරන තැනැත්තන්ට දඩුවම් කිරීමේ සම්ප්‍රදයක් ද පවත්වා ගෙන යයි. ශ්‍රී ලංකා රජය තවමත් ජීවතුන් අතර සිටින එල් ටී ටී ඊ සාමාජිකයින් හට ද ඔවුන් විසින් සිදු කරන ලද අපරාධ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ උනන්දුවක් නැත. නමුත් කාලයා ගේ ඇවෑමෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන නායකත්වය විසින් සත්‍යාවලෝකනය, යුක්තිය හා සංහිඳියාව ට එරෙහිව බැඳ රැහැන් ලිහිල් කරනු ඇතැයි අපේක්ෂා කරමු. නමුත් මෙකී පරිවර්තනය සිදු වීමට වසර ගණනාවක් යනු ඇතැයි සිතිය හැකිය.

කෘෘරකම් හෙළිදරව් කිරීම වැදගත් වන අතර එක්සත් ජාතීන් ගේ විද්වත් කමිටු වාර්තාව ඒ සම්බන්ධයෙන් වැදගත් පියවරකි. මහලේකම් බෑන් කිං මූන් විද්වත් කමිටු වාර්තාව පිළිබඳව බිබිසි ය සමග ජුනි මස පැවැත් වූ සම්මුඛ සාකච්ඡාවක දී 'මා විසින් මෙම වාර්තාව මහජනයා වෙනුවෙන් පළ කළ අතර සිදු වූයේ කුමක්දැයි දැන් සියළු දෙනාම දනිතීයි' කිවේය. නමුත් මානව සංහතියට එරෙහි අපරාධ හෙළිදරව් කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. යම්කිසි සුභවාදී වෙනසක් ඇති කිරීමට නම් ශ්‍රී ලංකාවේ යුද්ධ අපරාධ විමර්ශනය කිරීම පිළිබඳව උනන්දුවක් දක්වන විවිධ පාර්ශවකරුවන් ගේ පොදු එකඟත්වයකින් නිශ්චිත ක්‍රියාමාර්ගයක් ගැනීම අවශ්‍ය වේ. රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් ශ්‍රී ලංකාව ට ජාත්‍යන්තර විමර්ශනයක් සඳහා කරන ඉල්ලීම දුර්වල වීම, සියළු ආකාරයේ වගවීම් පිළිබඳ ව දේශීයව මෙන් ම ජාත්‍යන්තරවත් තිබෙන උද්ඝෝෂණය අඩපණ කරයි.

ශ්‍රී ලංකික රාජ්‍ය තාන්ත්‍රිකයන් නොකඩවාම උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව ආරක්ෂා කිරීම මඟින් ජාත්‍යන්තර නීතිය යටතේ ගැනෙන අපරාධයන් හි වින්දිතයින්ට යුක්තිය ඉටු කිරීම, හානි පුරණය හා සත්‍යාවලොකනය අභිමි කිරීම පිළිබඳ ඉතා භයානක සම්ප්‍රදයකට මුල පිරීමකි. ශ්‍රී ලංකාව සිය ජාත්‍යන්තර වගකීම් පැහැර හැරීමකි.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීතිය යටතේ ගැනෙන අපරාධ පිළිබඳ චෝදනා අප්‍රමාදව විමර්ශනය කිරීම, ශ්‍රී ලංකාව විසින් ගනු ලබන පියවරයන් නොතකා එක්සත් ජාතීන් ගේ සංවිධානය විසින් විමර්ශන කිරීම ඔවුන් ගේ වගකීමකි. එබඳු විමර්ශනයක් ජාත්‍යන්තර ප්‍රමිතීන් ට අනුකූල විය යුතු අතර ස්වාධීන එකක් ද විය යුතුය.

ශ්‍රී ලංකාව විසින් සත්‍යාවලෝකනය හා සංහිඳියාව සම්බන්ධයෙන් ගනු ලබන පියවරයන් නියාමනය කිරීම ද එබඳු පියවරයන් මගින් වගවීම ඉටු වන්නේ දැයි සොයා බැලීම ද එක්සත් ජාතීන් ගේ සංවිධානයේ වගකීමක් වෙයි.

ජාත්‍යන්තර උත්සාහයන් එසේ තිබියදි ශ්‍රී ලංකාවට ද මානව හිමිකම් ආරක්ෂා කිරිමේ හා වගවිම සහතික කිරිමේ වගකිමක් තිබේ. යුද්ධයේ අවසාන අදියරේ දි ශ්‍රී ලංකික ආරක්ෂක හමුද විසින් මහා පරිමාණයේ ජිවිත හානියක් සිදු වු බව ප්‍රසිද්ධියේ කළමනාය. වින්දිතයින් ගේ අයිතිවාසිකම් හා අධිමානයට ගරු කළමනාය. ශ්‍රී ලංකාව ඉතා ඉක්මනින් මානව හිමිකම් උල්ලංඝණය කරන අපරාධකරුවන් නීතිය ඉදිරියට ගෙන එන ජාතික ප්‍රතිපත්තියක් පිහිටුවා ගත යුතුය. උතුරේ දූනටත් සිදුවන පැහැර ගෙන යාම් හා ඝාතනයන් පිළිබඳව නව වාර්තා විමර්ශනය කළ යුතු අතර අපරාධකරුවන් හඳුනා ගෙන ඔවුහු ද නීතිය ඉදිරියට ගෙන ආ යුතුය.

®

-



# මම සාහය විමට කැමැත්තෙමි

සෑම දෙනාටම යුක්තිය, නිදහස හා අභිමානය සහිත ජනතා සහයෝගයෙන් ගොඩ නැගෙන ලොවක් සඳහා මිහිතලයේ අධිත්‍රිවතාවයෙන් යුක්ත ගැටුම් වල සිට හුදකලාතැන් හි කෙරෙන අරගල දක්වා **ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය** පෙනි සිටියි.

## ඔබට කළ හැක්කේ කුමක් ද?

ලොව පුරා ක්‍රියාධරයන් මානව හිමිකම් මර්දනය කරනු ලබන බලවේග සමග ජයග්‍රාහි  ලෙස සටන් කළ හැකි බව ඔප්පු කොට ඇත. මෙම සමාජ ව්‍යාපාරයෙහි කොටස්කරු වෙකු වන්න. බිය හා අවමානය පතුරන්නන් ට එරෙහි වන්න.

■ මානව හිමිකම් උල්ලංඝණයන් අවසන් කිරිම පිණිස ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සාමාජිකත්වය ගෙන, ලොව පුරා ගොඩ නැගෙන උද්ඝෝෂණ ව්‍යාපාරයෙහි කොටස් කරුවෙක් වන්න.

■ වෙනසක් සඳහා ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට  අත දෙන්න.

**එක් ව සිටිමෙන් අප ගේ හඬට සවන් යොමු වනු නිසැකය.**

☐ ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සාමාජිකත්වය ලබා ගැනිම පිණිස වැඩි විස්තර දැන ගැනිමට කැමැත්තෙමි

නම

ලිපිනය

රට

විද්‍යුත් ලිපිනය

☐ ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් වෙත මම දයක විමට කැමැත්තෙමි. (ඔබ ගේ දයක මුදල් බ්‍රිතාන්‍ය පවුම්, ඇමරිකන් ඩොලර් හෝ යුරෝ යන මුදල් ඒකක මගින් ගෙවිය හැක.)

මුදල

කරුණාකර මගේ ගිනුමට බැර කරන්න ☐ විසා ☐ මාස්ටර් කාඩ්

කාඩ් අංකය

අවලංගු වන දිනය

අත්සන

amnesty.org

මෙම අයදුම් පත ඔබ ගේ රටෙහි ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් කාර්යාලයට යොමු කරන්න.

විස්තර ලබා ගැනිම පිණිස මෙම වෙබ් අඩවියට පිවිසෙන්න.
www.amnesty.org/en/worldwide-sites
ඔබ පදිංචි රටෙහි ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් කාර්යාලයක් නොමැති නම්
ඔබ ගේ ඇයදුම් පත පහත සඳහන් ලිපිනයට එවන්න

**Amnesty International,** International Secretariat, Peter Benenson House,
1 Easton Street, London WC1X 0DW, United Kingdom

# යුක්තිය අද නොවේ හෙට

## ශ්‍රී ලංකාවේ උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවේ අසමත්භාවය

ශ්‍රී ලංකාවේ තිස් වසරක යුද්ධයේ හේතු සොයා බැලීම පිණිස මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් 2010 පිහිට වනු ලැබූ මෙම රාජ්‍ය කොමිෂන් සභාවට දහස් සංඛ්‍යාත සිවිල් වැසියන් පිරිසක් සාක්ෂිකරුවන් වශයෙන් ඉදිරිපත් වුවෝය. එසේත් නැත්නම් පැමිණිලි ඉදිරිපත් කළෝය. ජාත්‍යයන්තර නීතියට අනුව යුද්ධයට සම්බන්ධ දෙපාර්ශවය විසින් ම සිදුකරන ලදැයි චුදිත බරපතළ අපරාධ සම්බන්ධ හෝ යුද්ධ අපරාධ සම්බන්ධ සැකකරුවන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවට ඉදිරිපත් කළ සාක්ෂි වල අඩංගු විය. නමුත් මෙම කොමිෂන් සභාව එකී චෝදනා සම්බන්ධයෙන් නිසි ක්‍රියා මාර්ගයක් ගැනීමට අසමත් වුවෝය.

උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද සාක්ෂි විශ්ලේෂණය කළ ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය මෙම කොමිෂන් සභාව කොපමණ නම් අවස්ථා මඟ හරිමින් නොසැලකිලිමත් ලෙස කටයුතු කොට ඇත් දැයි මැනවින් හෙළිදරව් කරයි. කොමිෂන් සභාව සාක්ෂිකරුවන් ට අපක්ෂපාතී ලෙස නොසැලකීය. ඉදිරිපත් කරන ලද මානව හිමිකම් පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් පසුවිපරම් කිරිමට ප්‍රයත්නයක් නොදැරීය. සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිමට හෝ පළි ගැනිමෙන් වළක්වා ලිමට කිසිවක් ම නොකළෝය.

ශ්‍රී ලංකාවේයුක්තිය ස්ථාපිත කිරිම පිණිස පිහිටවනු ලබන අසාර්ථක දේශීය යාන්ත්‍රණයන් පිළිබඳ නවතම උදාහරණය මෙම උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව වෙයි. උගත් පාඩම් හා සංහිඳියා කොමිෂන් සභාව සම්බන්ධයෙන් ජාත්‍යයන්තර ප්‍රජාව මුලා නොවිය යුතුය. ශ්‍රී ලංකාවේ සිදු වු දරුණු යුද්ධයේ දි දහස් ගණනක් සිවිල් වැසියන් ගේ බරපතළ ලෙස උල්ලංඝණය කළ මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් සත්‍ය හෙළිදරව් කිරිමත් හානිපුරණය හා යුක්තිය ඉෂ්ට කිරිමත් කළ හැක්කේ වින්දිතයින්ට කන් දෙන අන්තර් ජාතික මට්ටමේ විමර්ශනයකින් පමණි.

amnesty.org

Index: ASA 37/008/2011
September 2011

AMNESTY INTERNATIONAL